# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017** මාර්තු **07** වන අඟහරුවාදා
2017 பங்குனி 07 செவ்வாய்க் கிழமை
Tuesday 07th March 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.32 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.32 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.32 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. අද දිනට නියමිත නිවේදන කිසිවක් නැහැ.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.02.22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ ගෘහ කාරක සභාවේ රැස්වීම් වාර්තාවන් මම පිළිගන්වනවා.

# පෙත්සම්
## PETITIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වත්තල, මාබෝල, රාජසිංහ පාර, අංක 87/25 හි පදිංචි කේ.එස්.ආර්. පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 ලෙස සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. ඔබතුමාට පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය සම්බන්ධව එතුමා මගේ අමාත්‍යාංශයට කථා කළා. ඒ වාගේම සභා ලේකම්තුමාටත් ඉදිරිපත් කරලා තිබුණා, එතුමා ප්‍රශ්නය ඉවත් කර ගන්නවාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, එතුමා මගෙන් ඉල්ලීමක් කරලා නැහැ. ඔබතුමාගේ පිළිතුරක් ලැහැස්ති නම් -

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ලැහැස්තියි. මම පිළිතුර සභාගත කරනවා.[1] මොකද, එතුමාත් මට දුරකථනයෙන් කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්න අංක 02 ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. දෙන්නම සභා ගර්භයේ නැහැ. ගරු ප්‍රධාන ඇමැතිතුමා සභාවට එනවා.

[1] පිළිතුරක් සභාගත නොවීය.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, සති 06 ක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා වෙනුවෙන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/17/15)**

අ. 1986 වර්ෂයේදී ජා-ඇළ උතුරු බටගම 'පිනෑන්ස් වත්ත' නමින් හඳුන්වනු ලබන ඉඩම කැබලි කර විකුණනු ලැබූ අවස්ථාවේදී පොදු පහසුකම් ලෙස අක්කර 05 ක බිම් කොටසක් වෙන් කර ඇති බව ඔබ දන්නවාද?

ආ. ඉහත කී ඉඩමෙහි අයිතිය වර්තමානයේදී ජා-ඇළ ප්‍රාදේශීය සභාව සතු බව ඔබතුමා දන්නවාද?

ඇ. ඉහත කී ඉඩමෙන් කොටසක බෝධි මළු විහාරය නමින් විහාරස්ථානයක් පවත්වා ගෙන යනු ලබන බව ඔබතුමා දන්නවාද?

ඈ. එම විහාරස්ථානය පවත්වා ගෙන යාමට පර්චස් 79 ක බිම් කොටසක් ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් තෑගි ඔප්පුවක් මගින් ලබා දී ඇති බව ඔබ දන්නවාද?

ඉ. ඉහත සඳහන් පරිදි පොදු පහසුකම් ලෙස වෙන් කරන ලද බිම් කොටසක් තෑගි ඔප්පුවක් මගින් වෙනත් පාර්ශවයකට පවරා දීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට බලතල තිබේද?

ඊ. එසේ බලතල ඇත්නම් එය කිනම් නීතිමය ප්‍රතිපාදන යටතේද?

උ. ඉහත ඉඩම තෑගි ඔප්පුවක් මගින් ලබා දීමට ප්‍රධාන අමාත්‍යවරයාගේ නිර්දේශ/අනුමැතිය ලබා දී තිබේද?

ඌ. ඉහත කී ඉඩම තෑගි ඔප්පුවක් මගින් ලබා දීම පිළිබඳව ඔබ විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

ඈ. ඔව්.

ඉ. නැත.

ඊ. අදාළ නොවේ.

උ. නැත.

ඌ. අදාළ ඉඩම බැහැර කිරීම සම්බන්ධව නීතිමය වශයෙන් ගැඹුරින් කරුණු අධ්‍යයනය කර ගත යුතු ක්‍රියා මාර්ග තීරණය කරමි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ගරු මන්ත්රීතුමා සභා ගර්භයේ නැහැ. පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. i. වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිංහරාජ උද්‍යානයේ 10 කණුව අසල ඉදි කර ඇති හදිසි ප්‍රතිකාර ඒකකය විවෘත නොකරන්නේ මන්ද?*

***පිළිතුර :***

*අ. i. එම ඒකකය සඳහා වෛද්‍යවරයෙක් ඇතුළු කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා යොමු කර ඇත. එහෙත් එය මෙතෙක් අනුමත වී නැත. එම කටයුතු කඩිනමින් ඉටු කරවා ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සිදු වෙමින් පවතී.*

***ප්‍රශ්නය :***

*ii. එහි සම්පූර්ණ වැඩ නිම කර ඇති බව ඔබතුමා දන්නේද?*

***පිළිතුර :***

*ii. ඔව්.*

***ප්‍රශ්නය :***

*iii. වැඩ නිම කර නොමැති නම් ඊට හේතු කවරේද?*

***පිළිතුර :***

*iii. අදාළ නොවේ.*

***ප්‍රශ්නය :***

*iv. ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද?*

***පිළිතුර :***

*iv. රුපියල් මිලියන 20 (මධ්‍යම රජයේ ප්‍රතිපාදන)*

***ප්‍රශ්නය :***

*ආ. i. එම හදිසි ප්‍රතිකාර ඒකකය අසළ වෛද්‍ය නේවාසිකාගාරයක් ඉදි කරන්නේද?*

***පිළිතුර :***

*ආ. i. ඔව්. මධ්‍යම රජයේ ප්‍රතිපාදනවලින් වෛද්‍ය නේවාසිකාගාරයක් ඉදි කරමින් පවතී.*

***ප්‍රශ්නය :***

*ii. දැනට එහි වැඩ ආරම්භ කර තිබේද?*

***පිළිතුර :***

*ii. ආරම්භ කර ඇත.*

***ප්‍රශ්නය :***

*iii. වැඩ ආරම්භ කර තිබේ නම් එහි ප්‍රගතිය කොපමණද?*

***පිළිතුර :***

*iii. දැනට අත්තිවාරම තෙක් ඉදි කරමින් පවතී. මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා මාස 06 ක කාලයක් ලබා දී ඇත. 2017.05.27 තෙක් ඉදි කිරීම් කාලය දීර්ඝ කිරීමට යෝජිතය.*

***ප්‍රශ්නය :***

*iv. ප්‍රමාද වීමට හේතු කවරේද?*

***පිළිතුර :***

*iv. අදාළ නිල නිවාසය ඉදි කිරීම සඳහා වෙන් කරන ලද භූමිය කඳු ගැටයක් සහිත භූමියකි. එම සැලසුම් සකස් කිරීමේදී මෙම ස්ථානය නාය යෑමේ අවදානම් තත්ත්වයක් ඇති බැවින් මෙම භූමිය පිළිබඳ ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාවක් ලබා ගන්නා ලදී. එම වාර්තාවේ නිර්දේශ වනුයේ එම කඳු ගැටය මීටර් 03 ක් පමණ උඩින් කපා ඉවත් කර භූමිය සකස් කර ගොඩනැගිල්ල ඉදි කිරීම සුදුසු බවය.*

**ප්‍රශ්නය :**

*ඇ. i. ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද?*

**පිළිතුර :**

*ඇ. i. රුපියල් 9,550,000.00*

**ප්‍රශ්නය :**

*ii. එහි ගිවිසුම් කාලය කොපමණද?*

**පිළිතුර :**

*ii. එහි ගිවිසුම් ගත කාලය මාස 06 කි. භූමිය සැකසීමට මාස 06 ක් ගත වූ බැවින් තව මාස 06 ක කාලයක් දීර්ඝ කිරීමට යෝජනා විය.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ඊළඟ ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ. පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර ]*
*[Tabled Answer]*

**ප්‍රශ්නය :**

*අ. i. කළුතර අධ්‍යාපන කලාපයේ පානදුර කොට්ඨාශයේ වාද්දුව ධර්මපාල විද්‍යාලය ද්විතියික පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කර ඇති බව දන්නේද?*

**පිළිතුර :**

*අ. i. ඔව්.*

**ප්‍රශ්නය :**

*ii. ඒ කුමන වර්ෂයේ සිටද?*

**පිළිතුර :**

*ii. 2012.*

**ප්‍රශ්නය :**

*ආ. i. මෙම පාසලට ඇතුළත් කර ඇති පෝෂක පාසල් කොපමණද?*

**පිළිතුර :**

*ආ. i. 03.*

**ප්‍රශ්නය :**

*ii. එම පාසල් මොනවාද?*

**පිළිතුර :**

*ii. මහා වාද්දුව ප්‍රාථමික විදුහල*
*වේරගම ප්‍රාථමික විදුහල*
*තල්පිටිය කණිෂ්ට විද්‍යාලය*

**ප්‍රශ්නය :**

*ඇ. i. ද්විතියික පාසල් ව්‍යාපෘතිය යටතේ ධර්මපාල විද්‍යාලයට භෞතික සම්පත් ලබා දී තිබේද?*

**පිළිතුර :**

*ඇ. i. ඔව්.*

**ප්‍රශ්නය :**

*ii. ඒ මොනවාද?*

**පිළිතුර :**

*ii. මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය හා එයට අවශ්‍ය භෞතික සම්පත්.*

**ප්‍රශ්නය :**

*ඈ. පෝෂක පාසල්වලින් ධර්මපාල විද්‍යාලයේ 6 ශ්‍රේණියට පැමිණි දරුවන් සංඛ්‍යාව වර්ෂ 2013 සිට වසරින් වසර කොපමණද?*

**පිළිතුර :**

*ඈ.*

| | මහා වාද්දුම ප්‍රාථමික විදුහල | වේරගම ප්‍රාථමික විදුහල | තල්පිටිය කණිෂ්ඨ විද්‍යාලය |
|---|---|---|---|
| 2013 | 07 | 21 | 02 |
| 2014 | 02 | 19 | 15 |
| 2015 | 03 | 22 | 16 |
| 2016 | 07 | 16 | 10 |
| 2017 | 08 | 13 | 07 |

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මන්ත්‍රීතුමා ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා පිළිතුර සභාගත කළා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට අවසර ලැබෙනවා නම් ගරු මන්ත්‍රීතුමාට ගරු කිරීමක් වශයෙන් කලින් ප්‍රශ්නයට පිළිතුර ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ දැන් නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් 06 වන ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**06.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/21)**

අ. i. කළුතර අධ්‍යාපන කලාපයේ පානදුර කොට්ඨාශයේ වාද්දුව ධර්මපාල ද්විතියික පාසලේ වර්ෂ 2013 සිට මෙතෙක් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

ii. එම විභාගයට පෙනී සිට සමත් අසමත් සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

ආ. 2013 වසරේ සිට මෙතෙක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සියලුම සිසුන්ගේ සම්පූර්ණ ප්‍රතිඵල ලේඛනය සභාගත කරන්නේද?

ඇ. i. වර්ෂ 2013 සිට ධර්මපාල ද්විතියික පාසලේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

ii. එම විභාගයෙන් සමත් සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

iii. එම විභාගයෙන් අසමත් සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

iv. ලකුණු 70 ට වඩා වැඩි හා අඩු ලබා ගත් සිසුන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. i.
2013 - 17
2014 - 13
2015 - 17
2016 - 15

ii.

| | | **සමත්** | **අසමත්** |
|---|---|---|---|
| 2013 | - | 06 | 11 |
| 2014 | - | 06 | 07 |
| 2015 | - | 03 | 14 |

ආ. ඇමුණුම 01[2]

ඇ. i.
2013 - 08
2014 - 03
2015 - 12
2016 - 14

ii. පෙනී සිටි කිසිවෙක් සමත් වී නැත.

iii. සියලුම සිසුන් ශිෂ්‍යත්ව කඩඉම් ලකුණට වඩා අඩුවෙන් ලබාගෙන ඇත.

iv.

| | **ලකුණු 70** ට **වැඩි සිසුන් ගණන** | **ලකුණු 70** ට **අඩු සිසුන් ගණන** |
|---|---|---|
| 2013 | 04 | 04 |
| 2014 | 02 | 01 |
| 2015 | 06 | 06 |
| 2016 | 09 | 05 |

[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය. වාද්දුව ධර්මපාල විද්‍යාලය කියන්නේ, ද්විතියික පාසල් සංකල්පයට ඇතුළත් වුණු පාසලක්. ඒ නිසා මේ පාසලේ අධ්‍යාපනය පැත්තෙන් ගත්තොත් එහෙම ලොකු අසාර්ථකත්වයක් තිබෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කියන්නේ පරිපාලනමය වශයෙන් බිඳ වැටීමක් තිබුණා. ඒ අනුව අපි පරිපාලනය වෙනස් කරලා අලුත් විදුහල්පතිවරයෙක් පත් කරලා තිබෙනවා. ඒ අලුත් විදුහල්පතිතුමා ඉතා කැපවීමකින් දැනට වැඩ කටයුතු කරගෙන යන බව මතක් කරන්න ඕනෑ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

දැන් මේකට අදාළව පෝෂක පාසල් කිහිපයක් තිබෙනවා නේ? මේ පෝෂක පාසල්වලින් මේ පාසලට එන්න දෙමව්පියෝ ලොකු අකමැත්තක් තිබෙනවා, මෙන්න මේ අධ්‍යාපනය කඩා වැටීම තුළ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන දෙවැනි ප්‍රශ්නය තමයි ඔබතුමා ඒ සඳහා ගන්නා පියවර මොකක්ද කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැනට ගරු සභාපතිතුමනි, පෝෂක පාසල් ව්‍යුහයක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ පාසල් තමයි මහා වාද්දුව ප්‍රාථමික විද්‍යාලය. වේරගම ප්‍රාථමික විද්‍යාලය සහ තල්පිටිය කණිෂ්ට විද්‍යාලය. දැන් මේ පාසල්වලින් ධර්මපාල ද්විතියික විද්‍යාලයට නොපැමිණෙන, එහෙම නැත්නම් පැමිණෙන්නට කුසීතකමක්, මහ හැරීමක් සිදු වෙනවා. විශේෂයෙන් ධර්මපාල විද්‍යාලයේ පරිපාලනමය වශයෙන් තිබුණු දුර්වලතාවය නිසා. මීට කලින් ගරු මන්ත්‍රීතුමා සහභාගී වුණා. අපේ නිලධාරීන් සමග සාකච්ඡා කරලා, ඒ පරිපාලනය වෙනස් කළා. වෙනස් කරලා, දැන් පටන් අරගෙන තිබෙනවා. මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා. මම දිගින් දිගටම මන්ත්‍රීතුමන්ලාත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්නත් බලාපොරොත්තු වෙනවා. මේ පාසල හොඳ තත්ත්වයට පත් කරන්න. එතකොට මේක සාර්ථක තත්ත්වයට ගන්න පුළුවන් කියලා ලොකු විශ්වාසයක් තිබෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමා මගේ තුන්වැනි ප්‍රශ්නය. ඔබතුමා මේක ද්විතියික පාසලක් කරලා දැන් අවුරුදු 04 ක් ගිහිල්ලා. එතකොට මේ අවුරුදු 04 ම බලලා තමයි දෙමව්පියෝ තීරණය කරලා තිබෙන්නේ, ළමයින් එවන්නේ නැතුව ඉන්න. අනෙක් එක තමයි මේ පෝෂක පාසල්වලටත් ඉතා වේගයෙන් ළමයින් අඩු වෙලා තිබෙනවා. මොකද, ඒ පෝෂක පාසල්වලින් ළමයින් එන්නේ ධර්මපාල විද්‍යාලයට. ද්විතියික පාසලට. ඒ නිසා දැන් ධර්මපාල විද්‍යාලයට 6 ට ළමයින් එවන නිසාම මේ පෝෂක පාසල්වලත් ළමයින් අඩු වෙලා. මේ වසරේත් ගැටළු මතු වෙමින් තිබෙනවා. ලබන වසරේදී මේකට මැදිහත් වෙලා - අපි විශ්වාස කරන්නේ ඔබතුමා ළමයින්ගෙන් අත්හදා බැලීම් කරන්න ගිහිල්ලා තව තවත් මේක තුළ වෙන්නේ, පහළ පෝෂක පාසල් පද්ධතියම වැසීගෙන යනවා. ලබන වසරේ සිට ඔබතුමාට හැකියාව තිබෙනවාද මේ ධර්මපාල විද්‍යාලයෙන් - තල්පිටිය විද්‍යාලයේ ලොකු විරෝධයක් මතු වෙලා තිබෙනවා. ඒ පාසලේ සියලු පහසුකම් ටික තිබෙනවා. ඒ නිසා ඒ පාසලේවත් 6 වන ශ්‍රේණියේ සිට ඉහළට පවත්වාගෙන යන්න අවසර ලබා දෙන්න කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ පාසල් ව්‍යුහය ගැන ගරු මන්ත්‍රීතුමාට හොඳ අවබෝධයක් තිබෙනවා වාගේම අපටත් තිබෙනවා. ඉතින් පසුගිය කාලයේ ගත්තු තීන්දුවල සමහර තැන් අසාර්ථක භාවයන් තිබෙනවා. නමුත් එතුමා කියන විධියට ධර්මපාල විද්‍යාලය හොඳ මට්ටමකට ගෙනියන්න නම් මේ පෝෂිත පාසල් හොඳ වෙන්නත් ඕනෑ. පෝෂිත පාසල්වලින් නිවැරැදි විධියටම දරුවන් ස්ථානගත වෙන්නට ඕනෑ. 6 වසර සඳහා ධර්මපාල විද්‍යාලයේ. අපට දැණුනු ප්‍රධාන පරිපාලන ගැටළුව තමයි ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ තිබුණු අපහසුතාවයන්. පරිපාලන ගැටළු. ඒවා අපි දැක්කා. අලුත් විදුහල්පතිවරයේ පත් කරලා ඒවා නිවැරැදි කරලා තිබෙනවා. මම ඉදිරියේදී එතුමන්ලාගේ හඬට කන් දීලා වඩාත් නිවැරැදි පියවර කිහිපයකට යනවා. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, එක පැත්තකින් ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් මීට ඉහතදී ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසේ 06 වැනිදා මම මේ සභාවට ප්‍රශ්නයක් යොමු කළා, මීගමුව බසියාවත්ත විදුහල පිළිබඳව. එහිදී ගරු අධ්‍යාපන ඇමැතිතුමා ඉතාම පැහැදිලිව, මා සතුව හැන්සාඩ් වාර්තාව තිබෙනවා. 119 පිටුව - සැප්තැම්බර් මාසේ 06 වැනිදා. ඉතාම පැහැදිලිව පිළිතුරු දුන්නා මේ විදුහලේ විදුහල්පතිවරිය සති දෙකක් ඇතුළත ස්ථාන මාරු කරනවා කියලා. අද 2017 මාර්තු මාසේ 07 වැනිදා. මාස 07 ක් ගිහිල්ලා තිබෙනවා. තවම මේ විදුහල්පතිතුමිය පාසලේ ඉන්නවා. මම පසුගිය සති දෙකකට කලින් කලාප අධ්‍යක්ෂතුමාගෙන් මේ පිළිබඳව විමසුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට වරප්‍රසාද ප්‍රශ්නය පැහැදිලියි. දීර්ඝ විස්තර කරන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපේ ඉස්කෝලවලත් ළමයින් ඉස්කෝලේ එන්නේ නැතිකොට, පන්ති භාර ගුරුවරයා අහනවා යලට මහට එනවාද කියලා. මෙතුමාට උත්තර දෙන්න මම අවස්ථා කිහිපයකදීම බලාගෙන හිටියා. මෙතුමා සභාවට ආවේ නැහැ. ඕනෑ නම් Attendant Sheet එක අරගෙන බලන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොරු කියන්න එපා ඇමැතිතුමා. මම මේ ප්‍රශ්නය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා පැමිණීමේ ලේඛනය අරගෙන බලන්න මෙතුමා සභාවට එන්නේ නැහැ. හිටපු ගමන් ඇවිල්ලා කොහේ හරි බාල්දියක් පෙරළනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සභාව නොමඟ යවන්න එපා. මම මේ ප්‍රශ්නය අවස්ථා කිහිපයකදී මේ සභාවේ ඇහුවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමාට ආපහු උත්තර දෙන්න අවසර ඉල්ලුවා. මම එහෙම කරන්නේ නැහැ. මෙතුමා හිටපු ගමන් පාත් වෙලා බසියාවත්තක් ගැන කථා කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් මේ සති දෙකකින් ස්ථාන මාරු කරනවා කියපු විදුහල්පති මාස 07 ක් ඉන්නේ කොහොමද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අනෙක් එක මීගමුවේ මන්ත්‍රීවරු මෙතැන ඉන්නවා නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා පොරොන්දු ඉෂ්ට කරලා නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ, නැහැ. පොරොන්දු ඉෂ්ට කරන්න මම දන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් සති දෙකෙන් මාරු කරනවා කිව්වා. මාස 07 ක් ගිහිල්ලා තවම ඉන්නවා නම්, ඔය අධ්‍යාපන ඇමැතිකම ළමයෙකුට දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ බයිසාවත්තේ ෆයිල් එක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මාස 07 ක් ගිහිල්ලත් ඔබතුමාට විදුහල්පතිතුමිය මාරු කරන්න බැහැ. මාරු කළොත් වහ බොනවා කියනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි. ඔබතුමා සභාව නොමඟ අරින්න එපා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සභාවට ගෙනැල්ලා තිබෙන ඔක්කෝම ප්‍රශ්න මට කරපින්නාගෙන ඉන්න බැහැ. ඔබතුමා අද ඉදිරිපත් කළා නම්, ලබන සභාවට උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ඕවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම උත්තර දෙනවා. මම ලබන සභාවට උත්තර දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ඉල්ලා සිටිනවා, අද සභාව අවසන් වෙන්න කලින් උත්තරයක් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, සභාපතිතුමාගෙන් වුණත් යල් පැන ගිය ප්‍රශ්නයක් හිටි හැටියේ ඇහුවොත්, සභාපතිතුමාට පුළුවන්ද එහෙම - මට උත්තර දෙන්න සති දෙක කල් දෙන්න. ඊට කලින් අවශ්‍ය නම් ලිඛිතව උත්තරයක් දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මේ සභාවේ විතරක් නොවෙයි. මුළු පළාතේම විශ්වාසය කඩ කරලා තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරනවා විශ්වාසභංගයක් ගෙන එන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔය බයිසාවත්තේ ඉස්කෝලයෙන්ද මුළු පළාතේම විශ්වාසය කඩ වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා දෙදෙනාම වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විදුහල්පති කෙනෙක් මාරු කර ගන්න බැරි නම් ඔය අධ්‍යාපන ඇමැතිකම දෙන්න කෝ ළමයෙකුට.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා ගුරුවරයෙක්, වෘත්තීය සමිතියක කෙනෙක් වුණාට ඔබතුමාට මගෙත් එක්ක Argument එකට එන්න බැහැ. ඔබතුමයි මමයි අධ්‍යාපනය ගැන දවසක් දාගෙන කථා කරමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. කථා කරමු.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඕනෑම තැනක. දවසක් දාගෙන කථා කරමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විදුහල්පති කෙනෙක් මාරු කර ගන්න බැරි අධ්‍යාපන ඇමැති කෙනෙක්. හරි කථා කරමු. දවසක් නොවෙයි. අපි ලෑහැස්තියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපිත් මේකේ අවුරුදු ගණනක් හිටපු මිනිස්සු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕනෑතරම් කථා කරමු. කථා කරන්න දේවල් තියෙනවා. කථා කරන්න ඕනෑ තරම් දේවල් තියෙනවා. විදුහල්පති කෙනෙක් මාරු කර ගන්න බැරි නම් -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම අවංකව කියන්න ඕනෑ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඔයිට වඩා අවබෝධයෙන් යුක්තව කථා කරනවා. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා අවබෝධයෙන් කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි දැන් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, පසුගිය සතියේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධව රැස්වීමක් තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කියන්න කෝ? අධ්‍යාපන අමාත්‍යාංශයේ රැස්වීම් මට වැඩක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්නය කියන්න මොකක්ද කියලා කියන්න එපැයි. මගේ නම භාවිතා කරලා පාසලකට ළමයෙක් දාන්න එතැන සාකච්ඡා වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වැරැදියි. ඉතාම වැරැදියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්න වෙලාවේ මම අහන්නේ ගරු සභාපතිතුමනි, දැන් මේ අවුරුද්දේ මාස තුනක් ගිහිල්ලා ඉවරයි. මේ මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තු හද හදා ඉඳිමින් මේ ළමයින් මාස තුනක් ගෙදර තියන්නද අධ්‍යාපන ඇමැතිතුමා බලාපොරොත්තු වෙන්නේ කියලා මම ඉස්සෙල්ලාම අහන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට ඕකට උත්තර දෙන්න අවශ්‍ය නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇයි නැත්තේ? මේක වැදගත් ප්‍රශ්නයක් නේ? දැන් ඔබතුමාත් එකඟද ළමයින්ව මාස තුනක් හතරක් ගෙදර තියාගෙන ඉන්නවාට? දරුවන්ව ඉස්කෝලේ යවන්නේ නැතුව. දැන් පළමුවැනි කාර්තුව ඉවර වෙලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදි අර්ථ කථන දක්වන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. වැරැදි අර්ථ කථන නොවෙයි. මේක දේශපාලනීකරණය කරන්න ඇමැතිතුමා තවදුරටත් ඉඩ දෙනවාද කියන ප්‍රශ්නය මට අහන්න වෙනවා. නමුත් අපි මීට කලිනුත් කථා කළා. මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තු අනුව පාසල්වලට ළමයින් දාන එක නවත්වනවා කියලා ඇමැතිතුමා පොරොන්දු වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ නැහැ ඒක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අදාළ නැත්නම් ඔබතුමාගේත් ලැයිස්තුවක් ඇති. ඒකයි අදාළ නැත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ දරුවෝ තවම ගෙවල්වල ඉන්නේ, ඉස්කෝලේ යන්න බැරිව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අනවශ්‍ය ප්‍රකාශයක් නොවෙයි. මේක මාධ්‍යයට දාන්න. කරුණාකරලා මාධ්‍යයට දාන්න. මම කවදාවත් මාධ්‍යයට දාන්න කියලා නැහැ. අද කියනවා මාධ්‍යයට දාන්න කියලා. මාස 04 ක් යනතුරුත්, පළමුවැනි කාර්තුව ඉවර වනතුරුත් මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තු යනකල් ළමයින්ව ගෙවල්වල තියාගෙන ඉන්නවා. ඒක සාධාරණද? දැන් ඔබතුමාත් ඒක අනුමත කරනවා කියලා නේ, ඔබතුමා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අනුමත කරන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ කැගහන්නේ ලැයිස්තු තියෙන අය. ඔය කැගහන්නේ ලැයිස්තු තියෙන අය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලා ලැයිස්තු තියෙන අය. විදුහල්පතිවරුන්ට කියලා තියෙන්නේ ඔබතුමන්ලාගේ ලැයිස්තු එනකල් ළමයින්ව ගන්න එපැයි කියලා. ඇයි එහෙම කරන්නේ? ඒකයි අපි අහන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ අයට යහපාලනයෙන් වැඩක් කර ගන්න විධියක් නැතුව කැගහනවා. මෙතැන ඇවිල්ලා බොරුවට කැගහනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා හැමදාම නිදහස් අධ්‍යාපනය ගැන පම්පෝරි ගහනවා. ලැයිස්තු තියාගෙන ඉන්නවා මාස 06 ක් යනකල්, ළමයින් දාගන්න. මොකක්ද මේ විහිළුව?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ළමයින්ගේ ජීවිතත් එක්ක ඔබතුමන්ලා විහිළු කරන්න එපා. සෙල්ලමකට ගන්න එපා. ළමයින් දාගන්න සීතල කාමරවල ඉඳන් ලැයිස්තු හද හදා ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. බස්නාහිර පළාතේ කිසියම් හෝ ශිෂ්‍යයෙක්, ශිෂ්‍යයාවක් නිවසක ඉන්නවා නම්, පාසල ළඟ ඉන්නවා නම්, මේ මොහොතේ ඉඳලා ඒ සියලුම දරුවන්ව අපි පාසල්වලට ඇතුළත් කරනවා. කිසිම ගැටළුවක් නැහැ. ප්‍රශ්නයකුත් නැහැ. (බාධා කිරීම්) විනාඩියක් ඉන්න කෝ මට කථා කරන්න දීලා. හොඳ දරුවෝ වාගේ විනාඩියක් ඉන්න කෝ? ඊළඟ කාරණාව මන්ත්‍රී ලැයිස්තු කියලා ජාතියක් නැහැ. හැබැයි එතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගියපාර ලැයිස්තු හදද්දී - අත්තනගල්ලේ මන්ත්‍රී ළමයින් 40 ක් දාගත්තා. එතුමාව ඒ පාසලේ විදුහල්පති කරන්න කෝ? ඉවරයි නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මාධ්‍ය වැරැදි වාර්තාවක් දෙන්න පුළුවන්. එතුමා කියන විධියට මම මාධ්‍යයට කියන්න ඕනෑ, බස්නාහිර පළාතේ සියලුම දරුවන්ට පාසල් තිබෙනවා. සියලුම දරුවන්ව පාසල්වලට ඇතුල් කරනවා. බස්නාහිර පළාතේ කිසියම් දරුවෙක්ට අඩුම වශයෙන් පොත්පත්, නිල ඇඳුම්වත් නැත්නම් ඒ සියලුම දරුවන්ට පොත්පත්, නිල ඇඳුම් දෙන්න අමාත්‍යාංශය සූදානම් වෙලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ, මේ තියාගෙන ඉන්න ලැයිස්තු ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අනාවශ්‍ය ප්‍රශ්නවලට කාලය දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් වාඩි වෙන්න. මම පැහැදිලි කරන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලැයිස්තුව තවම හංගාගෙන ඉන්නවා, අරින්නේ නැතුව.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ලැයිස්තුවක් නොවෙයි ගරු සභාපතිතුමනි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ රණවිරුවන්, පොලීසිය පාවා දීගෙන බොරු කර කර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ අනවශ්‍ය දේවල් කථා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මන්ත්‍රීවරුන්ට ළමයින් දාගන්න - ගියපාර ජූනි මාසේ වෙද්දී ලැයිස්තුව දැම්මේ. ජූනි මාසේ වෙනකල් ලැයිස්තුව දැම්මේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේවා තමුන්නාන්සේගේ වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අකැමැති ඇයි? ඔබතුමාගේත් ලැයිස්තුවක් තියෙනවාද? ඔබතුමාගේත් ලැයිස්තුවක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ ලැයිස්තු නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් බලමු කෝ මෙදා පාර ලැයිස්තු යවද්දී. අපේ පාසල්වලට ළමයි දාගන්න බැරුව ඉන්නවා. අපට ඇවිල්ලා කියනවා. තවම මේ ලැයිස්තු හද හදා ඉන්නවා. මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තු හද හදා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අර පෙත්ත ගහන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පෙත්ත ගහන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ ලැජ්ජා වෙන්න ඕනෑ. මහ ලොකුවට පම්පෝරි ගහනවා අධ්‍යාපනය ගැනයි, අරකයි මේකයි ගැනයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. ගම්පහ දිස්ත්‍රික් කමිටුවත් එකයි. අපේ පළාත් සභාවත් එකයි කියලයි දැන් මට පේන්නේ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ගම්පහ DDC එකත් එකයි. මේ සභාවත් එකයි. DDC එකේ තාත්තයි මෙතුමායි කථා කරනවා.

# නොපැමිණ සිටීමේ අවසරය
# LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා සහ ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා අසනීප තත්ත්වයෙන් පසු වන බැවින් මාස දෙකක නිවාඩු අනුමත කළ යුතු යැයි "* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, ගියවර සභාවේදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. එලෙස අපව දැනුවත් කිරීම පිළිබඳව ඇත්ත වශයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මම සෞඛ්‍ය අමාත්‍යාංශය ගිය අවුරුද්දේ භාර අරගෙන මාස අටයි. එතකොට මේ ඇස්තමේන්තු කරන වැඩ පිළිවෙළ සියලුම යෝජනාවන් සම්බන්ධයෙන් කරලා ඉවරයි. මම ඒවා දන්නෙත් නැහැ. පසුව තමයි මම සොයා බැලුවේ. මෙහි ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ, මම වාර්තාවක් කැඳෙව්වා. එහි මට දැනුම් දීලා තිබෙන්නේ, කාර්මික නිලධාරීන්ගේ අඩුව කියලා. මේ වෙලාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරනවා. කාර්මික නිලධාරීන් සම්බන්ධයෙන් මේ අවුරුද්දේදීත් ඒ ප්‍රශ්නය මතු වෙන්න බොහෝදුරට ඉඩ තිබෙනවා. අපේ බස්නාහිර පළාත් සභාවේ සැලසුම් ශිල්පීන් අඩුයි. ඉංජිනේරු කාර්යංශයේ. ඉංජිනේරු කාර්යංශයෙන් තමයි විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගොඩනැගිලි ඉදි කිරීමේදී ඒ අවශ්‍ය කරන ඇස්තමේන්තු හදන්න ඕනෑ එහෙන්. ඉතින් ඒක නිසා මේ අඩුපාඩුව දැන්වත් මඟහරවා ගන්න වෙනවා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙනම කාර්මික නිලධාරී මහත්මයෙක් වෙන් කරලා තිබුණා. එතුමා මෑතකදී හදිසියේ අභාවප්‍රාප්ත වුණා. ඒකත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලොකු පාඩුවක් වෙලා තිබෙනවා. ඒක නිසා එම වාර්තාව මම ළඟ තිබෙනවා. විශාල කරුණු ප්‍රමාණයක් තිබෙන නිසා මා එම වාර්තාව සභාගත කරනවා.[3] අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව බලලා අදහසක් ගන්න පුළුවන්. මෙය කියවන්න බැරි නිසා මම එය සභාගත කරනවා. බොහොම ස්තුතියි.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ, කොළඹ හා කොළඹ නගර සභා සීමාව තුළ තිබෙන සිංහල මාධ්‍ය පාසල්වල මුස්ලිම් දරුවන් 501 ට වඩා වැඩි පිරිසක් අධ්‍යාපනය ලබයි. ඔවුන්ට ඉස්ලාම් පෙළපොත් හා ගුරුවරුන් ඉගැන්වීමට නැති නිසා ස්වේච්ඡා ගුරු භවතුන් ලබා දීම සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට එම්. ආර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. 501 ට වැඩි නොවෙයි. 50% කට වැඩි ප්‍රමාණයක් වාගේ තිබෙන්නේ. 501 නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මට මෙය පෙනෙන්නේ 501 වගෙයි.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, කොළඹ සීමාව තුළ සිංහල මාධ්‍ය පාසල්වල මුස්ලිම් දරුවන් වැඩි ප්‍රමාණයක් ඉගෙන ගන්නවා. ඒ කියන්නේ 50% කට වැඩි ප්‍රතිශතයක් ඉගෙන ගන්නවා. නමුත් මේ මුස්ලිම් දරුවන්ට ඉස්ලාම් ආගම ඉගැන්වීම සඳහා පෙළපොත් ලබා දීලා නැහැ. ඒ වාගේම එයට ගුරුවරුනුත් නැහැ. ඒ සම්බන්ධව අපි කිහිප වතාවක් කථා කරලා තිබෙනවා. අපේ ගරු අධ්‍යාපන ඇමැතිතුමා හොඳ ප්‍රවණතාවයක් අරගෙන තිබෙනවා කියලා මට ආරංචි වුණා. මීට පෙර ලිඛිතව එතුමාට ඉල්ලීම් කරලා තිබෙනවා.

[3] හැන්සාඩ් අංශයේ තබා ඇත.

අපි ඉල්ලා සිටින්නේ වෙන මොනවත් නොවෙයි. අපේ මේ මුස්ලිම් දරුවන්ට ආගම ඉගැන්වීම සඳහා. අපි මේ වෙන දේවල් ඉල්ලුවේ නැහැ. අපි ඉල්ලීම් ඉල්ලුවේ නැහැ. අධ්‍යාපනයට තමයි අපි ඉල්ලන්නේ. මේ ගුරුවරු නැතිකම අපි දන්නවා. ගුරුවරුන් බඳවා ගැනීමේ අපහසුතාවයක් ඇති බවත් අපි දන්නවා. නමුත් මේකට මොනවා හරි ක්‍රියා මාර්ගයක් තිබිය යුතුයි. අපට පුළුවන් මේ පාසල්වලට ස්වෙච්ඡා ගුරුවරුන් ලබා දෙන්න. ඒ ස්වෙච්ඡා ගුරුවරුන්ට මාසික ගෙවීමක් වශයෙන් අපි රජයෙන් දෙන්නය කියලා ඉල්ලන්නේ නැහැ. අපි කියන්නේ අපට පුළුවන්. අපේ දානපතියන් ඉන්නවා. ඒ දානපතියන් ලවා ඒ ස්වෙච්ඡා ගුරුවරුන්ට මාසික දීමනාවක් ගෙවීමට පුළුවන්. නමුත් මේකට අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු මේ විදුහල්පතිවරුන් ගෙන්වලා, මේ විදුහල්පතිවරුන්ට කරුණු පහදා දීලා අපට අනුමැතිය ලබා දෙන්නය කියලා තමයි ඉල්ලා සිටින්නේ.

අද සිංහල පාසල්වලට ගියාම අපේ මුස්ලිම් දරුවන් ඒ ආගම් විෂයය තිබෙන කාලවකවානුව තුළදී ඔවුන්ට ඒ ආගම ඉගෙන ගැනීමට නැති තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මේක ඉතාමත්ම භයානක තත්ත්වයක්. අපි මන්ත්‍රීවරු වශයෙන් කොළඹ ජනතාව අපට ඡන්ද වරමක් දීලා, නියෝජනයට පත් කරලා තිබෙන්නේ, ඔවුන්ගේ මේ ගැටලු ඔක්කොම කථා කරලා ඔවුන්ගේ ඒ ගැටලුවලට සාධාරණයක් ඉටු කිරීම සඳහායි. මම හිතන විධියට මේ සම්බන්ධව කිහිප වතාවක්ම අපි පළාත් සභාවට පැමිණි දවසේ සිටම කථා කරගෙන ආවා. නමුත් කිසිම පිළිතුරක් තව වනතුරු ලැබුණේ නැහැ. අපි ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා. ඔබතුමා හරහා ගරු මහ ඇමැතිතුමාත් දැනුවත් කරනවා. ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. මෙයට අනුමැතිය ලබා දීලා සාකච්ඡා මට්ටමින් විදුහල්පතිවරුන් ගෙනල්ලා මෙයට සාධාරණයක් ඉටු කරන්නය කියලා ඉල්ලමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. බස්නාහිර පළාතේ අධ්‍යාපනය පිළිබඳව සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මම මේ ප්‍රකාශය කරන්න ඉස්සෙල්ලා ප්‍රකාශ කරන්න ඕනෑ. අපි මේ කරන විශේෂ ප්‍රකාශ, ඒ වාගේම වරප්‍රසාද ප්‍රශ්න මේ සභාවට යොමු කළාම, ඊට පසුව පසුවිපරමක් සිදුවන එක ගැන අපට ඇත්ත වශයෙන්ම දැනගන්න ලැබෙන්නේ නැහැ. අපි දැන් අත්‍යවශ්‍ය කාරණයක් සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් මේ සභාවේදී කළාම, ඒකට මොනවද වුණේ කියලාවත් අපි දන්නේ නැහැ. අපි නිකන් විනාඩි දෙක තුනක විශේෂ ප්‍රකාශයක් කරලා අදාළ ඇමැතිවරයාට යොමු කරනවා කියලා ඔබතුමා කියනවා. නමුත් ඒක එතැනින් එහාට වෙන්නේ නැහැ.

දැන් මම මේ කියන්න යන කාරණාවත් ඒ හා සම්බන්ධ දෙයක්ම තමයි. 1961 පාසල් රජයට පවරාගත් වෙලාවේ කතෝලික සභාව සතුව තිබුණු පාසල් විශාල ප්‍රමාණයක් රජයට පවරා ගත්තා. දැන් එහෙම පවරා ගන්න කොට රජයට කොන්දේසියක් දැම්මා, ඒ පාසල් පවරාගෙන ඊට පසු කටයුතු කරගෙන යන කොට ඒ පාසල්, අධ්‍යාපන කටයුත්ත සඳහා පාවිච්චි කරන්නේ නැත්නම්, ඒ ගොඩනැගිලි සහ ඒ භූමිය නැවත මුල් අයිතිකරුවන්ට දෙන්න ඕනෑය කියන පැහැදිලි කොන්දේසියක් පවරාගන්න කොට තිබුණා. එවකට හිටපු අග්‍රාමාත්‍ය සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ. ඒ විධියට තමයි දිගින් දිගට ආවේ. දැන් මේ අනුව පසුගිය කාලයේත්, මම මේ පළාත් සභාවට පත් වෙලා හතරවැනි වතාවේ ඉන්නේ. මේ පළාත් සභාවේ තිබුණු එවැනි පාසල් කිහිපයක් පළාත් සභාවට අයිති නැති වන කොට නැවත මුල් අයිතිකරුවන්ට දුන්නා. උදාහරණයක් විධියට පමුණුගම දේවස්ථානයට අයිති වෙලා තිබුණු ගොඩනැගිලිත් ඒ විධියට දීලා තිබෙනවා. වත්තලත් ඒ වාගේම දුන්නා. දැන් පමුණුවිල ප්‍රාථමික විද්‍යාලය, මම හිතන්නේ මේ ලිපිය රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාට අයිවන් පෙරේරා පියතුමා, කතෝලික අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉන්න පියතුමා ලිපියකින්ම දැනුම් දීලා තිබෙනවා. ඒ සඳහා උවමනා කරන ඔක්කොම ලියකියවිලිත් එක්ක. දැන් මේ පාසලට අක්කර 7 ½ ක ඉඩමක් රජයෙන් දීලා තිබෙනවා. මේ අක්කර 7 ½ තමයි පාසල පවත්වාගෙන යන්නේ. එතකොට මේකේ පවරා ගත්ත ඉඩම් ටික නැවත දේවස්ථානයට භාර දෙන්නය කියලා කොළඹ අගරදගුරු මැදුරට ලබා දෙන්නය කියලා

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

බොහොම පැහැදිලි නඩු තීන්දුවක් දුන්නා. නඩුවක් ගිය නිසා. අභියාචනාධිකරණයේ නඩුවක් පැවරුවා. නඩුවේදී බොහොම පැහැදිලි තීන්දුවක් දුන්නා. මෙහි නඩු අංකයත් බොහොම පැහැදිලිව තිබෙනවා. 2006.02.17 වැනිදා 1433 කියන ගැසට් පත්‍රයේ පළ කරලා මේක දුන්නේ. නමුත් නැවත වතාවක් කාගේ උවමනාවටද කියලා මම දන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් මෙහෙම ඇපෑලක් ඉදිරිපත් කරපුවාම කාගේ සල්ලිද මේ වියදම් වෙන්නේ? මේක බොහොම පැහැදිලිවම දෙන්න කියලා තිබෙන එකක්. මහජනයාගේ සල්ලි. ඒ විතරක් නොවෙයි මේ සභාවේ සල්ලි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් කියන්න මේ සභාවේ සල්ලි ලක්ෂ ගණනක් වියදම් වෙනවා. මේ නඩු එක සැරේ ඇහෙන්නේ නැහැ. ඉතින් ඒක නිසා මේවා මහ විහිළු වැඩ. මේ දෙන්න තිබෙන දේවල් දුන්නාට පස්සේ ආයේ සැරයක් මේ පළාත් සභාවෙන් කාගේ උවමනාවටද කියලා මට තේරෙන්නේ නැහැ. නැවත සැරයක් ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. බොහොම පැහැදිලිව තිබෙනවා. ඒකේ ගොඩනැගිලිත් නැහැ. අක්කර 7 ½ ක ඉඩමකුත් දීලා තිබෙනවා. ඒකේ දැන් පාසලත් පවත්වාගෙන යනවා. ඉතින් එහෙමනම් මොනවාටද මේ විධියට කාලය නාස්ති කර කර, මුදල් නාස්ති කර කර මේ විධියට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහේද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පමුණුවිල. පමුණුවිල ඉස්කෝලේ. ඉතින් ඒක නිසා මම බොහොම පැහැදිලිව ඔබතුමාගෙන් ඉල්ලනවා. මේක ගරු අධ්‍යාපන ඇමැතිතුමාට මම නැවත සැරයක් මතක් කරලා කියන්න ඕනෑ. කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් හිමිපාණන්ට ලිපියකින් එතුමා දැනුම් දීලා තිබෙනවා. සියලුම ලිපි ලේඛනත් ඇතිව. මේ ගැසට් නිවේදනත් එක්ක දීලා තිබෙනවා. මේක වහාම ක්‍රියාත්මක කරන්න. මේ අනවශ්‍ය නඩුහබ වලට පැටලිලා මිනිස්සුන්වත් කුලප්පු කර කර ඇවිදින්නේ නැතිව එක්කෙනෙක්ගේ දෙන්නෙක්ගේ උවමනාවට තමයි මේ වැඩ සිද්ධ වෙන්නේ. ඒක නිසා මෙවැනි ප්‍රකාශයක් කරපුවාම සභාවේදී ඒ ප්‍රකාශයට මොකද වුණේ කියලා අඩුම ගණනේ ඊළඟ සභාවේදීවත් කියන්න පුළුවන් හැකියාවක් නිර්මාණය වෙනවා නම් මම හිතන්නේ ඒක අපේ ආත්ම ගෞරවයටත් හොඳයි. හැම මන්ත්‍රීවරයෙකුගේම ආත්ම ගෞරවයට හොඳයි. නිකන් මෙතැන අපි නැඟිටලා ප්‍රකාශයක් කරනවා. ප්‍රකාශයක් කෙරුවා කියලා හැන්සාඩ් ගත වෙනවා. එතැනින් එහාට කිසි දෙයක් වෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ කරන ප්‍රකාශවල යම්කිසි ප්‍රතිඵලයක් ලැබෙනවා නම් අඩුම තරමින් මේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අපි කටයුතු කරපු කාලයේ අපට යම්කිසි වරප්‍රසාදයක් හැටියට මෙය ලැබෙනවා කියලා අපට හිතහදාගෙන ඉන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්නය කියලා මම ඉතාමත්ම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා කිව්ව කාරණය මමත් අනුමත කරනවා. මොකද හේතුව, දැන් අපි හැමදාම පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරනවා. පෞද්ගලික ප්‍රකාශ කියන්නේ, රටේ මොනවා හරි තිබෙන දූෂණයක්, වංචාවක් එහෙම නැත්නම් අසාධාරණයක් සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමයි. ඉතින් මෙය හැන්සාඩ් ගත වෙන එක විතරයි වෙන්නේ. ගරු ඇමැතිතුමන්ලාත් අහගෙන ඉන්නවා. අපිත් අහගෙන ඉන්නවා. මේ පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ගයක් නැහැ. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව අවධානය යොමු කරලා නිලධාරියෙක් හරි කමක් නැහැ සභාවේ ඒ අවස්ථාවේ නියෝජනය කරලා මේ සම්බන්ධව කුමක් හෝ විසඳුමක් හරි උත්තරයක් ලබා දෙන්නය කියලා ගරු ඇමැතිතුමන්ලාගෙන් ඉල්ලනවා. ඊළඟ සභාවේදී හරි කමක් නැහැ. මම හිතන්නේ එහෙම පියවරක් ගත්තොත් ගරු මන්ත්‍රීතුමාට සාධාරණයක් ඉෂ්ට වෙනවා. මොකක් හරි වැඩ පිළිවෙළක් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මහ ඇමැතිතුමා ඕනෑ නැහැ. ඒ ඒ අමාත්‍යාංශවල ඉන්න ඇමැතිවරු ඒ වගකීම භාර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වගකීම භාර ගන්න ඕනෑ. නැත්නම් එතුමා කිව්වා වාගේ මේක විහිළුවක් වෙනවා. අපි අවුරුදු ගණනක් කථා කළා. මෙතුමා කිව්ව ප්‍රශ්නය සාධාරණ ප්‍රශ්නයක්. රටේ දූෂණ, වංචා නොයෙක් දේවල් කථා කරනවා. එක ප්‍රශ්නයක් මම දැක්කා. දැන් අර මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා උත්තර දුන්නා වාගේ අනික් ඇමැතිවරුන්ටත් පුළුවන් ඊළඟ සභාවේදී පෞද්ගලික ප්‍රකාශවලට උත්තරයක් දෙන්න, ලැහැස්ති වෙන්න. දැන් මේ සභාවේදී දෙන්න බැහැ. කරුණු සොයන්න ඕනෑ නේ? එහෙම කළොත් විනිවිධභාවයකින් ගරු මන්ත්‍රීවරුන්ට සාධාරණයක් ඉෂ්ට වෙනවා.

යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, 2017 වසරේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ වන වත්මන් තත්ත්වය පිළිබඳව අදහස් දැක්වීමට ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කථා කරන කොට මට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. බාධා කරන්නේ නැතිව. ඇත්තටම පසුගිය පෙබරවාරි මස 28 වැනිදා ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉල්ලීමක් කරලා තිබුණා, අපට රන්මහ පායට එන්නය කියලා. අපි ගියා. ඒ වෙලාවේ පස්වැනි තට්ටුවේ මමත් සිරිකමල් ගරු මන්ත්‍රීතුමාත් රොයිස් විජිත ගරු මන්ත්‍රීතුමාත්, ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාත් එයට සහභාගි වුණා. එනකොටම අපේ රවී විජේසේකර ගරු මන්ත්‍රීතුමාත්, සකාවුල්ලා ගරු මන්ත්‍රීතුමාත් ඇතුළු කණ්ඩායම, 20 ක් විතර කණ්ඩායමක් නැඟිටලා කෙලින්ම විරෝධය ප්‍රකාශ කළා, අපට ආරාධනය කිරීම සම්බන්ධව. අපිත් අවුරුදු විසි ගණනක් පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු. මම ඒ වෙලාවේ ඒ කණ්ඩායමට කිව්වා, හැබැයි මේක පොඩ්ඩක් අහගෙන ඉන්න. මම මේ කණ්ඩායමට කිව්වා, මට සුමානයකට ඉස්සෙල්ලා නම් පැපොල හැදිලා තිබුණා. කවුරුත් දන්නවා. Chiken focks හැදිලා තිබුණා. හැබැයි, මට වසූරි රෝගය හැදිලා නැහැ. එහෙම නැඟිටලා යන්න එපා. අපි වරදක් කරලා නැහැ. අපි මන්ත්‍රීවරු තැන් තැන්වල ගිහිල්ලා සම්මන්ත්‍රණවලට සහභාගි වෙනවා. එකට ඉන්නවා. මගේ දේශපාලන ජීවිතයේ හිතට දුකම දවසක්, එදා දවස. මම ඉල්ලීමක් කළා, එහෙම යන්න එපා. ඕනෑම දෙයක් තිබෙනවා නම් කථා කරමු අපි කියලා. කථා කරලා අපි විසඳ ගනිමු කියලා. මෙතුමන්ලා ඒ වාගේ කැත වැඩක් කළා. මේ සම්බන්ධව අපේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා වාගේම එතුමන්ලා කියාගෙනත් ගියා. හරි, අධ්‍යාපන ඇමැතිතුමාට අපි විශ්වාසභංගය දානවා. මොනවද වචන කියාගෙන ගියා. මම මේ වෙලාවේ වගකීමෙන් කියනවා. විශ්වාසභංග කථා කරනවා නම් - අපේ හිටපු විපක්ෂ නායක කිත්සිරි කහටපිටිය මැතිතුමාගේ කාලයේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමාවත්, රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාවත් අපි දණ ගැස්සුව හැටි. මමයි යෝජනාව දැම්මේ. මමයි අපේ ඩග්ලස් ගරු මන්ත්‍රීතුමයි. මෙතුමාගේ කාලයේ. මේවා ගැන කථා කරන්න ආවොත් ඔබතුමන්ලාගේ කණ්ඩායමේ නිලතල තිබෙන එක්කෙනෙක්ට අපි දාලා, ඒ බහුතරය අපි පෙන්වනවා. ඒ ගැන කථා කරන්න එපා. ඒ වාගේ කැත වැඩ කරන්න එපා. ඒ වාගේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

වැඩ කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයටත්, කොළඹ දිස්ත්‍රික්කයටත් මේ කණ්ඩායම -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

දාන්න කියලා අපි අභියෝග කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හරි. ඔබතුමන්ලා දානවා නම් - ඉන්න මගේ කථාව ඉවර නැහැ නේ? ඔබතුමන්ලා දැම්මොත් දානවා කියලා අපි කිව්වේ. ඔබතුමන්ලා දැම්මොත් දානවා කියලා අපි කිව්වේ. මම දානවා කියලා කිව්වේ නැහැ. පොඩ්ඩක් ඉන්න. ඒ වාගේම පළමුවැනි වසරට සාධාරණය - යහපාලනයක් තුළින් රජයක් ඇවිල්ලා තිබෙන්නේ, අද ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් නායකත්වයෙන්. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සාධාරණය ඉෂ්ට කරන්න. අපිත් ජනතා නියෝජිතයෝ. අපිත් පාරවල් හදලා, අපිත්

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

අධ්‍යාපනයට සාධාරණය දීලා, අපිත් ඡන්දයකට යන්න ඇවිල්ලා තිබෙන්නේ. සාධාරණය ඉෂ්ට කරන්න. මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ධූරධාරීන්ට වාහන දෙන්න කියලා න්‍යාය පත්‍රයට දාලා යෝජනා සම්මත කරගෙන යම් යම් අයට වාහන ගත්තා. ඒත් සභානායකතුමා, විපක්ෂ නායකතුමා, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, විපක්ෂයේ සංවිධායකට ඒ වාහන හම්බ වුණේ නැහැ. අද විපක්ෂ නායකතුමා අසනීප තත්ත්වයේ ඉන්නේ. ඉස්පිරිතාලයට යන කොට වාහනය කැඩිලා. මෙහෙම තත්ත්වයක් තිබෙන්නේ. බෙන්ස් වාහන ගත්තා. ප්‍රාඩෝ රථ ගත්තා. පරණ වාහනයක් හරි විපක්ෂ නායකතුමාට දෙන්න තිබුණා. ගරු විපක්ෂ නායකතුමාගේත්, ගරු ඇමැතිතුවරුන්ගේත් පඩිය සමානයි. එතුමාට අසාධාරණයක් කරන්නේ ඇයි? මම ඉල්ලීමක් කරනවා. වගකීමෙන් කියනවා, ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්නය කියලා.

ඒ වාගේම මෙරිල් මන්ත්‍රීතුමාලා කණ්ඩායමක්. නම කියලාම කියන්නේ. පුවත්පත්වල දාලා තිබුණා, ස්වාධීනව 45 ක් ඉන්නවා කියලා. ගරු මහ ඇමැතිතුමාව බිත්තියට තද කරලා, මේ වාගේ ප්‍රකාශ හැමදාම කරනවා. මීට පෙර අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාටත් ඡන්දයේදී ඒ වාගේම කළා. මේ වාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු සංවිධායකතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම ඉල්ලීමක් කරනවා. ස්වාධීනව ඉන්නවා නම් හෙටම ඉදිරිපත් කරන්න. මම සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට මේ ඉල්ලීම ඉදිරිපත් කරලා තිබෙන්නේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය පිළිබඳව. වත්මන් තත්ත්වය කියන්නේ ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. වත්මන් තත්ත්වය කියලා තිබෙන්නේ ළමයින් ඇතුළත් කිරීම පිළිබඳව. ඔබතුමා දැන් වල්පල් නේ කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙමනම් මම ඉල්ලීමක් කරනවා. පුළුවන් නම් ඒ ස්වාධීන කණ්ඩායම වෙන වෙනම පෙන්වන්න. පහුවදාට අපි ඒ බහුතරය පෙන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙන වෙන ඒවා නේ කියන්නේ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පහුවදාට අපි බස්නාහිර පළාත් සභාවේ බහුතරය පෙන්වනවා. ඒක වගකීමෙන් කියන්නේ. පුළුවන් නම් ස්වාධීනව ඉන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙන වෙන දේවල් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු මහ ඇමැතිතුමාවත්, ගරු ඇමැතිවරුන්වත් හය කරගෙන බිත්තියට තද කරගෙන තමුන්ගේ වැඩ තමයි කර ගන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංවිධායකතුමා වාඩි වෙන්න. අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එදා අපට වුණු අසාධාරණය වාගේ තමයි හැමදාම මේ බස්නාහිර පළාත් සභාවේ වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව නොමඟ අරින්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමා මාර්ගයෙන් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ යහපාලන පළාත් සභාවක් නොවෙයි. මේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ පිහිටවපු පළාත් සභාවක් තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක කියවන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බොරු කියන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය. බස්නාහිර පළාත් සභාවේ වත්මන් තත්ත්වය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාපතිතුමාත් ඉන්නේ, ඒ පැත්තෙ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමා, වත්මන් තත්ත්වය කියන්නේ ඒකයි. මෙයට සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නේ. විපක්ෂයට මොන සාධාරණයක්ද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ සාධාරණ ඉල්ලීම් කරන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

විපක්ෂයේ ඉන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු මහ ඇමැතිතුමා කරුණාකර සාධාරණය ඉෂ්ට කර දෙන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි කිරීම්වලට මට කාලය දෙන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, තුප්පහි කියන වචනය හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශවලට විවාද කරන්න දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

තුප්පහි කියන වචනය පාවිච්චි කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාව නොමග ඇරියා. සංවිධායකතුමා ඔබතුමා බොරු කරන්න එපා. ඔබතුමා මගෙන් ඉල්ලුවේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේක කියවන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දෙන්න. දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොරු ප්‍රකාශ කරන්න එපා. සභාව නොමග අරින්න එපා. ඔබතුමා විපක්ෂයේ සංවිධායකතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

2017 වසරට පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳව වත්මන් තත්ත්වය. වත්මන් තත්ත්වය කියන්නේ පළාත් සභාවේ වත්මන් තත්ත්වය. මේ වත්මන් තත්ත්වය නේ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා බොරු කියන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය නිසා නේ අපට මේ අසාධාරණය වෙලා තිබෙන්නේ. ඇයි සභාපතිතුමා කියන්නේ නැත්තේ. බොරු කියන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොළේ දෙන්න. මේ වාගේ වැඩ කරන්න එපා. ඔබතුමා විපක්ෂයේ සංවිධායකතුමා. ඔබතුමා සභාව නොමග අරින්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මාව නම් කාටවත් බිත්තියට හේත්තු කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මාව නම් කාටවත් බිත්තියට හේත්තු කරන්න බැහැ. මට ඡන්ද 61 ක් තිබෙනවා. මට ඡන්ද 61 ක් නොවෙයි, මේ සභාවේ ඡන්ද 80 ක් තිබෙනවා.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

මොකද, එතුමා මගේ නම සඳහන් කෙරුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. කිව්වා.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

මොකද, මම දැනගන්න කැමැතියි. අධ්‍යාපන ගරු ඇමැතිතුමාට විශ්වාසභංගයක් ගේනවා කියලා ප්‍රකාශ කරපු මන්ත්‍රීවරයා කවුද කියලා දැනගන්න. මොකද, කොහොමවත් අපි එතැන ඒ වාගේ ප්‍රකාශයක් කථා කළේ නැහැ. ඒ වාගේම අද එතුමා වීරයෙක් වාගේ කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයෙන් ගිය අවුරුද්දෙ වැඩියෙන්ම ළමයින් දා ගත්තේ කවුද කියන එකත් මේ සභාවට හෙළි කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කරුණාකර වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා මගේ නම ප්‍රකාශ කරලා කිව්වා, ස්වාධීන කණ්ඩායමක් ලෙස ඉන්නවා කියලා ප්‍රකාශ කරලා තිබෙනවා කියලා. කොහෙවත් පත්තරේක කිසිම දවසක අපි බස්නාහිර පළාත් සභාවේ ස්වාධීන වෙනවා කියලා පත්තරේ ප්‍රකාශ කරලා මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රකාශ කරලා නැහැ. පත්තරේ දාලා තිබෙනවා. කවුරුත් නැහැ. මේක පැහැදිලිව කියන්න ඕනෑ. අපි කණ්ඩායම් රැස්වීමේදී අමාත්‍යවරුන්ගේ සහභාගිවීම නැති නිසා අපි විරෝධය පළ කළා. සියලු අමාත්‍යවරු කණ්ඩායම් රැස්වීමට පැමිණෙන්න අවශ්‍යයි කියලා. අන්න ඒ නිසා මින් ඉදිරියට කණ්ඩායම් රැස්වීමේදී අමාත්‍යවරු නොපැමිණියොත් ඒ අය ගැන ප්‍රකාශ කරනවා කියලා මේ පළාත් සභාවේම ගියවර ප්‍රකාශ කළා. ඒක ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරලා තිබෙනවා. මේ පත්තරේ කියලා තිබෙනවා. අපි ස්වාධීනව ඉන්නවා කියලා නැහැ. මොකද, ගරු මහ ඇමැතිතුමා කිව්ව විධියට සන්ධානයේ මන්ත්‍රීවරු 56 ක් ඉන්නවා. ඒ වාගේම අනික් පක්ෂ එකතු වුණාම 61 ක් ඉන්නවා. අපට 61 ක් ඉන්නවා. මේ සභාව ගෙනි යන්න අපට කාවවත් අවශ්‍ය නැහැ. ස්වාධීන වෙන්න ඕනෑ නම් අපි කාටවත් භය වෙන්නෙත් නැහැ. මේ සභාව ඇතුළේ ස්වාධීන වෙලා ඔය වාගේ දෙකට තුනට නැමිලා ප්‍රකාශ කරන්නේ නැතිව අපි කොන්ද කෙලින් තියාගෙන ස්වාධීන වෙනවා. කොයි වෙලාවේ හරි අවස්ථාවක් උදා වුණොත්, ඒ වෙලාවේ අපි කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි ගරු මන්ත්‍රීතුමා. වාඩි වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමා, මෙතුමා වැදගත් මන්ත්‍රීවරයෙක් වශයෙන් කරපු පහත් ප්‍රකාශය, තුච්ඡ වචනය. කරුණාකර හැන්සාඩ් එකෙන් ඒ වචනය ඉවත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒක බලලා ඉවත් කරන්නම්. මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මට මේ පෞද්ගලික පැහැදිලි කිරීම් කියලා ලියලා දෙන කාරණා විතරක් කථා කරන්න. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමා අවංක වෙන්න. ඔබතුමා විපක්ෂයේ සංවිධායකතුමා. ඔබතුමා ඇයි මාව රවට්ටන්නේ. බොරු කියන්නේ ඇයි?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

යහපාලන ආණ්ඩුවෙන් සලකලා නැහැ. දූක තමයි කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් ප්‍රකාශත් ඒ වාගේ නේ ඉතින්. ඔබතුමා සංවිධායකතුමා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වත්මන් තත්ත්වය. ඒ ගැන තමයි මම ප්‍රකාශ කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වත්මන් තත්ත්වය නොවෙයි නේ. 1 වසර නේ? බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කථා කිරීමට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමා හොඳ මන්ත්‍රීවරයෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බාධා කිරීම් කරන්න එපා. නිශ්ශබ්ද වන්න කියන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ඒක වැදගත් ප්‍රකාශයක්. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියන්නේ බොහොම පළපුරුදු මන්ත්‍රීවරයෙක්. එතුමා කියනවා අපි භය කරලා තමයි මේ වැඩ කර ගන්නේ කියලා අධ්‍යාපන ඇමැතිතුමාගෙන්. මොකක්ද භය කරලා කියන්නේ? ඒක වැරැදි ප්‍රකාශයක්. එහෙම පුළුවන්ද? මහ ඇමැතිතුමාවයි, අධ්‍යාපන ඇමැතිතුමාවයි භය කරලා තමයිලු මේ වැඩ කර ගන්නේ? මොකක්ද මේ කියන්නේ? (බාධා කිරීමක්) නැහැ, නැහැ එහෙම කිව්වේ නැහැ. බොහොම පැහැදිලිව කිව්වා මහ ඇමැතුමාවයි, අධ්‍යාපන ඇමැතිතුමාවයි භය කරලා තමයි අපි මේ වැඩ කරගන්නේ කියලා. එහෙම කරන්න පුළුවන්ද? මේ දැනුත් කියනවා. මොකක්ද? මහ ඇමැතිතුමාගේ ආත්ම ගෞරවය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ කාලය වටිනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකක්ද මහ ඇමැතිතුමාගේ ආත්ම ගෞරවය?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, මම මේ කල්පනා කරන්නේ මොන යකාද කළේ කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා ප්‍රකාශය කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පසුගිය කාල වකවානුව තුළම මේ කුණු ප්‍රශ්නය ගැන අපි කථා කළා. පසුගිය සතියේ අපේ කාදිනල් වහන්සේගේ නිල නිවසේදීත්, අපේ කොටුගොඩ නායක හිමිපාණන් වහන්සේත්, අපේ හිටපු මහ ඇමැති ප්‍රසන්න රණතුංග මැතිතුමාත් ඒ වාගේම සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත්, තවත් දේශපාලන අධිකාරියේ සහභාගීත්වයෙන් අපේ සාකච්ඡාවක් පැවතුණා. ඒ සාකච්ඡාවෙන් පස්සේ අතිගරු ජනාධිපතිතුමා අපේ නායක හිමිපාණන් වහන්සේටත්, කාදිනල් වහන්සේටත් දුරකථනයෙන් අමතලා කිව්වා, මේ කුණු ජා-ඇළට ගෙන එන්නේ නැහැයි කියලා. ඉතාමත් පැහැදිලිව කිව්වා. මම හිතන්නේ උන් වහන්සේලා දෙපළම මාධ්‍යය හරහාත් ඒක ප්‍රසිද්ධ කළා. අද වනකොට මට ආරංචිය ලැබුණා ඊයේ පැවතුණු තත්ත්වයත් එක්ක - මීතොටමුල්ලේ පොඩි උද්ඝෝෂණයක් තිබුණා. අපි දැක්කා කිහිප දෙනෙක් ඉන්නවා. 20 ක්, 30 ක් විතර අපේ පළාත් සභාවේ හිටපු

මන්ත්‍රීතුමා එස්.එම්. මරික්කාර් මැතිතුමාත් එක්ක. අපේ හෙළ උරුමය ඉස්සර නියෝජනය කරපු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේත් එතැන ස්වාධීනව හිටියා අපි දැක්කා. අපට දැන් ආරංචි වෙලා තිබෙනවා ෆයිසර් මුස්තාපා ඇමැතිතුමා මේ ගැන සාකච්ඡාවක් කරනවා කියලා මේ කුණු ටික නැවත ජා-ඇළට ගෙන ඒම සම්බන්ධව. ගරු සභාපතිතුමනි, ඉතාමත් පැහැදිලිව මේක පිටිපස්සේ ඉන්නේ කවුද කියලා මීට ඉස්සෙල්ලාත් අපි කිව්වා. ජාතික හෙළ උරුමය. නිශාන්ත වර්ණසිංහ අපේ හිටපු ඇමැතිතුමා අද මෙතැන නැහැ. එතුමා ප්‍රසිද්ධියේ මේ සභාවේ ප්‍රකාශයක් කළා අනිවාර්යෙන්ම මේ කුණු ටික ජා-ඇළට ගේනවා කියලා. ඉතින් මේක පිටිපස්සේ ඉන්නේ කවුද කියන එක අපි අලුතෙන් කියන්න ඕනෑ නැහැ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, හැමදාම අපි කියන්නේ ජා-ඇළට කුණු ගේන්න නම් එපා. කුණු ගෙනාවොත් රතුපස්වල දෙක තමයි වෙන්නේ. ඒක ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ. ජනාධිපතිතුමා පොරොන්දුවක් දුන්නාට පස්සේ. ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශයක් කළාට පස්සේ. එහෙම නම් ෆයිසර් මුස්තාපා ඇමැතිතුමාට තිබෙන බලය මොකක්ද? ජනාධිපතිතුමාටත් ඉහළින් ගිහිල්ලා නැවත ඒ ගැන සාකච්ඡාවක් පවත්වන්න. ඒ ගැන අපට විශේෂයෙන්ම ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් පාලන ඇමැතිතුමා හැටියට එතුමාට අයිතියක් තිබෙනවා, පළාත් පාලන ආයතනවල වන දේවල් ගැන කථා කරන්න. නමුත් ජනාධිපතිතුමා පොරොන්දුවක් දුන්නාට පස්සේ අර මරික්කාර් මන්ත්‍රීතුමාගේ උවමනාවට මේ කුණු ටික තවත් තැනකට ගිහිල්ලා, හලලා දාන එක නොවෙයි මේකට විසඳුම. මේකට විසඳුමක් සොයා ගන්න. පළාත් පාලන ආයතනත්, අපේ මහ ඇමැතිතුමාත් ඒ වාගේ පරිසර ඇමැතිතුමාත්, මෙගා පොලිස් එකේ පාඨලී ඇමැතිතුමාත් මේකට අවශ්‍ය විසඳුමක් සොයා ගන්න එක ඒ අයගේ යුතුකමක්. නමුත් කුණු ගෙනිහිල්ලා තව තැනකට දාලා මීතොටමුල්ලේ ජනතාවටම වුණු දේ ජා-ඇළ ජනතාවටත් වෙන්න ඉඩ තියන්න අපි කිසිසේත්ම ලැහැස්ති නැහැ. ඒත් එක්කම මම කියන්න ඕනෑ ඒ අවස්ථාවට අපේ නියෝජ්‍ය ඇමැතිවරයෙක් එතැනට කඩා පාත් වෙලා එක්තරා පොරොන්දුවක් දීලා ගියා. අපේ රංජන් රාමනායක ඇමැතිතුමා. ඒක පැහැදිලිවම කියන්න ඕනෑ. එතැනට ඇවිල්ලා රඟපෑමක් කරලා ගියා. (බාධා කිරීම්) පොඩ්ඩක් කථා කරන්න දෙන්න කෝ? ගරු සභාපතිතුමනි, අපි ඉතාමත් පැහැදිලිව කියනවා එදා එතුමා ඇවිල්ලා පොරොන්දු වෙලා ගියා ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡාවක් අරගෙන දෙනවා කියලා. මම මාධ්‍යයට කියන්නේ, තමුන්නාන්සේලා ප්‍රසිද්ධ නළුවන්ව, රඟපාන අයව විතරක් ප්‍රසිද්ධ කරන්න, ඒ අයව පාවිච්චි කරලා මාධ්‍ය විකුණා ගන්න, ඒ අයව පාවිච්චි කරලා මාධ්‍යයට ප්‍රචාරයක් ලබා ගන්න කටයුතු කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ සීට් එකේ ඉඳගෙන මාධ්‍ය අමතන්න බැහැ. තමුන්නාන්සේව අමතන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජනතාවගේ වැදගත් ප්‍රශ්නයක් ආවාම ජනතාවගේ පැත්තේ ඉඳලා ජනතාවට අවශ්‍ය ඒ ප්‍රචාරය ලබා දෙන්න. නැත්නම් රඟපාන අය වෙනුවෙන් තමුන්නාන්සේලා කඩේ යන්න එපා කියන එක මම ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමාත් රඟපාන එක තමයි කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා රඟපාලා නේ ඔතැනටත් ආවේ. අපි දන්නවා නේ? ඔබතුමාට පක්ෂයකුත් නැහැ නේ? පුළුවන් නම් තමුන්නාන්සේගේ පක්ෂයෙන් ඡන්දයක් ඉල්ලලා පෙන්නන්න කෝ? ඡන්ද 50 ක් අරන් පෙන්නන්න. වැඩිය ඕනෑ නැහැ. ඡන්ද 50 ක් අරගෙන පෙන්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා දැන් සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ පරිසර අමාත්‍යවරයා හැටියට පැහැදිලිව කියන්න ඕනෑ. මීතොටමුල්ල කුණු ගොඩටවත්, එහෙම නැත්නම්

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මීතොටමුල්ලෙන් ඒකලට කුණු ගෙන යෑම සම්බන්ධයෙන් මේ බස්නාහිර පළාත් සභාවේ කිසිම සම්බන්ධයක් නැති බව. පැහැදිව කියන්න ඕනෑ. මන්ත්‍රීවරු තමන්ගේ අදහස් ප්‍රකාශ කළාට කමක් නැහැ. මහ ඇමැතිට ඇඟිල්ල දික් කරන්න එපා. ඒක ඒ අයගේ පක්ෂයෙන්ම විසඳ ගන්න ඕනෑ ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මහ ඇමැතිතුමාගෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මෙහෙම රීතියක් නැහැ. ආයිත් නැඟිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් පාඨලී ඇමැතිතුමාත් කියන්නේ ඔය ටිකම තමයි. අපේ සම්බන්ධයක් නැහැ. ඒක නගර සභාවේ. නගර සභාව අයිති කාටද? කොළඹ නගර සභාව අයිති කාටද? නගර සභාවේ දේවල් පාලනය වෙන්නේ කා යටතේද? මහ ඇමැතිතුමාගේ යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අනවශ්‍ය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද පළාත් පාලන ආයතනවල පාරක් හදන්න බැහැ මහ ඇමැතිතුමාගේ අත්සන නැතුව. එහෙම නම් කොළඹ මහ නගර සභාවට අයිති කුණු -

[සභාවේ ඝෝෂා]

කොහොමද එහෙම ඒකලට ගෙනියන්නේ? ඒක පොඩ්ඩක් අපට කියන්න. කොළඹ මහ නගර සභාවට අයිති කුණු කොහොමද -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ යහපාලන ආණ්ඩුවට ඡන්දයක් තියාගන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය විධියට ප්‍රශ්නවලින් අත හෝදා ගන්න දෙන්න බැහැ. නගර සභාවත් එක්ක කථා කරන්නලු. නගර සභාවෙන් තාර ටිකක් දාගන්න බැහැ මෙතුමාගේ අත්සන නැතුව. මොකක්ද මේකේ තේරුම?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මොනවාද මේ කියන්නේ? කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ, මෙතුමා තනිකර බොරු නේ කියන්නේ? මම ඕනෑ නම් ඔබතුමාගේ ඉතුරු ටිකත් හෙළි කරලා කියන්නම්. පාඨලී ඇමැතිතුමාගෙයි, මෙතුමාගෙයි තියෙන ප්‍රශ්නයත් මම ඕනෑ නම් කියන්නම්. මම ඒකට කැමැති නැහැ. හැබැයි එහෙම බොරු ප්‍රකාශ කරන්න එපා. මට අදාළ නැහැ කියලා කියන්න එපා. පළාත් පාලන ආයතන ඔබතුමාටයි අදාළ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගම්පහ DDC රුස්වීම බවට බස්නාහිර පළාත් සභාව ඔබතුමා පත් කරන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඡන්දය තියන්න. ඉවරයි නේ? ඡන්දය තියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉල්ලා අස් වෙලා බස්නාහිර පළාතේ ඡන්දය තියන්න කියමු. ඔක්කෝම කැමැති නම් අපි තියමු.

බස්නාහිර පළාතේ ඡන්දය තියන්න ඔක්කෝගෙම කැමැත්ත දෙන්න කෝ?

[සභාවේ ඝෝෂා]

මේ සභාව විසුරුවන්න කියලා මහ ඇමැතිතුමාට ලිඛිතව දෙන්න. අපි අත්සන් කරනවා. ඡන්දයට යන්න. දැන් ඡන්දය නේ ඕනෑ. ලිඛිතව දෙන්න.

[සභාවේ ඝෝෂා]

දැන් කිව්වා නේ බහුතරය තියෙනවා කියලා. අපේ සභාව විසුරුවන්න ඉල්ලීමක් කරලා, ලියලා දෙන්න කෝ? සභාව විසුරුවන්න කියලා ලියලා දෙන්න කෝ? කථාව ඉවර නේ? ඇයි බැරි? ඡන්දයට යන්න භයද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා නේ භය. ඡන්දය තියන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මන්ත්‍රීකම නැති වෙයි කියලා භයද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අභියෝග කරනවා. තමුන්නාන්සේලාට බහුතරය තියෙනවා. මේ සභාව විසුරුවලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පළාත් පාලන ඡන්දය තියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම අත්සන් කරලා දෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපි පත් වෙලා තිබෙන්නේ වසර 05 කට. අපි ඕනෑම වෙලාවක ලැහැස්තියි ඡන්දයකට යන්න. නමුත් ජනතාව පාරට වැටිලා. මේ පළාත් සභා විසුරුවන්න ඉස්සෙල්ලා පළාත් පාලන ඡන්දය තියන්න කියන්න. අපි ලැහැස්තියි. මේ කාලකණ්ණි වැඩ බැරි ආණ්ඩුවට ඡන්දය තියාගන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

ජනතාවගේ පරමාධිපත්‍ය කනවා. අපි ඕනෑම මොහොතක ඡන්දයකට කැමැතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ අය බොරුවට කෙබර ගානවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පිස්සු හැදිලා වාගේ කථා කරන්න එපා. පළාත් පාලන ඡන්දය තියන්න. රනිල් මහත්තයාට ගිහිල්ලා කියන්න පළාත් පාලන ඡන්දය තියන්න කියලා. නිකන් පිස්සෙක් වාගේ කෑගහන්න එපා. අපි ද ආණ්ඩු කරන්නේ? තමුන්නාන්සේලා නේ ආණ්ඩු කරන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අත්සන් කරලා දෙන්න කෝ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නිකන් රඟපාන්න එපා. හරකෙක් වෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අභියෝගය භාර ගන්න. මෝඩ කථා කියන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ වෙලාවේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ කථාව නිසයි මේ කථාව කියන්න සිද්ධ වෙන්නෙත්. මේ සභාව නියෝජනය කරන වත්තල මැතිවරණ කොට්ඨාශයේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් ඉන්නවා. මමත්, අපේ රන්දීර් රොද්‍රිගෝ මන්ත්‍රීතුමාත්, ජානක සූරියබණ්ඩාර මන්ත්‍රීතුමාත්. දැන් මීතොටමුල්ලේ කුණු කන්ද පිළිබඳව මෙතැන කථාවක් ඇති වුණා. එතකොට ඒක ඒකලට ගෙනියන්න ගිය වෙලාවේ විරෝධතාවය මතු වෙලා තාවකාලිකව නතර කරනවා කියලාත් කියනවා. දැන් මේ මොහොත වනකොට ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවේ අනුමැතිය යටතේ වත්තල ලක්ස්ප්‍රේ කර්මාන්ත ශාලාව, දරුවන්ට බොන්න දෙන්න පිටි හදන කර්මාන්ත ශාලාව අයිනෙන් ගිහිල්ලා එතැනින් මීටර් තුන් හාරසියයක් එහා පැත්තෙන් මේ කුණු සමග පස් බානවා. මම දන්නේ නැහැ, කාගේ නීතියකටද මේ බාන්නේ කියලා. හැබැයි මේ පිළිබඳව දැන් විරෝධතාවයක් මතු වුණා. මම කියන්නේ මෙහෙමයි. මේකේ වගකීමෙන් ප්‍රධාන ඇමැතිතුමාට බැහැර වෙන්න බැහැ. අපි දැක්කා, ප්‍රධාන ඇමැතිතුමා බ්‍රිතාන්‍ය සමාගමක් ගෙනැල්ලා මේ කුණු ගොඩ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මට න්‍යාය පත්‍රයට යන්න ඕනෑ. මේ එක එක පැහැදිලි කිරීම් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මට විනාඩියක් දෙන්න. වැදගත් ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විනාඩි 20 ක් විතර කාලය නාස්ති කළා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ කුණු ගොඩ මෙතැනින් අයින් කිරීම පිළිබඳව ගිවිසුමක් අත්සන් කළා කියලා ජනමාධ්‍යයේත් ගියා. නමුත් අද වනකොට පහත් බිම් මණ්ඩලයෙන් - ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවෙන් තමයි ගෙනැල්ලා දාන්නේ. ඒ අයට අයිති අක්කර 40 ක ඉඩමක් තිබෙනවා, මුතුරාජවෙල. එතැනට ගෙනියන්නේ නැතුව මේ පෞද්ගලික ඉඩම්වලට ගෙනැල්ලා බානවා. මිනිස්සු ඉන්න තැන. එතකොට මේකේ වගකීමෙන් ප්‍රධාන ඇමැතිතුමාට ගැලවෙන්න බැහැ. මොකද, කොළඹ කුණුයි මේ ගේන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමන්ලාගේ අගමැතිතුමා නායකත්වය දෙන ආර්ථික කමිටුවේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ අධිකාරිය කවුරු හරි පටන් ගන්න ඕනෑ. කාටද මේකේ අයිතිය තිබෙන්නේ? කාටද මේකේ බලය තිබෙන්නේ කියලා ඉවර වෙලා - ප්‍රධාන ඇමැතිතුමා අනිවාර්යෙන්ම මේකට සහයෝගය දක්වන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, අපට සම්බන්ධයක් නැහැ. ඒකට වගකියන්න ඕනෑ මේ අය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහ නගර සභාවේ කුණු මේ ගෙන එන්නේ. කොළඹ මහ නගර සභාව අයිති මේ බස්නාහිර පළාත් සභාවට. බස්නාහිර පළාත් සභාව යටතේ තමයි කොළඹ මහ නගර සභාව තිබෙන්නේ. ගෙනැල්ලා දාන්නේ, වත්තල ප්‍රාදේශීය සභාවට. එතකොට ප්‍රධාන ඇමැතිතුමා වගකීමෙන් මිදෙන්නේ කොහොමද? කරුණාකරලා මේ සඳහා මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ සභාවේ කැගහන්න ඕනෑ නැහැ. වීරයෝ නම් ගිහිල්ලා නායකතුමාට කියන්න තිබුණා නේ? ගිහිල්ලා කියන්න නායකතුමාට.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඔබතුමා කම්පැණියකට කථා කරලා ගෙනැල්ලා වැඩ සටහනක් ක්‍රියාත්මක කෙරුවා. එහෙම නම් ඒකට මොකද වුණේ කියලා කියන්න?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔයගොල්ලො උදුර ගත්තේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ සභාවට කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔයගොල්ලන්ගේ ආර්ථික කමිටුවෙන් ඒක උදුර ගත්තේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි උදුර ගත්තේ නැහැ. අපි ඉන්නේ බස්නාහිර පළාත් සභාවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පායලී ඇමැතිතුමයි මෙතුමන්ලයි කරපු සාකච්ඡාව අපි දන්නවා. මේ බොරුවට නිකන් - මේ කුණු අපට අයිති නැහැ. හැබැයි පාර හදද්දී අත්සන ඕනෑ. පාර හදන්න මගෙන් අත්සන ඕනෑ. කුණුවලට. මම ඒවාට නැහැ. මොකක්ද මේ දෙබිඩි පිළිවෙත?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් පළාත් පාලන ආයතන අගමැතිතුමාට දෙන්න. ඉවරයි නේ? කුණුවලට මම නැහැ. පාර හදද්දී මම ඉන්නවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඡන්දය තියන්න කෝ? ප්‍රශ්නය ඉවරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉල්ලා අස් වෙලා, ඡන්දය තියමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඡන්දය තිබ්බොත් තාත්තට වුණු දේ පුතාට වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා බයයි. තමුන්නාන්සේලා අනෙක් අයව බිල්ලට දීලා -

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ඡන්දය තියලා කුණු ප්‍රශ්නය විසඳන්න බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ කාලකණ්ණි යහපාලන ආණ්ඩුව ඡන්දයට භයයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉල්ලලා අස් වෙලා ඡන්දයට යන්. පළාත් සභාවෙන් පටන් ගමු කෝ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ආ...36(1) යටතේ තව එකක් මෙහේ තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි,

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාට දුන්නාම, එතුමා අත්සන් කරලා මහ ඇමැතිතුමාට දෙනවා. එහෙමයි යන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමාට. ඔව්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, පානදුර බාලිකා විද්‍යාලයේ ගුරුවරුන් මාරු කිරීම සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඇමැතිතුමා නැහැ නේ? ඔබතුමා ඕක උදේ අහන්න එපැයි. ආ. .. ඇමැතිතුමා ඉන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු ඇමැතිතුමා ඉන්නවා. පානදුර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කියලා මට නම් ඕක -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

36(1) යටතේ මට අද උදේ ඇති වුණු ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය කියන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පානදුර බාලිකාවේ ජපන් උගන්වන ගුරුවරියක් සිටියා. එතුමිය අනුප්‍රාප්තිකයෙක් රහිතව අමාත්‍යාංශය මගින් ජාතික පාසලකට නිදහස් කරලා තිබෙනවා. ඒ පිළිබඳව මම අපේ ගරු අමාත්‍යතුමාව දැනට සති දෙකකට, තුනකට උඩ දී දැනුවත් කළා. ඇමැතිතුමා ඒක ගත්තා. ඒ ගමන අද උදේ මම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඕක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. මේ වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද? මේක විහිළුවක් නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද උදේ මම එනවිට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕකට ඉඩ දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විහිළු නොකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද උදේ මම එන විට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද උදේ මම එන විට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ නායකයාගෙන් වෙලාවක් ඉල්ලගෙන කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මාව වට කර ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ.... ඒකයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කට වහගෙන ඉන්න කියන්න කෝ. පළාත් සභාවට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ඇවිල්ලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක එක අයට ඕනෑ විධියට වරප්‍රසාද ගන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මම ඒක බලාගන්නම්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වරප්‍රසාද ප්‍රශ්නයක් තීන්දු කරන්නේ සභාපතිතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක 36(1) නොවෙයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට දෙමව්පියන් වට කරගෙන.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එවන්න එපා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අපට කියලා තිබෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපි අයින් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එහෙම ගරු මන්ත්‍රීවරුන්ට අපහාස කරන්න එපා. එහෙම හොඳ නැහැ. ඒක මම හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපට කථා කරන්න දෙන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති උල්ලංඝනය කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ වැදගත් දෙයක් කථා කරන කොට, දරුවෝ වෙනුවෙන් කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන් දන්නේ කොහෙද? වරප්‍රසාද ප්‍රශ්නයක්ද? නැද්ද? කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද උදේ මම එන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හරි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම සභාවට එනකොට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු වරප්‍රසාද ප්‍රශ්න ගේනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාන්තාවෝ ඔබතුමාව වට කර ගත්තා. මොනවා හරි කරදරයක් වුණාද? අඩුවක් වුණේ නැහැ නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දෙමව්පියන් මාව වට කර ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මොකක්වත් අඩුවක් වුණේ නැහැ නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද පළාත් සභාවට එන කොට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අපටත් ඔය වරප්‍රසාදය දෙන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ජපන් ගුරුවරියත් සිටියාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කරදරයක් කරලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපටත් ඔහොම වටේ ගිහිල්ලා එන්න දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නම්. දෙන්නම්. අනේ! ඔබතුමා කරදරයක්. ගම්පහ DDC එක වාගේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කරදයක් නොවෙයි. ඔබතුමාට ඕනෑ ඕනෑ වෙලාවට රීති උල්ලංඝනය කරන්න දෙන්න බැහැ. ඔබතුමා සභාපති

වුණයි කියලා අපට එක නීතියකුත්, එතුමාට එක නීතියකුත් බැහැ. පොහොට්ටුවකට එක නීතියකුත්, අපට නීතියකුත් බැහැ. නීති දෙකක් බැහැ. පොහොට්ටුවට එක නීතියකුත්, අපට එක නීතියකුත් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොහොට්ටු නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාපතිතුමා ගැන අනුකම්පා කරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා රීති උල්ලංඝනය කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න කෝ. මම කියන දේ අහගන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා හැමදාම මේක කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකෙන් වෙන්නේ මන්ත්‍රීවරුන්ගේ කාලය නාස්ති කිරීමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොහොට්ටුවේ අය නැගිට්ටාම ඕනෑ දෙයක් කථා කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑ තරම් වල්පල් දොඩවන්න දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ වැඩේ කරන්න දෙන්න බැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නේ දැන් දිගටම කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නොවෙයි. රීති අනුව ඔබතුමා හරියට සභාව මෙහෙයවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා සභාව විහිළුවකට ගන්නවා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාව විහිළුවකට ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න කෝ. මටත් කථා කරන්න දෙන්න කෝ. මම මූලාසනය නේ ඉතින්.

[ගරු සභාපතිතුමා]

මේ වාගේ අනවශ්‍ය කෑ කෝ ගැසීම්වලින් 36(1) කියලා ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් - මේ සභාවට ආදරය කරන මන්ත්‍රීවරු ඉන්නවා. සභාවට යෝජනා ගෙනෙන මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. ඒ නිසා එම මන්ත්‍රීවරුන්ගේ අවස්ථාව අහිමි කරන්න එපා. මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, 36(1) කියලා වෙන වෙන ප්‍රශ්න කථා කරන්න එපා. 36(1) කියලා ඉස්කෝල ප්‍රශ්න, ගුරුවරු මාරු කරපුවා ඒවා නොවෙයි. ඔබතුමාට කරදරයක් වුණා නම්, මට ඒ කරදරය කියන්න. එච්චරයි. ඒ කිව්වත් ඉතින් මට කරන්න පුළුවන් දෙයක් නැහැ. 36(1) කිව්වාට. ඒත් ඉතින් ඒක කියන්නත් එපැයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම කිව්වේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. තත්ත්පරයක් ඉන්න කෝ. අනික් එක මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාව අපේ රටේ තිබෙන උත්තරීතර පළාත් සභාවක්. බස්නාහිර පළාත් සභාව. දැන් මට පේනවා, ගම්පහ DDC රැස්වීමත් මේ වාගේ තමයි. ඔබතුමන්ලා දකිනවා ඇති ගම්පහ DDC රැස්වීම. ඒ වාගේ තත්ත්වයට මෙය පත් වෙලා තිබෙන්නේ. මම ඔබතුමාගෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ ගරු සභාව ඒ තත්ත්වයට පත් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නේ මෙතැන දැන් වැඩියෙන්ම කෑ ගැහුවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ගරු මන්ත්‍රීතුමා නේ 36(1) කියලා වල්පල් දොඩවන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මම එතුමාට ඒක කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ද දුන්නේ? නැහැ නේ? ඔබතුමා නේ අවසරය දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නේ මේ කාලය අරගෙන වෙන වෙන විකාර කථා කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විකාර නොවෙයි. ඔබතුමාට මේ පොහොට්ටුවට එක නීතියකුයි, අනික් අයට එක නීතියකුයි ගෙනියන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැහැ. එහෙම වෙන්නේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා කාලයට අසාධාරණයක් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නේ අසාධාරණය කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අසාධාරණය කරන්නේ නැහැ. බලන්න. විනාඩි 35 ක් ගියා. ඔබතුමායි, අනන්ද හරිශ්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමායි, මෙතුමායි විනාඩි 35 ක් ගත්තා. ඒක අනික් ගරු මන්ත්‍රීවරුන්ට කරන අසාධාරණයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, මේක කොහොමද 36(1) යටතේ ගත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන්වත් නවත්වන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ කොහොමද විනාඩි ගණනක් කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි මම කිව්වේ, ගම්පහ DDC එකත් ඔය වාගේ තමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ කොහොමද කථා කළේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඔබතුමා ආවොත් ඔහොම කරදරයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ...තව එක්කෙනෙක් ආවා. පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ආපුවාම තමුන්නාන්සේලාට ඕනෑ ඕනෑ විධියට කරගන්න බැහැ නේ? ඒක නේ තිබෙන ප්‍රශ්නය. පොහොට්ටුවට ඕනෑ විධියට නටන්න මෙතැන ඉඩ දෙන්න බැහැ. ඒක මතක තියා ගන්න. මේක පොහොට්ටුව නොවෙයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

පොහොට්ටුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොහොට්ටුව පිපුණාම එන්න ඕවා කරන්න. දැන් එන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

පොහොට්ටු ගේන්නත් පුළුවන්.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වල්පල්. වටෙන් ගිහින් එන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හරි. මම පැහැදිලි කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දැන් කාන්තාවන්ගෙන් අඩුවක් වුණේ නැහැ නේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නැහැ. මට අඩුවක් වුණේ නැහැ. ඔබතුමා දන්නවා, මම හැමදාම වෙලාවට සභාවට සහභාගි වෙන මන්ත්‍රිවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද මට මට ප්‍රමාද වුණා. අද ප්‍රමාද වෙන්න හේතුව තමයි බාලිකාව ළඟින් යන කොට දෙමව්පියන් ටික මාව වට කර ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පයින්ද ගියේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මාව එතැනදී වට කර ගත්තා. ඒ වට කර ගත්තේ මම ප්‍රකාශයක් කළාට පස්සේ, ගරු ඇමැතිතුමා දීපු පොරොන්දුවත් එක්ක.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කට්ටිය හිටිය නිසා නොවෙයි. ජපන් ගුරුවරිය නිසා බැස්සා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ පාසල්වල ගුරුවරුන් මාරු කිරීමේදී අනුප්‍රාප්තිකයෙක් නැතිව ගුරුවරුන් නිදහස් කිරීම නිසා තමයි ඒ අපහසුතාවයට මම පත් වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට ගරු ඇමැතිතුමා ඉන්නවා නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මින් ඉදිරියට අපව අපහසුතාවට පත් නොවෙන්න - ඒ දරුවන්ට ගුරුවරයෙක් නැතිව මාස ගණනක් තිස්සේ ඉගෙන ගන්න විධියක් නැතිව ඉන්නවා. ඉතින් ඒ නිසා ඒක කඩිනමින් විසඳන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා මම පොහොට්ටු නොවෙයි. මටවත් විනාඩියක් ඉඩ දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, 36(1) නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන වෙන බැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අර වාගේ අයිතියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වාගේ බැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මෙතැනට, අතනට මෙතැනට තිබුණා වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒ වාගේ අයිතියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා කරන්න බැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, අනුන්ගේ ඡන්ද ගැන කථා කරන්නේ, අර අනුන්ගේ සල්ලිවලින් බූරුවා ගහන්නා වාගේ. දිනුවත් එකයි. පැරදුණත් එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව විහිළුවක් වෙලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

දිනුවත් එකයි. පැරදුණත් එකයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මඟී ප්‍රවාහන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාතේ මඟී ප්‍රවාහන අධිකාරියේ මූලික තනතුරු දෙකක් සම්බන්ධව. නීතියෙන් පිට වැඩ බලන්න පත් කරලා තිබෙනවා. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරත්, ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා ඒක 36(1) ට අදාළ වෙන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නියෝජ්‍ය -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අහගෙන ඉන්න. නැවත මුල ඉඳලා කියන්නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

හිටපු ඇමැති කෙනෙක් වෙලා ඉඳලත් නීති දන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාත් සභාවේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඇමැති කෙනෙක් වෙලත් කනගාටුයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කලින් පොඩ්ඩක් මට ඇහුම්කන් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා කථා කරන්නේ හරියට සුදන වාගේ. ඊයේ පුතාගේ මඟුල් ගේ තිබුණා. ටිකක් සද්ද නැතිව ඉන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගණපූරණය නැහැ.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගණපූරණය නොමැති බව පෙනෙන නිසා සීනුව නාද කරන්න.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා ගණපූරණය නැහැ. ඒ නිසා වාඩි වෙන්න. ඔබතුමා සභාව තුළ දැන් කථා කරන ඒවා සේරම අහිමිය. ඒ නිසා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ඒ අනුව සභාවේ ගණපූරණය සම්පූර්ණ වන තෙක් සභාව තාවකාලිකව කල් තබනවා.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුවනාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් රැස්වීම තාවකාලකිව අත් සිටුවන ලදින් පූ.භා. 11.08 ට යළිත් රැස් විය.***
*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, It found no quorum Hon. Presiding Member, suspended the sitting and it resumed at 11.08 a.m.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමටයි කටයුතු කරමින් තිබෙන්නේ. මේ අවස්ථාවේදී තිබෙන්නේ, ජගත් කුමාර සුමිත්‍රාරච්චි ගරු මන්ත්‍රීතුමාට කරුණු පැහැදිලි කිරීම.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, රීති අංක 12 යටතේ තවමත් මේ සභාවේ ගණපූරණය සම්පූර්ණ නැහැ. ඔබතුමා ගණපූර්ණය කැඳවන්න සීනුව නාද කරලා විනාඩි 05 කට පස්සෙ රීති අංක 12 අනුව නැවත සභාවට එන්න ඕනෑ. අවස්ථා දෙකක් සීනුව නාද කරලත් ඊට පස්සෙත් විනාඩි 07 ක් ගිහිල්ලා තමයි ඔබතුමා සභාවට ආවේ. ඒ නිසා මේ වේලාවේත් මේ සභාවේ ගණපූරණය නැහැ. ඒ අනුව 12 වන රීතිය අනුව එක්කේ 10(5) වගන්තියට අනුව සභාව නැවත ගණපූරණය සකස් වන තෙක් කල් දාන්න ඕනෑ. නැත්නම් ඊළඟ දිනයට කල් දාන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

යළිත් වරක් සීනුව නාද කරලා ගණපූරණය විමසන්න. ගණපූරණය යළිත් ස්ථාපිත නොවුණොත් කනගාටුවෙන් වුණත් සභාව කල් තබන්න වෙන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති විය.***
*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, a Quorum being present.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ගණපූරණය සම්පූර්ණයි. සභාවේ කටයුතු යළිත් ආරම්භ කිරීමටයි සූදානම් වන්නේ. ඒ අනුව පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ජගත් කුමාර සුමිත්‍රාරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට කාලය විනාඩි 05 යි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම මේ රටේ ජනතාව මේ ආණ්ඩුව බලයට පත් කිරීමේ දී දුන්නු පොරොන්දු රාශියක් බිඳ වැටුණු බව අපි කවුරුත් දන්නවා. ඒ වාගේම මේ රටේ ජනතාවට ලබා දුන්නු පොරොන්දු ඉෂ්ට සිද්ධ කරන්න බැරි වුණා වාගේම තවදුරටත් ආණ්ඩුව නොකිව්ව රටට හානිදායක බොහෝ දේවල් සිද්ධ වෙමිනුත් තිබෙනවා. ඒ අතර මේ වෙලාවේ මම මේ කථා බහ කරන්න බලාපොරොත්තු වන්නේ, මේ රටේ අඩු ආදායම් ලබන අයගේ සහනාධාර අහිමි කිරීමේ තීන්දුවකුත් වර්තමාන රජය අරගෙන තිබීම සම්බන්ධවයි. පසුගිය දිනවල ආණ්ඩුව එන කොට සෑම සහනයක්ම වැඩි කරනවා කියලා කිව්වේ. ආරම්භයේදීම ගොවියාගේ පොහොර සහනාධාරය කප්පාදු වුණා. රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුප නැති වුණා. ඒ වාගේම දරුවාගේ පාසල් නිල ඇඳුම නැති වුණා.

විශේෂයෙන් ලක්ෂ 15 කට ආසන්න සමෘද්ධිලාභී ජනතාවගේ සහනාධාර 200% කින් වැඩි කරනවා කියලා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. මම දැක්කා. ඊයේ පෙරෙයිදා රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමාත් කියනවා. අපි 200% කින් වැඩි කළා කියලා. අපි අභියෝග කරනවා. පුළුවන්නම් ඔප්පු කරලා පෙන්වන්න. එහෙම 200% කින් ලංකාවේ කොහෙවත් වැඩි වෙලා නැහැ. හැබැයි මම බොහොම පැහැදිලිව කියනවා. පසුගිය දිනවල සමෘද්ධි අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව සවිබල ගන්වනවා කියලා. සවිබල ගැන්වීමේ සැබෑ අර්ථ, යහපාලනයේ සැබෑ අර්ථය නැති කරලා වාගේ සවිබල ගැන්වීමේ සැබෑ අර්ථයත් අද නැති කරලා. ඒ අනුව සවිබල ගැන්වීම කියලා වර්ෂයකට 10% බැගින් වර්ෂ 4 කදී 40% ක් සහනාධාර ලබන අයගේ සහනාධාර ඉවත් කිරීමේ සූදානමක් තිබෙනවා. ඒ අනුව අඩුම ගණනේ ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක් දැනට ලබන සහනාධාර ලාභීන් 2020 වන විට අඩු කිරීමේ යෝජනාවක් තිබෙනවා. ඒ හරහා මේ රටේ හැම ගමකම සමෘද්ධි ව්‍යාපාරයේ සහනාධාර ලබන - මේ රටේ සහනාධාර අද ලබන්නේ විශේෂයෙන්ම අඩු ආදායම් යැයි සැලකෙන, ඒ වාගේම ආර්ථික වශයෙන් අපහසුතාවයන් තිබෙන අයයි ඒ අයට තමයි සහනාධාරයක් රජය ලබා දෙන්නේ. ඒ සහනාධාර ලබන අය අතර ඉතා සුළු පිරිසක් යම් විධියකට වෙනස් තත්ත්වයන් මත ඉන්න පුළුවන්. නුසුදුසුකම් මත ඉන්න පුළුවන්. නමුත් ඒ අය පිළිබඳව සොයා බැලුවාම බහුතරය සහනාධාර ලැබිය යුතු මට්ටමේ ඉන්නවා. මේ රජය කිව්වේ තවත් වැඩි කරලා දෙනවා කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2015 අයවැය ඉදිරිපත් කරන කොට රුපියල් 250/- තිබුණු කෙනාගේ සහනාධාරය රුපියල් 1000/- ට වැඩි කළා. රුපියල් 300, 400 තිබ්පු අයගේ රුපියල් 3000/- දක්වා වැඩි කළා. මේක තමයි මේ ආණ්ඩුව කිව්වේ රුපියල් 3000, සියයට දෙසීයකින් - සියයට සියයකින් වැඩි කළොත් 6000 ක් වෙන්න ඕනෑ. සියයට දෙසීයකින් නම් 9000 ක් වෙන්න ඕනෑ. හැබැයි, එහෙම සිද්ධ කළේ නැහැ. එහෙම සිදු නොකර මේ ආණ්ඩුව අද ලැහැස්ති වෙනවා සහනාධාර ලබන අයගේ සංඛ්‍යාව අඩු කිරීමට. ඒ සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, ඔවුන් සැබෑ ලෙස ආර්ථික වශයෙන් ශක්තිමත් කරලා ඔවුන්ට හොඳ අනාගතයක් නිර්මාණය කරනවා නම් අපට කිසිම ගැටලුවක් නැහැ. හැබැයි සූදානම් වන්නේ - මේ වර්ෂය දිළිඳුකම පිටු දැකීමේ වර්ෂය කියලා ජනාධිපතිතුමාත් කියනවා අපි දැක්කා. හැබැයි, දිළිඳුකම අඩු කරන්නේ දුප්පතුන්ගේ මුද්දරයට තට්ටු කරලා, දුප්පතා කබලෙන් ලිපට වට්ටලා ද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව අපි අපේ අප්‍රසාදය, විරෝධය පැහැදිලිව ප්‍රකාශ කරනවා.

අද රට පුරාම, ඊයේ මාතලේ නගරයේ, පසුගිය 22 වැනිදා කොළඹ නගරයේ, ඒ වාගේම මාතර, ගම්පහ ආදී දිස්ත්‍රික්ක ගණනාවක සමෘද්ධි ලබන ජනතාව විසින්ම විරෝධතා තිබුණා. ඒ වාගේම ඔවුන් වෙනුවෙන් මැදිහත් වෙලා ඒ සඳහා අපි නායකත්වයක් සැපයුවා. ඒ වාගේම හෙට අනිද්දා වන විට මුළු රටේම මේ විරෝධතා ගොනු පවත්වමින් තිබෙනවා. ඒ නිසා වර්තමාන රජයේ වගකීමක් වෙනවා. මේ අහිංසක මිනිස්සු වෙනුවෙන් හඬක් නඟන්න කවුරුවත් නැහැ. ඒ මිනිස්සුන්ට සහන අහිමි වන කොට, ඔවුන්ගේ ආධාර නැතිවන කොට, කථා කරන්න - ඔවුන්ගේ ඡන්ද ගන්න ඕනෑ තරම් සිටියා වුණත්, ඒ සහන නැති වෙන කොට කථා කරන්න ඉන්න අය අඩුයි. ඒ නිසා අපි විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ අවධානය යොමු කරලා විෂයය භාර අමාත්‍යවරයාට, ජනාධිපතිතුමාට මේ පිළිබඳව යොමු කරන්නය කියලා අපි ඉල්ලනවා. මේ සහනාධාර කප්පාදු කරන්න ගෙනාපු තීන්දුව. ඒ වාගේම පසුගිය රජය නිවාස

[ගරු ජගත් කුමාර]

ආධාරයක් විධියට රුපියල් 10,000/- ක් ලබා දෙන්න තීන්දුත් කරලා ඒකේ පළමුවැනි කොටස විධියට රුපියල් 2500/- ක ආධාරයක් දුන්නා. රුපියල් 2500/- ක් කියන්නේ සොච්චමක්. සිමෙන්ති කොට්ට දෙකකට වඩා ගන්න බැහැ. ඒ වාගේම සීට් එකකට වඩා ගන්න බැහැ. එහෙම නැත්නම් සුළු අලුත්වැඩියාවක් විතරයි කරන්න පුළුවන්. හැබැයි ඒක මිනිස්සු ඉල්ලලාවත් නොවෙයි. රජය විසින් ඔවුන්ගේ අපහසුතා සඳහා රුපියල් 10,000/- ක් දෙන්න. නමුත් පුංචි ගණනක් දුන්නා. ලක්ෂ 15 කට දෙන කොට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීමේ කාලය අවසන් වී තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්ත්පර කිහිපයක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. තත්ත්පර 30 ක් දෙන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

විශේෂයෙන්ම මේ ජනතාව නොඉල්ලපු ආධාරයක් ලබා දීලා භාණ්ඩාගාරයෙන් ඒ මුදල් ප්‍රතිපූර්ණය කරලා සමෘද්ධි බැංකුව වට්ටන්නේ නැතිව කටයුතු කරනවා කියලා පොරොන්දු වුණා. එතකොට මොනම හරි රජයක්, තිබුණු රජයක් පොරොන්දු වුණා නම් භාණ්ඩාගාරයෙන් සල්ලි දෙනවා කියලා ඒක ලබා දෙන්න ඕනෑ. එස්.බී. දිසානායක ඇමැතිවරයා කැබිනට් පත්‍රිකා කිහිපයක් දැම්මා. ඒ මුදල් ලබා දෙන්න කියලා. නමුත් රවී කරුණානායක ඇමැතිතුමා මේක ලබා දෙන්නේ නැහැයි කියලා අවසානයේ දැන් සමෘද්ධි ලාභීන්ගෙන් මේ රුපියල් 2500/- ය - ජීවත් වෙන්න දෙන සමෘද්ධි මුද්දරයෙන් රුපියල් 2500/- ක් මාස දෙකකින් තුනකින් අය කරනවා. එතකොට මේ මිනිස්සුන්ට එදා වෙලා ජීවත් වෙන්න තිබුණු ආධාරය තමයි. හැම ආණ්ඩුවක්ම මේ මිනිස්සුන්ව තමන්ගේ උදව්වට අරගෙන තිබෙනවා. සහාය අරගෙන තිබෙනවා. හැබැයි අද දුප්පතා කබලෙන් ලිපට වට්ටන තැනට නැවත නැවත මේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා රජය මේ සම්බන්ධව වහාම මැදිහත් වෙලා සාධාරණය ඉෂ්ට කරන්නය කියලා ඉල්ලනවා. එස්.බී. දිසානායක ඇමැතිතුමා කියලා තිබුණා, මේවා අය කරන්න ඕනෑ. මේවා බැසිල් ඇමැතිතුමාගේ සල්ලි නොවෙයි. ඇත්ත. එතුමාගේ සල්ලි නොවෙයි. මේවා එස්.බී. දිසානායකගේ සල්ලිත් නොවෙයි. මේක රජයෙන් භාණ්ඩාගාරයට ලබා දීලා, ප්‍රතිපූර්ණය කරලා සමෘද්ධි බැංකු ශක්තිමත් කරන ගමන් දුප්පතුන්ට දුන්න දෙයක්. කිසිම රජයක් ආධාරයක් දුන්නාම අය කරලා නැහැ. හැබැයි මේ ආණ්ඩුව පුදුම ආණ්ඩුවක්. ආධාරයක් දුන්නාම, රුපියල් 2500/- ක සොච්චම් දීමනාවක් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කෝටි ගණන් බැඳුම්කර හරහා වංචා කරපු හොරු සිටිද්දී, ඒවා අය කරගන්න බැරුව තිබෙද්දී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව කරන දේ සම්බන්ධව අපි කියන්නේ, මෙහෙම වුණොත් දෙවියෝ කෝප වෙනවා. මේ ආණ්ඩුවට විරුද්ධව ජනතාව විතරක් නොවෙයි. දෙවියනුත් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. මීළඟට ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සඳහා මැදිහත් වෙන්නය කියලා රජයෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බේරුවල ප්‍රදේශයේ ජලයට ලුණු මිශ්‍රවීම දිගින් දිගටම සිදුවීම පිළිබඳව. ඔබතුමාට කාලය විනාඩි 05 යි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ දිගින් දිගටම අපි පසුගිය දවසක කථා කළා. පානීය ජලයට ලුණු එකතුවීම පිළිබඳව මම හිතන්නේ ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාව විශාල කරදර රාශියකට මුහුණපාලා තිබෙනවා. මම හිතන්නේ, ඒකට අවශ්‍ය පියවර ලෙස බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් සමඟ අපි සාකච්ඡා කරලා අදාළ පළාත් පාලන ආයතනවලට ක්‍රියාත්මක කරන්න ලබා දුන්නත් ජල සම්පාදනයට ක්‍රියාත්මක කරන්න ලබා දුන්නත් ප්‍රාදේශීය ලේකම් මට්ටමින් මේවා හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සමහර අවස්ථාවලදී වතුර ගෙනත් දානවා. සමහර අවස්ථාවලදී වතුර ගෙනත් දාන්නේ නැහැ. සමහරු තමන්ගේ පෞද්ගලික ස්ථානවලට තමයි මේ ටැංකි බාලා තිබෙන්නේ. සමහර අත්‍යවශ්‍ය ස්ථානවලට මේවා යොදන්න කටයුතු කරලා නැහැ. ඒ වාගේම තමයි මේ පානීය ජලයට ලුණු මිශ්‍රවීම පිළිබඳව දිගින් දිගට කථා කළත් ඊළඟ අවුරුද්දෙත් මේ ප්‍රශ්නය එනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට හරි වැඩපිළිවෙළක් නැහැ. ඔබතුමාගේ මාර්ගයෙන් කියනවා. මේ සම්බන්ධයෙන් රජය මැදිහත් වෙලා මම හිතන්නේ, කෙත්හේනේ තිබෙන වතුර පොම්පය හොරණ දක්වා අරගෙන ගිහිල්ලා කඩිනමින් මෙයට පිළිතුරු ලබා දෙන්න ඕනෑ.

මේ වන විට වතුර ප්‍රශ්නය විතරක් නොවෙයි. ජනතාවට මේකෙන් සිද්ධ වෙලා තිබෙන්නේ. තමන්ගේ ගෙදර දොරේ තිබෙන ඒ බාත්රූම්වල, එහෙම නැත්නම් අවශ්‍ය කරන ජලනලවල පද්ධතිවල තිබෙන බට ඒවායේ තිබෙන වතුර කරාම සියල්ල විනාශ වෙලා තිබෙනවා. වටිනා කියන දෙයක් ගත්තොත්, රුපියල් 5000/- කට ගෙනැල්ලා ජල කරාමයක් සවි කළා නම්, අද ඒක ලුණුත් එක්ක මිශ්‍ර වුණාට පස්සේ විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම යන්ත්‍ර සූත්‍ර විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම සෝදන රෙදි සම්පූර්ණයෙන්ම කහපාට වෙලා ඒවා විනාශ වෙලා තිබෙනවා. මම හිතන්නේ, මේ වනවිට ජනතාවට කෝටි ගණන්වලින් පාඩු වෙලා තිබෙනවා. මේවාට පිළිතුරක් තිබෙන්න ඕනෑ. නමුත් ජලසම්පාදන ආයතනයත් දිගින් දිගටම - අවුරුදු ගණනක් තිස්සේ මේ ප්‍රශ්නය ක්‍රියාත්මක වෙනවා. හැබැයි හැමදාම මෙයට විසඳුමක් නැහැ. ඒ නිසා මෙයට තිරසාර විසඳුමක් අවශ්‍ය වෙනවා. හැමදාම අපි



මෙතැන ඇවිල්ලා කථා කරනවා. මම හිතන්නේ, අපි පළාත් සභාවට එන්න පෙරත් මේ ප්‍රශ්නය මෙතැන ඉන්න දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීවරු කථා කරලා තිබෙනවා. අද ගෙදර තිබෙන වාහනය හේදුවොත් ඒ වාහනයත් දිරනවා. ඒකත් ජනතාවට පාඩුවක්. ඒ නිසා ගෙදර තිබෙන අනිකුත් දේවල් - අපි හිතමු අයන් එකක් ගත්තොත්, අයන් එකට වතුර දානවා නම්, වතුර දාලා ඒක ස්ප්‍රේ කරනවා නම් ඒකත් විනාශ වෙලා යනවා. ඒ නිසා මම හිතන්නේ මේ ප්‍රශ්නය අවම කරන්න කටයුතු කරන්න, ඔබතුමා මාර්ගයෙන් අවශ්‍ය කරන බලධාරීන් මෙයට අවශ්‍ය කරන පිළිතුර ලබන අවුරුද්ද වන විට ලබා දෙන්නය කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ. මොකද ප්‍රදේශයේ ජනතාව අපට එන්න එන්න පැමිණිලි ගෙනත් දෙනවා. ඒ අවශ්‍ය දේවල් කථා කරන්න කියනවා. නමුත් මේ ජලය බෙදා දීමේදී, අපේ බේරුවල ඉන්න සහෝදර ගරු මන්ත්‍රීතුමා දැන් ආවා. එතුමාත් දන්නවා. අවශ්‍ය කරන තැන්වලට මේ වතුර ටික බෙදෙන්නේ නැහැ. තමන්ගේ පෞද්ගලික හිතවතුන්ට වතුර ටික දෙන්න මේ ආයතන කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඔබතුමා මාර්ගයෙන් මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි. මම හිතනවා ඒක බලධාරීන්ට යොමු වෙයි කියලා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඇත්ත වරප්‍රසාද ප්‍රශ්නයක් වෙන්න ඕනෑ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපි බොරුවට නැඟිටින්නේ නැහැ නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ රැස්වීමක් කැඳවලා තිබුණා. මම ඒක අපේ ගරු මහ ඇමැතිතුමාටත්

[ගරු ශිරන්ත අමරසේකර]

දැනුම් දුන්නා. කැළි කසළ ප්‍රශ්නය ගැන. ෆයිසර් මුස්තාපා ගරු ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා අමාත්‍යාංයෙන් කැඳවලා තිබුණේ. ඒකට සියලුම පළාත් පාලන දෙපාර්තමේන්තුවට, පළාත් සභාවට අයිති ප්‍රධාන නිලධාරීන් කැඳවලා තිබුණා. මම හිතන්නේ ඒ පිළිබඳව දැනුම් දීමක් කරලා තිබුණෙත් නැහැ. මගේ වරප්‍රසාද ප්‍රශ්නය වන්නේ මෙතැන කොළඹ තිබෙන කුණු ටික ජා-ඇළට දාන්න හදනවා. එතැනදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේලයින් මුදලාලිට ජා-ඇළ ඉඩමක් තිබෙනවා. ඒ ඉඩමට යන්න පාරක් තිබුණේ නැහැ. මේ අය අඩි 30 ක පාරක් පෙන්නලා ඒ ඉඩමට ප්ලෑන් එකක් ඇඳගෙන තිබෙනවා. මේ පාර පෙන්වන්න, මම සභාපති වෙලා සිටින කොට ඒ අයට දුන්න ලියුමක් කියලා ලිපියක් උපයෝගි කරගෙන තිබෙනවා. ඒක සම්පූර්ණයෙන්ම කූඨ ලේඛනයක්. 2005 ජනවාරි 05 වැනිදා දාතමින් තමයි මේ ලිපිය මේ අය ප්ලෑන් එක ඇඳගන්න දීලා තිබෙන්නේ. අද දවස වන විට මේ ලිපිය පාදක කරගෙන කොළඹ මහ නගර සභාවෙන් ගිහින් ජා-ඇළ පොලිසියේ පැමිණිල්ලක් දානවා. මේ පාර ඇරලා දෙන්නය කියලා ජා-ඇළ ප්‍රාදේශීය සභාවට බලපෑම් කරනවා. එයාට යන්න තිබෙන්නේ, අඩි තුනක නියරක්. මේ කුඹුර යායක් තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

වරප්‍රසාද ප්‍රශ්නය මගේ අත්සන හොරට යොදාගෙන ඊට අමතරව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කූඨ ලේඛනයක් සැකසීම.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කූඨ ලේඛනයක් සැකසීම. එහි පැහැදිලිව පේනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක සභාගත කරන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සභාගත කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005 කාලයේ ජා-ඇළ ප්‍රාදේශීය සභාව භාවිතා කරලා තිබුණේ එක ලිපි ශීර්ෂයක්. දැන් පාවිච්චි කරන්නේ වෙන ලිපි ශීර්ෂයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔය ලිපි ලේඛන සියල්ල සහා කටයුතු කාරක සභාවට යොමු කරනවා. විමර්ශනයක් කරන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

විමර්ශනයක් කරලා, මොකද ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියට මේ පාර ඇරලා දෙන්නය කියලා මේක හරහා බලපෑම් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම මූලාසනයේ සිට ලේකම්තුමාට උපදෙස් දෙනවා. ඒ පිළිබඳව විමර්ශනයක් කරන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒකට අදාළ ආයතන - කූඨ ලේඛන අරගෙන තමයි පාර අරින්න කියලා ප්‍රාදේශීය සභාවට බල කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නීත්‍යානුකූලව සහ සියලුම විමර්ශනය කරන්න කියලා මම මූලාසනයේ -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා මතු කළ දේ සම්බන්ධව සමාජ සේවා ඇමැති වශයෙන් පොඩි ප්‍රකාශයක් කරන්න අවසර දෙනවාද? ඒ ලුණු වතුර ප්‍රශ්නය පිළිබඳව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අමාත්‍යවරයා හැටියට විනාඩියකින් ප්‍රකාශයක් කරන්න කෝ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ලුණු මිශ්‍ර වීම ප්‍රශ්නය පිළිබඳව මම ඊයේ පෙරෙයිදා ජපානයේ සිට පැමිණි නියෝජිත කණ්ඩායමක් සමඟ සාකච්ඡා කළා. දැනට කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල වාගේ ප්‍රදේශවලට ජලයට ලුණු මිශ්‍ර වෙලා තිබෙනවා. ඒක වෙනස් කරන්න කෝටි 33 ක මුදලක් යනවා. කළු ගඟේ ඒ ටැංකි වෙනස් කරන්න. නමුත් ජපානයෙන් පැමිණි නියෝජිත පිරිසක් පොරොන්දු වුණා. දැන් සාකච්ඡා දෙකක් තිබුණා. දැන් 14 වැනිදාත් එතුමන්ලා ලංකාවට එනවා. අපි සාකච්ඡා කරනවා, නව තාක්ෂණය යොදාගෙන ලුණු මිශ්‍ර ජලය පිරිසිදු කිරීමේ වැඩ පිළිවෙළකට යන්න. ඒ පිළිබඳවත්, මේ ජල ගැටලුව පිළිබඳවත් එතුමා කිව්ව ජලය බෙදා හැරීමේ ප්‍රශ්න පිළිබඳවත් අනිද්දා උදේ 09.00 ට කළුතර කච්චේරියේ රැස්වීමක් කැඳවලා තිබෙනවා. මම කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, ඒ රැස්වීමට සහභාගි වෙන්නය කියලා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඊළඟට අනන්ද හරිශ්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා බොන වතුර පිළිබඳව පැහැදිලි කිරීමක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තුතියි. මේ කළුතර ප්‍රශ්නය වාගේමයි. අපිත් දඬු ගං ඔය ආශ්‍රයේ ජීවත් වෙන්නේ. මම



හිතන්නේ රද්දොළුගම ජල මූලාශ්‍රයෙන් පවුල් 20,000 කට, 30,000 කට ජලය සපයනවා. ඒ සියලුම ජලය ලුණු. අඩුම ගණනේ නාන්න පුළුවන් තත්ත්වයකත් නැහැ. ඇස් දනවා. එතකොට අපි දැන් පුද්ගලික මට්ටමින් මන්ත්‍රීවරු, දේශපාලඥයන්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජනතාවට පුළුවන් තරම් ටැංකි තියලා තමන්ගේ බවුසර්වලින් අතින් සල්ලි ගෙවලා ඒ කාර්යය දැනට කරගෙන යනවා. කටාන ප්‍රාදේශීය සභාව ඉතාමත්ම හොඳින් එය ක්‍රියාත්මක කරනවා. අපේ ගරු මහ ඇමැතිතුමාගේ උපදෙස් මත, අපේ පළාත් පාලන කොමසාරිස්තුමියගේ උපදෙස් මත මම හිතන්නේ එතුමියත් ටැංකි විශාල ප්‍රමාණයක් ලබා දුන්නා. ඒ ගැන මම කොමසාරිස්තුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු මහ ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නම් ක්‍රියාත්මක වීම අතින් ඉතාමත්ම අවමයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන නාගරික සංවර්ධන සහ ජලපවාහන නියෝජ්‍ය අමාත්‍යවරිය ඉන්නේ කටාන ආසනයේ. ඉතින් එතුමිය අපි පුද්ගලිකව සොයාගෙන පළාත් පාලන කොමසාරිස්තුමියගෙන් ඉල්ලගෙන ටැංකි ගිහිල්ලා තිබ්බාම ඒ ටැංකි වලට ජලපවාහන මණ්ඩලයට වතුර ගහන්න දෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න. ඒ තැන්වලට වතුර ගහන්න දෙන්නේ නැහැ. එතැනත් භේදයක් බලනවා. මම ඔබතුමා හරහා ඉල්ලන්නේ. කටාන ප්‍රාදේශීය සභාවට, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ඒ වාගේම ජලපවාහන මණ්ඩලයට කියන්න. පක්ෂ භේදයක් බලන්න එපා. පාට බලන්න එපා. ඒ නියමිත තැන්වලට වතුර දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර කිව්වා වාගේ රෙද්දක් හෝදන්න ඉස්සෙල්ලා ගියේ වතුර ලීටරයක් නම් දැන් ලීටර් හතරක් යනවා. ඇයි? ලුණු. හැබැයි, තව මාසයකින් බිල හතර ගුණයකින් එනවා. බලන් ගියාම අපි වතුර පාවිච්චි කළෙත් නැහැ. අකැමැත්තෙන් පාවිච්චි කළේ. මම මේ අවස්ථාවේ

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

ඉල්ලා සටිනවා, ඒ රද්දොළගම ප්‍රදේශයේ ජල පවාහන මණ්ඩලයට කියන්න. අද වුණත් යෝජනාවක් ඉදිරිපත් කරන්න. බිලෙන් භාගයත්වත් ලබා දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය දිගින් දිගටම වෙනවා. ලබන පෙබරවාරිත් පායනවා. ලබන අගෝස්තුත් පායනවා. හැමදාම වෙනවා. මම මේ රජයෙන් ඉල්ලා සිටිනවා. මොකක් හරි වැඩ පිළිවෙළක් මෙයට යොදන්න කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඕක ගිහින් ඇමැතිතුමියට කියන්න කෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඔබතුමාගේ පැහැදිලි කිරීම හොඳට පැහැදිලි වුණා. එය බලධාරීන්ට යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
## PRIVATE MEMBERS MOTION:

## NADA ආයතනයේ අඩුපාඩු සම්පූර්ණ කරමින් කලාකරුවන්ගේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම
### COMPLETING DISCREPANCIES IN NADA IN INSTITUTE AND MAKING IT AS A CENTER FOR ARTISTS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇත්තමට මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන, අවංකවම සතුටු වෙනවා. ඉඩකඩ ලැබීම සම්බන්ධව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"කොළඹ කේන්ද්‍රගතව කලා නිර්මාණ බිහි වීමේ ප්‍රවණතාවයක් තිබෙන බවත් මේ වන විට ද එවැනි තත්ත්වයක කලා නිර්මාණ බිහි වීමේ උවමනාවක් ක්ෂේත්‍රය තුළ පවතින බවත් පිළිගත යුතු ය. නමුත් කොළඹ ඉතා ජනප්‍රිය රංග ශාලා ගණනාවක් අද නොමැති වීම නිසා නිර්මාණකරුවන් තම නිර්මාණ එළි දැක්වීමේ ගැටලු වලට මුහුණ දී සිටී. ලුම්බිණි රඟහල, ජොන් ද සිල්වා රඟහල, එල්ෆින්ස්ටන් රඟහල අද නොමැත.*

*මේ තත්ත්වය බලධාරීන්ගේ විශේෂ අවධානයට යොමු විය යුතු අතර කොළඹ පිහිටි බස්නාහිර පළාත් (සෞන්දර්ය) නිකේතනය නිර්මාණකරුවන්ගේ බිමක් බවට පත් කිරීමේ වගකීම පළාත් සභාව සතුය. එයට අනුව,*

- *ප්‍රධාන රඟහල අංග සම්පූර්ණ රඟහලක් වීමට සැකසිය යුතු ප්‍රතිසංස්කරණ කිරීම.*
- *මිනි තියටර් ගණයට වැටෙන කුඩා රංග ශාලාව සියලු අඩුපාඩු සම්පූර්ණ කළ මිනි තියටර් ශාලාවක් බවට පත් කිරීම.*
- *සුන්බුන් දැමීමට පාවිච්චි කරන යටිබිම් ශාලාවේ ගබඩා කොටස් සුන්බුන් ඉවත් කොට වායු සමනය කර පුහුණු ශාලාවක් බවට පත් කිරීම.*
- *නිශ්චිත රථගාලක් නම් කර අවශ්‍ය පහසුකම් සැපයීම.*

*යන කරුණු පිළිබඳ අවධානය යොමු කර, බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය හෙවත් NADA ආයතනය කලාකරුවන්ගේ මධ්‍යස්ථානයක් බවට පත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එම යෝජනාව මම ස්ථිර කරනවා. ඇත්තටම සතුටු වෙනවා. අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරයෙක් මේ වාගේ හොඳ යෝජනාවක් දාලා විපක්ෂය වශයෙන් අපට ස්ථිර කරන්න ලැබීම ගැන.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

යෝජනාව ස්ථිර කිරීම පිළිබඳව විපක්ෂයේ සංවිධායකතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට තිබෙන්නේ විවාදයයි. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය විනාඩි 10 යි.

[පූ.භා. 11.28]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව ගෙනැල්ලා කාලයක් වෙනවා. දැන් මේ මොහොත වන විට කොළඹ ලුම්බිණි රඟහල නැවත වරක් නාට්‍ය පෙන්වන්න පුළුවන් රඟහලක් බවට ඇරලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලුම්බිණි රඟහල වහලා දැම්මෙ, මේක අංගසම්පූර්ණ නවීන රඟහලක් බවට පත් කරනවා කියලා. ඒකට මිලියන ගණනාවක් ආණ්ඩුවෙන් වෙන් වෙලා තිබෙනවා කියලා, ඒ වෙලාවේ කිව්වා. නමුත් රඟහල වහලා දැම්මා විතරයි. රඟහලේ කිසිම ප්‍රතිසංස්කරණයක් වුණේ නැහැ. දැන් නැවත මේ රඟහල විවෘත කරලා තිබෙන්නේ කිසිම ප්‍රතිසංස්කරණයක් නැතිව. අර කලින් තිබුණු තත්ත්වයෙන්ම. ඇත්තටම ඔය රඟහල මීට අවුරුදු 25 කට කලින් වහලා තිබුණේ. එතකොට මමත් පළාත් සභාවේ සිටියා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කියන්නේ ලුම්බිණි රඟහල.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ලුම්බිණි රඟහල. මමත් පළාත් සභාවේ සිටියා. රෙජිනෝල්ඩ් කුරේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක අයවැය සම්බන්ධව ඒ වෙලාවේ පැවැති තත්ත්වයත් එක්ක යම් එකඟතා වැඩ පිළිවෙළකට ගියා. ඒ එකඟතා වැඩ පිළිවෙළේ කොන්දේසියක් තිබුණා, ලුම්බිණි රඟහල නාට්‍යය පෙන්වන්න පුළුවන් විධියට ප්‍රතිසංස්කරණය කරන්නය කියලා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අවුරුදු 25 කට විතර පස්සේ ලුම්බිණි රඟහල ප්‍රතිසංස්කරණය කළේ. ඒ කරපු ප්‍රතිසංස්කරණය යටතේ තමයි අද අලුතෙන් විවෘත කරනවා කියලා රඟහල විවෘත කරලා තිබෙන්නේ. එහෙම නැතිව කිසිම අලුත් වැඩියාවක්, අලුත් දෙයක් රඟහලට එකතු කරලා නැහැ. එතකොට මෙන්න මේ කරුණුත් එක්කම තමයි අපි කිව්වේ, මේ විධියට රඟහලවල් විශාල ප්‍රමාණයක් වහලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ විශේෂයෙන්ම වේදිකා නාට්‍ය බිහි වීමේ ප්‍රවණතාවය තිබෙන්නේ කොළඹ හරහා. ඒක කවුරුත් පිළිගත යුතු කාරණයක්. ඒක එහෙම වෙලා තිබෙනවා. ඉතින් ඒක නිසා කොළඹ රඟහල වහනවා කියලා කියන්නේ, ඇත්තටම නාට්‍යකරුවන්ගේ පැත්තෙන් ඉතාමත් අසීරු තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා තමයි විශ්වාස කරන්නේ විශේෂයෙන්ම පළාත් සභාවට අයිති ආයතනයක්. කවුරු කොහොම කළත් ඒ වෙලාවේ, මේ මට්ටමින් හරි සෞන්දර්යය නිකේතනය පටන් ගැනීම විශාල දෙයක් හැටියට අපි සලකනවා. නමුත් ඒකේ අඩුපාඩු රාශියක් තිබෙනවා. මම මේ යෝජනාව ගෙන එන්න හේතුව තමයි කලාකරුවන් හැටියට විශේෂයෙන්ම සමාජවාදී කලා සංගමයට සම්බන්ධ කලාකරුවොත්, තව ඊට පිටස්තර කලාකරුවොත් ප්‍රමාණයක් ගිහිල්ලා විශේෂයෙන්ම සෞන්දර්ය නිකේතනයට ගිහිල්ලා අපි දිනයක් වෙන් කරගෙන, ඒ වෙලාවේ හිටපු අධ්‍යක්ෂවරයා සම්බන්ධ කරගෙන, දැනට නාඩා ආයතනයේ සභාපතිවරයාත් සම්බන්ධ කරගෙන අපි එකින් එක අඩුපාඩු - ඒ කියන්නේ, අංගසම්පූර්ණ රඟහලක් බවට පත් කරන්න තිබෙන - මහ විශාල දේවල් ටිකක් නැහැ,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම අපි මේ පළාත් සභා යටතේ කරන සමහර වියදම් දිහා බැලුවාම, අපි දවසකට මේ සභාවට ඇවිල්ලා කෑමට වියදම් කරන ඒ මුදල දිහා බැලුවාම ඇත්තටම මේවා මහා ලොකු වැඩ නොවෙයි. මේ දේවල් ජනතාවගේ පැත්තෙන්, කලාකරුවන්ගේ පැත්තෙන් ඒ අයට මෙය හරියාකාරව පාවිච්චි කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ හදලා දීමට මහා විශාල මුදලක් වැය වෙන්නෙත් නැහැ. ඒ නිසා මේකේ කෙරෙන්න ඕනෑ කටයුතු මොනවාද කියලා ඒ ආයතනයේ බලධාරීන්ට අපි බොහොම පැහැදිලිව පෙන්නුවා. ඒකේ තිබෙනවා, විශේෂයෙන්ම කලාකරුවන්ගේ පැත්තෙන් අපි දන්නවා, දැන් පුහුණුවීම් ශාලා කියන එක ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි කියන්නේ මේකේ යටබිම් ශාලාවක් තිබෙනවා. ඇත්තටම හොඳ ශාලාවක්. දැන් ඔය කැඩුණු පුටු කෑලි, වෙන වෙන සුන්බුන් දාලා තිබෙන්නේ. ඒ ශාලාවේ ඒ සුන්බුන් ඉවත් කරලා, ඒක වායු සමනය කළොත් ඇත්තටම පුහුණු වීම් ශාලාවක් හැටියට විශාල අඩුවක් සම්පූර්ණ කර ගන්න පුළුවන්. ඒ නිසා මහා විශාල දේවල් නොවෙයි කරන්න තියෙන්නේ. මෙතැන ගරු ඇමැතිතුමා නැහැ. නමුත් සංස්කෘතිය සම්බන්ධයෙන් වග කියන්න සෞඛ්‍ය ඇමැතිතුමා ඉන්නවා. ගොඩක් වෙලාවට මේ සභාවේ එහෙමයි. සෞඛ්‍ය සම්බන්ධයෙන්

**[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]**

වග කියන්න සමහර වෙලාවට අධ්‍යාපන ඇමැතිතුමා ඉන්නවා. සංස්කෘතික ඇමැතිතුමාගේ වැඩේදී සෞඛ්‍ය ඇමැතිතුමා ඉන්නවා. දැන් එතුමන්ලාගේ එහෙම හොඳ සාමූහික වැඩ පිළිවෙළක් තිබෙන නිසා ඒක හොඳයි. ඒක නිසා ප්‍රශ්නයක් නැහැ. හොඳ අමාත්‍ය මණ්ඩලයක් ඉන්න නිසා ඒක ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. ඉතින් ඒක නිසා මේ දේවල් පෙන්වන්න. මම ඒ වෙලාවෙත් ගරු ඇමැතිතුමාට කිව්වා, අපිත් එක්ක ඔබතුමා එන්න. ඇවිල්ලා බලන්න. බලලා ඒ සම්බන්ධව ක්‍රියා මාර්ග ගන්න. එතකොට ගරු ඇමැතිතුමාට ලේවලට දැනෙනවා. අපි අඩුපාඩු කියනවාට වඩා. කලාකරුවනුත් ඇවිල්ලා, කලාකරුවනුත් සම්බන්ධ වෙලා අන්න එතකොට තමයි ලේ හරියට වැඩ කරන්නේ. නමුත් ඒකට ඇමැතිතුමාට සහභාගි වෙන්න බැරි වුණා. නමුත් නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් වෙලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් ලේකම්වරයෙක් ඉන්නවා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි කියන්න ඕනෑ, මේ පළාත් සභාවේ අපේ අමාත්‍යාංශ පහේම හතර දෙනෙක්ම කාන්තාවෝ ඉන්නේ. මේ අමාත්‍යාංශයේ තමයි පිරිමි කෙනෙක් ඉන්නේ. ලේකම්වරයෙක් හැටියට. ඒක නිසා එතුමාටත් මම හිතනවා - මම විශ්වාස කරනවා කාන්තාවෝ මාත් එක්ක තරහා වෙන එකක් නැහැ මම මේ කියන්නේ මොකක්ද කියලා. නමුත් මම කියන්නේ ලේකම්තුමාට යම් කලාකාමී හැඟීමක් තිබෙනවා කියලා මට තේරුණා. එතුමා එදා ඇවිල්ලා මේකට සම්බන්ධ වුණා. නමුත් එතුමාට මේ දේශපාලන හයිය නැතුව මේක කරන්න බැහැ. ඒ කියන්නේ, හොඳ පිරිමි ඇමැතිවරයෙක් ඉන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එයා පිරිමි ඇමැතිවරයෙක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සමහර වෙලාවට මට ඒක දැනෙන්නේ නැහැ. ඒකයි. ඉතින් ඒක නිසා පිරිමි ලේකම්වරයෙක් ඉන්නවා වාගේම පිරිමි ඇමැතිවරයෙකුත් ඉන්න ඕනෑ මේ වැඩ කරන්න. එතුමා ඉන්නවා. ඒක නිසා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මම හරි ආදරෙයි. මම එතුමාගේ කට හඬ ඇහිලා තේ එකක්වත් නොබී දුවගෙන ආවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා සංස්කෘතික ඇමැතිවරයා හැටියට පස්සේ කරුණු පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා ඉන්න එක ගැන මට සන්තෝෂයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම එතුමාට අවංකව කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම මේ උත්සාහ කරන්නේ මගේ පුළුවන් හැකියාව සියල්ල දාලා කොහොම හරි ඔබතුමාගෙන් මේ වැඩේ කර ගන්න. වෙන එකකට නොවෙයි. ඉතින් ඒක නිසා නිලධාරීන් ඇවිල්ලා බැලුවා. කලාකරුවෝ බැලුවා. මේකේ අඩුපාඩු පෙන්වලා දුන්නා. ඒ නිසා මේකේ වැදගත්ම එකක් තිබෙනවා. අර ප්‍රධාන ශාලාව වහන්න වෙනවා මේකේ තිබෙන Repair ටික කරන්න. මේක අංග සම්පූර්ණ රඟහලක් බවට පත් කරන්න. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ ඒ ප්‍රධාන රඟහල වහලා ඒකේ අලුත්වැඩියා කටයුතු කරනකල් අර මිනි තියටර් එක නාට්‍ය පෙන්වන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න. මම හිතන්නේ ඒකේ පුටු 200 ක් විතර දාන්න පුළුවන්. ඒ නිසා මේ වෙලාවේ 200 කට නාට්‍යයක් පෙන්වා ගන්න මිනි තියටර් එකක් තියෙනවා කියන්නේ, ලොකු එකක්. මොකද, ඇත්තටම දැන් කොළඹ ශාලාවල් - උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම බොරැල්ලේ මිනි තියටර් එක විශාල මුදලක්. විශාල මුදලක් වුණාට කමක් නැහැ. ඒකේ තියටර් එකක තියෙන්න ඕනෑ අවශ්‍ය දේවල්වලින් අංග සම්පූර්ණ වෙලා තිබෙනවා. ඉතින් ඒක නිසා විශේෂයෙන්ම

පෞද්ගලිකව පත්වාගෙන යන කෙනෙකුට ඊට වඩා අඩු මුදලකට ඒක දෙන්නත් බැහැ, මම විශ්වාස කරන විධියට. නමුත් අපි කරන්නේ සේවයක්. මේකේ ලාභය නොවෙයි බලන්න ඕනෑ. දැන් මේ රංග ශාලාවේ මීට ඉස්සෙල්ලා තිබුණු මුදල්, අය කළ ගාස්තු බැලුවාට පස්සේ ඇත්තටම සාමාන්‍ය කලාකරුවෙකුට මේක අරගෙන කරන්න බැහැ ඇමැතිතුමා. ඉතින් ඒක නිසා තමයි සාකච්ඡා කරලා අපි සතුටු වෙනවා. ඔබතුමන්ලාගේ පැත්තෙන් භාගෙට භාගයක් ගාස්තු අඩු කරලා කලාකරුවන්ට ප්‍රයෝජන ගන්න පුළුවන් තැනක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් ඒක නිසා එතැන දැන් කලාකරුවන්ගේ මධ්‍යස්ථානයක් බවට, ඒ ස්ථානය පත් වෙලා තිබෙනවා. අපි කියන්නේ අවශ්‍ය දේ කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවා.

අපේ පැත්තෙන් බැලුවොත් එහෙම අපේ රට පැත්තෙන් බැලුවොත් එහෙම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කලාව පැත්තෙන් ඉතාමත් අමාරු තත්ත්වයක ඉන්නේ. බලන්න කියලා හොඳ චිත්‍රපටයක් නිර්මාණය කර ගැනීමේ අමාරුවක් තිබෙනවා. ඒකට හේතුව තමයි අද සිනමාවක් තිබුණාට සිනමා කර්මාන්තයක් නැහැ. සිනමා කර්මාන්තයක් නැතුව සිනමාවක් පවත්වාගෙන යන්න බැහැ. අපි පාසල් යන කාලේ බැලුවොත් එහෙම 80 වාගේ දශකයේ අවුරුද්දකට සති 52 නම් චිත්‍රපටි 52 ක් විතර එනවා. හැමදාම සිකුරාදා කියන්නේ අලුත් චිත්‍රපටයක් එළියට එන දවසක්. එහෙම සිනමා කර්මාන්තයක් තිබුණා. එතකොට ඒ සිනමා කර්මාන්තයත් එක්ක ගොඩ නැඟුණු -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ශත 55 යි ගැලරිය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගැලරිය කියලා තිබුණා. අද ගැලරි කියලා එක්ක නැහැ. අද බොක්ස් තියෙන්නේ. අද සිනමා ශාලාවේ වෙන වැඩක් යන්නේ. ඉතින් ඒ නිසා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කාලේ මමයි නිපුණ ආරච්චි මන්ත්‍රීතුමයි ගැලරියේ එකට ෂෝ එක බැලුවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බොරු කියන්න එපා. ඒ වාගේ සිනමා කර්මාන්තයක් නැහැ. නමුත් විශේෂයෙන්ම වේදිකා නාට්‍ය පැත්තෙන් කෙනෙකුට පුළුවන් - ඇත්තටම නාට්‍ය නිෂ්පාදකයාට බොහෝ වෙලාවට -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගේ වෙලාවෙන් කාලය දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. එතුමා දැන් හුඟක් වෙලා කථා කළා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බොහෝ වෙලාවට වෙන්නේ තමන්ගේ තිබෙන ඉඩම හරි උකස් කරලා නාට්‍යයක් කරනවා. එහෙම පරපුරක් අද අපට ඉන්නවා. තරුණ පරපුර ගෙදර අම්මාගෙන්, තාත්තාගෙන් ගෙදර ඔප්පුව ඉල්ලගෙන, ඒක උකස් කරලා, නාට්‍ය කරලා පසුව බේරා ගන්න තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහෙම තමයි අද වේදිකා නාට්‍ය කර්මාන්තයක් හැටියට යන්නේ. ඒ නිසා රාජ්‍ය අනුග්‍රහය කියන එකක් කොයි පැත්තකින්වත් නැතිව තියෙද්දීත් කලාව පැත්තෙන් ඔය ක්ෂේත්‍රය තුළ අද ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, අපේ පැත්තෙන්, බස්නාහිර පළාත් සභාව පැත්තෙන් මෙම රඟහල තිබෙන භූමිය කලාකරුවන්ගේ මධ්‍යස්ථානයක් බවට පත් කළොත් මේක ඉතාමත්ම වටිනා කාරණයක්. ඒ නිසා මම කියන්නේ යෝජනාවක් ගෙනැල්ලා සාකච්ඡා කරන එක විතරක් නොවෙයි. විශේෂයෙන්ම ඇමැතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා - මම දන්නේ නැහැ ලේකම්තුමන්ලා හා මේ විෂයය අදාළ නිලධාරීන් ඇවිල්ලා ඉන්නවාද කියලා. ඒගොල්ලෝ වෙත යොමු කරලා මේ සඳහා යන මුදල් මේ අවුරුද්දේම දීලා ඉවර වෙලා මේක අංග සම්පූර්ණ රඟහලක්, ඒ වාගේම නාඩා ආයතනය කියලා කියන්නේ කලාකරුවන්ගේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ටික සලසා දෙන්න කියන යෝජනාව තමයි අපි කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. ඉතාමත්ම වැදගත් යෝජනාවක්. මම හිතන්නේ ගරු ඇමැතිතුමා විශේෂ අවධානය යොමු කරාවි. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.39]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දීම ගැන. අපි බොහෝ වෙලාවට මේ පළාත් සභාවේ කථා කරන යෝජනා මේ මහ පොළොවේ පැළ කරන්න බැරි යෝජනා තමයි සාකච්ඡාවට ලක් වෙන්නේ. අපි ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම වැදගත් යෝජනාවක් සහ ප්‍රජාවක් ඉතාමත් සමබරව සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන කලා නිර්මාණ රස විඳින්න තිබෙන උවමනාව වැඩි කිරීමේ උවමනාවෙන් මේ බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන අපි බොහොම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්න ඕනෑ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා එවකට සංස්කෘතික හා කලා කටයුතු ඇමැතිවරයා වෙලා ඉන්න කොට බස්නාහිර පළාත් සභාවට සෞන්දර්ය නිකේතනයක්, නැත්නම් කලා ආයතනයක් නිර්මාණය කිරීම සඳහා එවකට හිටපු ජනාධිපතිතුමිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුමංග මැතිනිය කරපු ඉල්ලීමකට අනුව එතුමිය මේ ඉඩම ලබා දුන්නා විජය කුමාරතුංග අනුස්මරණ රඟහල පිහිටුවීම සඳහා. නමුත් අද වනකල් ඒක විජය කුමාරතුංග රඟහල බවට පත් වුණේ නැහැ. අපි මේ වෙලාවේ ඉල්ලීම කරනවා. ඉස්සෙල්ලා මේක විජය කුමාරතුංග සමරු රඟහල බවට පත් කරන්න කියලා. එතුමිය ඒක ලබලා දුන්නේ ඒ අරමුණින්. ඒ වාගේම මේක පිහිටපු ස්ථානය ඉතාම වැදගත් තැනක්. කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ සෞන්දර්ය විශ්ව විද්‍යාලය, ඒ වාගේම කලාභවන වාගේ කලාවට සම්බන්ධ ආයතන ගණනාවක් තිබෙන, කලාව රස විඳින්න පුළුවන් තැනක, ස්ථානයක සියලු දෙනාට ළඟා වෙන්න පුළුවන් තැනක තමයි මේ ආයතනය නිර්මාණය කිරීම සඳහා ඉඩකඩ ලබා දුන්නේ. නමුත් අද වනකොට මේ ආයතනය පත් වෙලා තිබෙන ශෝචනීය තත්ත්වය ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තිබෙනවා. මම පෞද්ගලික විශ්වාස කරන්නේ, මේ ආයතනය සංවර්ධනය කර ගන්න බැරි ප්‍රධාන ගැටළුව තමයි මේ ආයතනයට හරි හමන් පරිපාලනයක් නැහැ. ඒක තමයි ප්‍රධානම කාරණය. කලාව තේරෙන, කලාව රස විඳින, කලාවේ හිටපු, කලාව දන්න එහෙම අය පරිපාලනයේ නොහිටියාම මේ ආයතනය සංවර්ධනය කර ගන්න පුළුවන්කමක් නැහැ. මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ යෝජනාව සාකච්ඡා කරලා ඉවර වෙන්න ඉස්සර වෙලා මේ සභාව දැනුවත් කරන්න කියලා මේ ආයතනයේ තිබෙන අඩුපාඩු සියල්ල නිර්මාණය කර ගන්න පුළුවන් විධියේ මේ ආයතනයේ පරිපාලන ව්‍යුහය සංවර්ධනය කර ගන්න කාලයකට කලින් මේ ආයතනයට විධායක අධ්‍යක්ෂවරයෙක් බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයක් තිබ්බා. මම අහනවා, ඒ සම්මුඛ පරීක්ෂණයට මොකද වුණේ කියලා මේ සභාව දැනුවත් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතා පැහැදිලිව දන්නවා. මේ සම්මුඛ පරීක්ෂණයකට ගණනාවක් අය ආවා. ඒ අය අතර අපේ පළාත් සභාව නියෝජනය කරන, පළාත් සභාවේ ප්‍රවෘත්ති නිලධාරීයා දීප්ති විජේතුංග මහත්මයා මේ සම්මුඛ පරීක්ෂණයට ගියා. දීප්ති විජේතුංග මහත්තයා පශ්චාත් උපාධිධාරියෙක්. ඒ වාගේම කලා කටයුතු පිළිබඳ හසල දැනුමක් තිබෙන කෙනෙක්. ලංකාවේ කලාකරුවෝ සම්බන්ධ ආයතන තුනක ලේකම්වරයා විධියට එතුමා කටයුතු කරනවා. ටෙලිනිස සංවිධානයේ ලේකම්වරයා එතුමා. ටෙලි නිර්මාණවේදීන්ගේ සංසදය කියලා කියන්නේ කලාකාරයෝ 1200 ක් විතර සාමාජිකත්වය දරන තැනක්. ඒකේ ලේකම්වරයා එතුමා. ඒ වාගේම වාර්තා වැඩ සටහන් 60 ක් විතර නිර්මාණය කරපු කෙනෙක්. ඒ වාගේම ටෙලි නිර්මාණ තුනක් නිර්මාණය කරපු කෙනෙක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කවුද ගරු මන්ත්‍රීතුමා?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ කථා කරන්නේ අපේ පළාත් සභාවේ ප්‍රවෘත්ති නිලධාරී දීප්ති විජේතුංග මහත්තයා ගැන. එතුමා මේ සම්මුඛ පරීක්ෂණයට ගියා. මේ සම්මුඛ පරීක්ෂණයට එතුමා පෙනී හිටියා. එතුමා පළමුවැනියාට ලකුණු ගත්තා. හැබැයි අවාසනාවට මේ අමාත්‍යාංශය විසින් ඒ සම්මුඛ පරීක්ෂණය අවලංගු කරලා නැවත වතාවක් සම්මුඛ පරීක්ෂණ සඳහා පුවත්පත් නිවේදන පළ කළා. මම අහනවා ඇයි මේ තනතුරට බඳවා ගන්නේ නැත්තේ? ඇමැතිතුමාට ඕනෑ දේශපාලන බැලයෙක් මේ තනතුරට දාගන්නද? එහෙම නම් තවදුරටත් මේ රඟහල තිබෙන්නේ මේ තත්ත්වයේම තමයි. ඒ නිසා කලාව තේරෙන කෙනෙක් මේ සම්මුඛ පරීක්ෂණයට ඇවිල්ලා ඉතාම විනිවිදභාවයෙන් සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීලා, සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ගත්තු කෙනා මේ තනතුරට පත් කළා නම්, ඒ මනුස්සයා මේ ආයතනයේ ඔය කියන අඩුපාඩු ටික හදයි. හැබැයි එහෙම කරන්නේ නැතුව මෙහෙම තියාගෙන හිටියොත් හැමදාම මේක තමයි වෙන්නේ. ඒක නිසා කරුණාකරලා ඇමැතිතුමාට මම යෝජනා කරනවා එතුමාගේ බුද්ධිය පහළ වෙන්න කියලා. මේ ආයතනයේ විධායක අධ්‍යක්ෂ ධුරයේ පුරප්පාඩුව වහාම පුරවන්නත්, ඒ පුරවද්දී දේශපාලන හිතවත්කම් මත නොවෙයි. සුදුසුකම් තිබෙන කෙනෙක් දාලා මේක පිරෙව්වොත් මේ ආයතනයේ අඩුපාඩු ටික හදන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානයේ කලාකාරයෝ මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, නාට්‍යකාරයෝ නාට්‍ය හදනවා. නාට්‍ය සම්බන්ධයෙන් විවිධ සම්මන්ත්‍රණ යනවා. කලාව සම්බන්ධයෙන් විවිධ කරීකාවල් කොළඹ නගරයේ සිද්ධ වෙනවා. හැබැයි ඒ එකක්වත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, කලාකාරයින්ට දරන්න පුළුවන් තැනක නොවෙයි. නාට්‍යයක් පෙන්වා ගන්න ශාලාවක් ගන්න කොළඹ නරගයේ පුළුවන්කමක් නැහැ. කොළඹ ලයනල් වෙන්ට් තියටර් එක දවසකට රුපියල් 75,000 ක් විතර ගන්නවා. අර ආනන්දයේ තිබෙන කුලරත්න ශාලාව එක දවසකට රුපියල් 75,000 ක් විතර ගන්නවා. බිෂොප් විද්‍යාලයේ ශාලාව එක දවසකට රුපියල් 50,000 ක් විතර ගන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නෙළුම් පොකුණ ලක්ෂ 08 යි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නෙළුම් පොකුණ රඟහල ලක්ෂ 08 ක් ගන්නවා. ඔබතුමා ඒක දන්නවා. නාට්‍ය කාරයෙකුට නාට්‍යයක් පෙන්නලා මේ කරන කෙනාට පුංචි ආදායමක් අරගෙන රස වින්දනය ලබලා දෙන්න පුළුවන්. නාට්‍ය පෙන්වන්න විශාල මුදලක් ගත්තාම වෙන්නේ ඒක බලන්න එන මිනිහාට ඒ වියදම දරන්න වෙනවා. නාට්‍ය බලන්න මිනිස්සු එන්නේ නැහැ. නාට්‍ය හැදුවාට වැඩක් නැහැ ප්‍රේක්ෂකයෝ ළඟා කර ගන්න බැරි නම්. ජනතාවට, බොහොම අහිංසක මිනිහෙකුට දරන්න පුළුවන් මිලකට ටිකට් පතක් දෙන්න පුළුවන් වෙන්නේ රඟහලක් අඩු මුදලකට ගන්න පුළුවන් වුණොත් විතරයි. දැන් මේ රඟහල හදද්දී බලාපොරොත්තුවක් තිබුණා, නාට්‍ය කරන අයට රාත්‍රියේ නතර වෙන්න, ඒ අයගේ පුහුණු වීම් කටයුතු කරන්න විවිධ අවස්ථාවල් හදලා දෙන්න. නාට්‍යකරුවන්ට පුංචි අවන්හලක් හදලා දෙන්න. විවිධ දේවල් කරන්න පුළුවන්කම තිබුණා. හැබැයි ඒ එකක්වත් සිද්ධ වෙන්නේ නැත්තේ, මේ ආයතනයේ පරිපාලනයේ ඉන්නේ කලාව තේරෙන අය නොවෙයි. මම දන්නේ නැහැ ඇමැතිතුමාට කලාව තේරෙනවාද කියලා. අපි විශ්වාස කරනවා ඇමැතිතුමාට එහෙම තේරෙනවා ඇති කියලා. හැබැයි ඇමැතිතුමා බස්නාහිර පළාතේ පාසල් කලා උළෙල තිබ්බේ, අර දහසකුත් එකක් ක්‍රීඩා උළෙලවල් තියන අස්සේ ගිහිල්ලා තමයි. ඒ නිසා කලා උළෙලට නිලධාරීන්ට යන්න පුළුවන්කම තිබුණාට දේශපාලඥයින්ට යන්න බැරි වුණා. එදා දවසේ ක්‍රීඩා උළෙලවල්වලට නිලධාරීන් නැති වුණා. ඒ නිසා ගරු ඇමැතිතුමා මේවා ගැන අවධානය යොමු කරයි කියන විශ්වාසය අපට තිබෙනවා. මේ ආයතනයේ පරිපාලනය ශක්තිමත් කළොත් විතරයි මේ කියන ප්‍රශ්න ටික විසඳගන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ ප්‍රශ්න තේරෙන කෙනෙක් පරිපාලනයේ හිටියොත් විතරයි මේ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

මේ බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ ප්‍රධාන රඟහල කාලයක් තිස්සේ රූපවාහිනී ආයතනයකට පවරලා දීලා තිබුණා. මේ රූපවාහනී ආයතනය අවුරුද්දක් විතර ඒ අයගේ සෙට් එක මේක උඩ ගහලා තිබුණා. කිසි කලාකාරයෙකුට ළඟා වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. දැන් එතැනින් ගැලවිලා තිබෙනවා. හැබැයි දැන් මේ රංග ශාලාව, රංග ශාලාවක තිබෙන මූලික රීතීන්වලට විරුද්ධව තමයි ගොඩ නහලා තිබෙන්නේ. රංග ශාලාවක තිබෙන

**[ගරු මහේෂ් අල්මේදා]**

මූලික රීතීන් අනුගමනය කරලා මේ රංග ශාලාව ගොඩ නඟලා නැහැ. ඒ නිසා මේ රංග ශාලාව හැදුවත් මේ රංග ශාලාවේ නරඹන්නෙකුට නිවැරැදි විධියට වේදිකාවේ සිද්ධ වන දේ බලාගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේකට උපදෙස් ගන්න ඕනෑ. මේ රංග ශාලාව ගොඩ නැඟීම සඳහා නොමිලේ උපදෙස් දෙන ජාත්‍යන්තර ආයතන තිබෙනවා. ලෝකයේ වෙබ් සයිට්වලට ගියොත්, ලෝකේ පුරා තිබෙන මෙහෙම ආයතනවලට කථා කළොත් ඒ අය නොමිලේ උපදෙස් දෙනවා රංග ශාලාවක් හදන්නේ කොහොමද කියලා. ඒ ආයතනවලට ගිහිල්ලා උපදෙස් ගන්න පුළුවන්. හැබැයි ඒවා තේරෙන කෙනෙක් මේ පරිපාලන ව්‍යුහයේ ඉන්න ඕනෑ. එහෙම නැති අය පරිපාලන ව්‍යුහයේ ඉන්නවා නම් කවදාවත් මේවා කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන මේ යෝජනා ටික මේ රංග ශාලාව තුළ ගොඩ නැඟීම අත්‍යවශ්‍යයි කියන කාරණය අපි පිළිගන්නවා. හැබැයි ඒක කරන්න පුළුවන්කම ලැබෙන්නේ, ඒ දේ තේරෙන පරිපාලන ව්‍යුහයක් තිබුණොත් විතරයි. ඒ නිසා මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ විවාදය අවසන් වෙන්න කලින් මේකේ ප්‍රධාන විධායක නිලධාරියාගේ පුරප්පාඩුව පුරවන්න තියපු සම්මුඛ පරීක්ෂණයට වුණු දේ මේ සභාව දැනුවත් කරන්න කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමා, එතුමාගේ කථාවේදී ප්‍රකාශ කරාවි. මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.48]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාමත් සතුටට පත් වෙනවා. කලාකරුවෙක් හැටියට, වේදිකා නළුවෙක් හැටියට අපි වෙනුවෙන් කලාකරුවෝ විශාල ප්‍රමාණයක් නියෝජනය වෙද්දී, අපව නියෝජනය කරමින් අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. ඒ වාගේම මම එතුමාව පොඩි නිවැරැදි කිරීමක් කරන්නත් ඕනෑ. මගේ විද්‍යාලය තමයි ලුම්බිණි විද්‍යාලය. ලුම්බිණි විද්‍යාලයේ ශාලාව පිළිබඳව කරපු විග්‍රහය වැරැදියි. මගේ ළඟ ඡායාරූප කිහිපයක් තිබෙනවා. ලුම්බිණි විද්‍යාලයේ ශාලාව වහන්න විශේෂ හේතුව තමයි තිබුණු පුටුවල දෝෂය. කඩලා තියෙන්නේ. එකක් කැලි කැලි ගිහිල්ලා. මේ විධියට පුටුවල පොඩි අඩුපාඩුකම් කිහිපයක් තිබුණා. ඒ නිසා ලුම්බිණි ශාලාව වහලා දැම්මා. ඒක පළාත් සභා පාසලක් නොවෙයි. ජාතික පාසලක්. ජාතික පාසලක් වීමත් සමගම මගෙත් ගුරුවරයෙක් වුණු හිටපු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමා එදා පොරොන්දුවක් වුණා ලුම්බිණි රඟහල සුවිශේෂී රඟහලක් බවට පත් කරනවා කියලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යටතේ කටින් ප්‍රකාශයක් කරලා තිබුණා. නමුත් ඒකට අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කරලා තිබුණේ නැහැ. වත්මනේ, දැන් ලුම්බිණි රඟහල අවුරුදු 2 ½ කට වඩා වැඩි කාලයක් වහලා තිබුණා. නමුත් දැන් මෑතදී පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ හිටපු විදුහල්පතිතුමා එතැනට පැමිණීමත් සමග මාස 2 ½ ක් වාගේ කෙටි කාලයක් තුළදී කිසිම පිටස්තර පුද්ගලයෙකුගෙන් කිසිම මුදල් අය කර ගැනීමකින් තොරව ආදී ශිෂ්‍යයින් හා අනෙකුත් අයගේ උපකාර මත අද නැවත වතාවක් ලුම්බිණි රඟහල යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ නිසා අද ලංකාවේ තිබෙන ඉතාම අඩු මුදලකට නාට්‍යයක් පෙන්වන පුළුවන්. නැවත වතාවක් රුපියල් 10,000 ක් වාගේ මුදලකින්. මම හිතන්නේ නාඩා ආයතනය එපමණ අඩුවට දෙන්නේ නැහැ. ඉතාම අඩු මුදලකින් රුපියල් 10,000 ක් වාගේ මිලකට රඟහල ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා තිබෙනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය වහන්න මූලික හේතුවත් පසුගිය කාලය තමයි. ජෝන් ද සිල්වා රඟහල මූලික වශයෙන් වහලා දාන්න පසුබිම නිර්මාණය කර ගත්තේ නෙළුම් පොකුණ. නෙළුම් පොකුණ කියන රඟහල නිර්මාණය වීමත් සමග ඒ වටපිටාවේ තිබුණු ජොන්ද සිල්වා රඟහල එහෙම්ම කඩලා දැම්මා. ලුම්බිණි රඟහලත් එයට සමගාමීව මොන ක්‍රමයකින් හරි වහලා දැම්මා. ඒකෙන් උත්සාහ දැරුවේ නොළුම් පොකුණ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජොන් ද සිල්වා රඟහල දැන් තියෙනවා නේද?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නැහැ, නැහැ. ගලවලා තියෙන්නේ. දැන් හදාගෙන යන්නේ. ඒක වැහුවා. මේක කැඩුවා. ලුම්බිණි නැවැත්තුවා මොන ක්‍රමයකින් හරි. ඊට පස්සේ නෙළුම් පොකුණ ගත්තා. සමාජවාදී කලාකරුවෝ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැමෝම එකයි. මොකද, අපි නාට්‍යකරුවෝ හැටියට එදා ඉඳලා බැහැලා වැඩ කරපු කලාකරුවෝ. අපි කලාවට ඇවිල්ලා තිබෙන්නේ වේදිකාව තුළින්. ඉතින් ඒ නිසා නෙළුම් පොකුණ වෙන් වුණේ එක්තරා පිරිසකට විතරයි. ජැක්සන්ලා, ඒ වාගේ කිහිප දෙනෙකුට පමණක් සීමා වුණු රඟහලක්. සාමාන්‍ය කලාකරුවෙක්ට ගිහිල්ලා නාට්‍යයක් පෙන්වන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඉතින් ඒ නිසා මේ බහුතරයක් රඟහලවල් වැහෙන්න පටන් ගත්තේ එතැන කේන්ද්‍ර කරගෙන. ඉතින් ලක්ෂ 8 ක් වාගේ මුදලකට ඒ රඟහලක් මිලදී අරගෙන නාට්‍යයක් පෙන්වන්න සාමාන්‍ය නාට්‍යකරුවෙකුට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අනෙක් එක තමයි මේකත් එක්කම එදා ඉඳන්ම සිංහල සංස්කෘතික ආයතනය. අපි සුදර්ශී ආයතනයෙන් බිහි වුණු කලාකරුවෝ හැටියට, අඹ ගස් යටට වෙලා ඉඳපු අපි කලාකාරයෝ වෙන්න මුල් තැන යොදා ගත්තේ එතැන. හිටපු ජනාධිපතිතුමා විසින් කථා කරලා අද ඒක ජපානයේ සසකාවා ආයතනයට පවරා දෙන්න අවශ්‍ය කරන පිඹුරුපත් හදලා ඉවරයි. ඉතින් ඒ නිසා දැන් වැඩි කාලයක් යන්න ඉස්සෙල්ලා මෙපමණ කල් තිබුණු සුදර්ශී ආයතනය දැන් අවුරුද්දකට වැඩිය තියෙන්නේ නැහැ. ජපානයේ සසකාවා ආයතනයට දෙන්න දැනට අත්සන් කරලා ඔක්කෝම ඉවරයි. නැත්නම් කලාකරුවෙකුට එතැන තිබුණ නුගගහ යටට වෙලා ඉතාම අඩු මුදලකට වේදිකා නාට්‍යයක් පුහුණු වෙන්න තිබුණු අවස්ථාව නැති වෙන්න යනවා. ප්‍රධාන ශාලාවත් ඉතාම පුංචි මුදලකට ගන්න තිබුණා. එහෙම නැත්නම් අඹ ගහ යට හරි ඒ වැඩේ කරන්න තිබුණා. දැන් ඒක නැති වෙලා යනවා. ඒ නැති වෙලා යන යුගය තමයි මේ නාඩා ආයතනය. මම දන්නේ නැහැ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා දැනුවත් වෙලාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඕක සාකච්ඡා කළා. අපි තමයි මම හිතන්නේ මූලික ආරම්භය ගත්තේ. ආචාර්ය ජයලත් මනෝරත්න මැතිතුමා, ඒ වාගේම අපේ නලීන් ප්‍රදීප් උඩවෙල ගරු මන්ත්‍රීතුමා අපි සියල්ලම එකතු වෙලා මේ දැකපු කරුණු ටික ඉදිරිපත් කළා. මෙන්න මේවා, මෙන්න මේවා කියලා පැහැදිලි කළා. නාට්‍ය රඟහලක තියෙන්න ඕනෑ පසුබිම මොනවාද? නාට්‍ය රඟහලක් මොන ආකාරයෙන් තියෙන්න ඕනෑද කියලා මුලින්ම සාකච්ඡා කළේ අපි. කලාකරුවෝ හැටියට අපි කෑගැහුවේ නැහැ. මුකුත් නැහැ. අමාත්‍යතුමාත් එදා සහභාගී වුණා. මම හිතන්නේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් සහභාගී වුණාද කොහේද? අපි ඒ අදහස් ලබා ගත්තා. ජයලත් මනෝරත්න අපි කට්ටිය එකතු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකතු වෙලා ගත්තු තීරණ අද සාර්ථක වෙලා තිබෙනවා. අද නාඩා ආයතනයේ පොඩි පොඩි දුර්වලතා කිහිපක් පමණයි තිබෙන්නේ. අද මිනී තියටර් එක ඉස්සරහාට අරගෙන තිබෙනවා. රඟහලේ ඉතුරු වේදිකාව. අඩි 02 ක් විතර වාගේ ඉස්සරහාට අරගෙන තිබෙනවා. ඒ වාගේම ඒක වායු සමනය කරලා තිබෙනවා. මේ වනකොට ඒක හදලා ඉවරයි. අපි කරපු ඉල්ලීමක්. අපි කිව්වා නාට්‍යකරුවෙකුට කොහේ හරි ඈතක ගිහිල්ලා රෑට ඇවිල්ලා - මට මතකයි. බොහෝ අවස්ථාවල එදා අපි කට්ටියවම ගෙනැල්ලා එක පාරටම ටවුන් හෝල් එකෙන් බස්සනවා. ටවුන් හෝල් එකෙන් රෑ 02.00 ට විතර බැස්සුවාම යන්න තැනක් නැහැ. ඉතින් බස් හෝල්ට් එකට වෙලා උදේ වෙනකල් එතැන රැඳිලා ඉන්නවා. ඉතින් ඒකට අපි ඇමැතිතුමා සමග සහ නාඩා ආයතනයේ ප්‍රධානියා එක්ක සාකච්ඡා කළාට පස්සේ දැන් වෙනම කාමරයක් වෙන් කරලා තිබෙනවා කලාකරුවන්ට. නාට්‍යකරුවන් කොහේ හරි ඈතක ඉඳලා එනකොට රාත්‍රියේ රුපියල් 250 ක් වාගේ පුංචි මුදලක් ගෙවලා තුන් හතර දෙනෙකුට පාවිච්චි කරන්න පුළුවන්. ඒ නිසා නාඩා ආයතනයෙන් ඒ දේ සිද්ධ වෙනවා. නමුත් ගැටළුවක් තිබෙන්නේ, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට ප්‍රේක්ෂකයා අද්දවා ගන්න පුළුවන් ස්ථානයක් විය යුතුයි. මොන හේතුවක්ද දන්නේ නැහැ. ඒ රඟහලේ කලාකරුවන් සඳහා තිබෙන උත්සවයට පවා මන්ත්‍රීවරු දෙන්නයි ආවේ. මෙතුමයි. මමයි. ඇමැතිතුමයි. මම දන්නේ නැහැ මන්ත්‍රීවරු - ඔබතුමාත් ආවා. මන්ත්‍රීවරු සහභාගී වෙන්නෙත් නැහැ. මොනවා හරි හේතුවක් නිසා එතැනට එකතු කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒ කියන්නේ ඒ පරිසරය නිර්මාණය වෙලා නැහැ. අනෙක් එක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. නාඩා කියන ආයතනය නිකන් ධීවර සංස්ථාවේ ආයතනයක් වාගේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මොකක් හරි නාරා ආයතනය. මම මුල්ම දවසේ එතැනට ගියාම හිතුවේ මොකක් හරි නාරා ආයතනයේ තැනක් කියලා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නම පිළිබඳව ඉස්සෙල්ලා ප්‍රචාරයක් දිය යුතුයි. මෙහෙම එකක් තිබෙනවා කියලා මාධ්‍ය තුළින් ප්‍රකාශයක් කරන්න ඕනෑ. මාධ්‍ය ආයතන ගෙනැල්ලා එතැන වැඩ කරන කිසිම ආයතනයකට, කිසිම වැඩ සටහනකට මෙතුමා මාධ්‍ය ගෙනැල්ලා නැහැ. මෙතුමාගේ දූර්වලතාවය නොවෙයි. මෙතුමා වටා ඉන්න කට්ටිය. මාධ්‍ය තුළින් ප්‍රචාරයක් ලබා දීලා නැහැ. අනෙක් එක තමයි කලාකරුවන්ට එතැනට එකතු වෙන්න පරිසරය නිර්මාණය කරන්න ඕනෑ. ඇතුළේ තිබෙන්නේ ඉන්දියානු රෙස්ටුරන්ට් එකක්. මේ ඉන්දියානු රෙස්ටුරන්ට් එක අපේ සාමාන්‍ය කලාකරුවන්ට නුහුරුයි. අපේ සුදර්ශියේ තියෙන කැන්ටින් එකෙන් ප්ලේන් ටී එකක් බීලා, පාන් කෑල්ලක් කන පරිසරය එහේ නැහැ. ඉන්දියානු රෙස්ටුරන්ට් එකක් තිබෙන්නේ. එතකොට ඔතැනට කලාකරුවෝ එන්න කැමැති නැහැ. අනෙක් එක තමයි මම ඉල්ලීක් කරනවා. මම හිතන්නේ නැහැ මේක සුදුසුද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාකරුවන්ට එකතු වෙන්න සමාජයක් පිහිටුවන්න. මෙතැන සමහර විට මධුවිතත් තියෙන්න පුළුවන්. අම්මා පොත ලියනකොට මැක්සින් ගෝර්කිලා පවා රුසියාවේ යම් යම් දේවල් පාවිච්චි කළා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ රුසියාවේ සීත නිසා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

වොඩ්කා. මම කිව්වේ කලාකරුවා කියන්නේ නිර්මාණය බිහි කරන කොට එවැනි තැනකට කලාකරුවාට පුළුවන් - කලාකරුවෝ හැටියට අපි ඉල්ලීමකුත් කළා නේ? එහෙම කළොත් ඔය පරිසරය - සමහර විට ඔබතුමා අකැමැති වෙන්න පුළුවන්. නැත්නම් ඔය කලාකරුවෝ එකතු කර ගන්න හම්බ වෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කලාකරුවෙක් නිසා මම වැඩිපුර විනාඩි 02 කුත් දුන්නා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක ඉල්ලීමක් කරනවා. මෙය ප්‍රචාරය කිරීම සඳහා වැඩ කටයුත්තක් කරන්නය කියලා. විශේෂයෙන්ම ඒ ආයතනය නාඩා කියන නමින් හඳුන්වන්නේ නැතුව සෞන්දර්ය නිකේතනය වාගේ කියලා යොදනවා නම් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා අදහස් ගෙනා ආවා. ඒකේ පසුතලය විජය කුමාරතුංග අනුස්මරණ රංග ශාලාව කියලා තමයි ඒ කාලේ පටන් ගත්තේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අපි ඉල්ලීමක් කළාම, එදා හිටපු මහ ඇමැතිතුමා රෙජිනෝල්ඩ් කුරේ ඇමැතිතුමාගේ ඒ නම නම් වෙනස් කරන්න බැහැයි කියලා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ තියෙන්නේ ශාලාවේ නම. එවකට මම ඇමැතිතුමා වශයෙන් තමයි ඒක යෝජනා කළේ. ඇතුළේ තියෙන්නේ රෙජිනෝල්ඩ් කුරේ ශාලාව. නමුත් එතුමා කියන්නේ, සම්පූර්ණ ආයතනය තමයි විජය කුමාරතුංග නමින් තියන්න.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සුදර්ශිය වාගේ තැනකට එන්න පරිසරය නිර්මාණය වෙලා තිබෙනවා. ඉස්සර වෙනම කට්ටියක් ලයනල් වෙන්ට්. ලයනල් වෙන්ට් කලාකරුවෝ කියලා එක පිරිසක් හිටියා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අපි එය අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා ඔබතුමාගේ සාරවත් අදහස් ටික පිළිබඳව අපි තීරණයකට යමු. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.59]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව බොහොම ස්තුතියි. මම හිතන්නේ මම මේ පළාත් සභාවට ආවට පස්සේ ජනතා විමුක්ති පෙරමුණෙන් මේ දක්වා මම දැකපු හොඳම යෝජනාව ගෙන ආවා. හැබැයි ඉතින් ඒකේ අරුමය තිබෙන්නේ විජය කුමාරතුංගලා වාගේ කලාකාරයෝ මැරුවේ ජනතා විමුක්ති පෙරමුණේම සාමාජිකයෝ. එහෙම තමයි ඒ කාලේ කිව්වේ. මම දන්නේ නැහැ ඇත්ත. එහෙම කලාකාරයෝ මරපු ජනතා විමුක්ති පෙරමුණේ කෙනෙක් මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ප්‍රේමකීර්ති ද අල්විස්, තේවිස් ගුරුගේ වැනි කලාකාරයෝ මරපු ඒ ආණ්ඩුවේ හිටපු ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා මේ යෝජනාව ස්ථිර කිරීම සම්බන්ධව දෛවයේ සරදමක් සේ මම දකිනවා. මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මේ කලාකාරයෝ කලාව පටන් ගන්නේ පාසලෙන්. මේ කලාවයි, අධ්‍යාපනයයි දෙකම එකම ඇමැතිවරයාට තිබෙන නිසා මේ බස්නාහිර පළාත තුළ කලාකරුවන් බිහි කරන්න පුළුවන් හොඳම ඇමැතිවරයා මෙතුමා. මේ පාසලට කලාව ගෙනියන්නේ. අද මම හිතන්නේ, පාසල තුළ කලාව එළි දක්වන්න අවස්ථාවක් නැහැ. මොකද, ළමයාට වයස තුනේ ඉඳල අම්මලා මොන්ටිසෝරි අරගෙන දුවනවා, හොඳ ඉස්කෝලයක් හොය ගන්න. ඊළඟට මේ ළමයා අරගෙන දුවනවා, ශිෂ්‍යත්වයට. හොඳ ඉස්කෝලයක් හොයා ගන්න. ශිෂ්‍යත්වය fail වුණාට පස්සේ අරගෙන දුවනවා O/L පාස් කරන්න. ඉතින් O/L fail වෙලා හරි pass වෙලා හරි පාසලෙන් එළියට යන දරුවා අවුරුදු 17 ක් 18 ක් වෙලා කලාව හොයන්නේ නැහැ. කොල්ලො දුවන්නේ කෙල්ලෝ පස්සේ. කෙල්ලෝ දුවන්නේ කොල්ලෝ පස්සේ. ඒක තමයි සමාජ ඇත්ත. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ළමයින් ළඟ තිබෙන කලාත්මක හැඟීම, ඒ හැකියාව ඔප නංවන්න වෙන්නේ පාසල තුළින්. ඒ පාසලෙන් බිහි වුණු අය තමයි ගොඩක් දුරට දැන් එළියේ ඉන්නේ. සමහර විට අපේ ජෝතිපාල මහත්තයලත් එක්ක වාගේ මධුවිතත් එක්ක ගිය අය ඉන්නවා. අද එහෙම අය අඩුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අධ්‍යාපන ඇමැතිතුමාට කියනවා. කලාව කියන රසය ළමයාගෙන් එළියට ගන්න ක්‍රමයක් මේ කාලකණ්ණි අධ්‍යාපන ක්‍රමය තුළ නැහැ. මොකද, සෑම රජයකම වගකීමක් තමයි, සෑම දරුවෙකුටම සමාන අධ්‍යාපනයක් ලබා දීම. නමුත් මේ කිසිම රජයකට පුළුවන්කමක් ලැබිලා නැහැ, ළමයාට ඒ අධ්‍යාපනය දෙන්න. ඒක නිසා හැම රජයක්ම කියනවා ළමයාට ළමා කාලය පූජා කරලා, උඹගේ ඉතුරු හැකියාවන් පූජා කරලා උඹ ඉස්කෝලයක් හොයා ගනින්. විභාග පාස් වෙයන් කියලා. විභාග පස්සේ යන අධ්‍යාපන ක්‍රමය තුළ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාව නොවෙයි, කිසිම හැකියාවක් දියුණු වෙන්නේ නැහැ. දැනුම, ආකල්ප සහ කුසලතා නේ අධ්‍යාපනය කියන්නේ. අපේ පන්තියේ දෙන්නෙත් දැනුම. ඉස්කෝලේ දෙන්නෙත් දැනුම. මොන්ටිසෝරියේ දෙන්නෙත් දැනුම. ටියුෂන් පන්තියේ දෙන්නෙත් දැනුම. ගෙදර ආවාම අම්මා දෙන්නෙත් දැනුම. ඉතින් හැකියාවන්, කුසලතාවයන් දියුණු වෙන්නේ නැහැ. ඒ ළමයාට අලුත් ආකල්ප සංකල්ප එන්නේ නැහැ. ඉතින් අධ්‍යාපන ඇමැතිතුමා ඉන්නවා. එතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ පාසල තුළට ගිහිල්ලා පාසල තුළින් - මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ Sportmeet වලට ගුරුවරු, දෙමව්පියෝ සහ දරුවෝ ලැහැස්ති වෙනවා. මෙහෙන් අපේ අධ්‍යාපන ඇමැතිතුමා ගිහිල්ලා, පාසල්වල කලා උත්සවය තියෙනවා. බලන්න දයකුත් නැහැ. දකින්න දයකුත් නැහැ. සංවිධානය කරන්න දෙයකුත් නැහැ. අපිත් නැහැ. ඉතින් ඒ වාගේ නොකර මේවා හොඳ කළමනාකරණයෙන් කරන්න කියලා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන්වත් පටන් ගනිමු, එතුමා කරපු යෝජනා. ඇත්තෙන්ම කාලෝචිත යෝජනාවක්. දැනුම පස්සෙන් දුවන සමාජයේ මේ ළමයාගේ රසවින්දයක් තියෙන්න ඕනෑ. මේ රසවින්දයක් නැති සමාජයක් බිහි වුණාම තමයි සමාජයේ පවුලුත් කඩාකප්පල් වෙලා තිබෙන්නේ. රස නැහැ. අද දරුවෙකුගේ රස නැහැ.

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

රස කෝ? පොත තමයි හැමදාම තිබෙන්නේ. බඳින කොට රස දන්නේ නැහැ. ලුණුත් නැහැ. ඇඹුලුත් නැහැ. ඒ නිසා රසවින්දනය දරුවෙකුට ලැබෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ තුළින් තමයි සාර්ථක පවුලක්, සමාජයක් බිහි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මතක් කරනවා. හරි හෝ වැරදි හෝ, ගණන වැඩි හරි නෙළුම් පොකුණ හදන කාලයේ ඔය ජනතා විමුක්ති පෙරමුණේ උදව්යයි, එක්සත් ජාතික පක්ෂයේ උදව්යයි ඡන්දය කාලේ කිව්වා, කෝටි ගණනක් වියදම් කරලා පොකුණක් හදනවා කියලා. හැබැයි, අපි හැමදාම එතැනින් තමයි යන්නේ. අපි හැමදාම ශ්‍රාවස්තියට යන්නේ එතැනින්. හැබැයි, පොකුණ පිරෙන්න හැමදාම සෙනඟත් ඉන්නවා. ඒ පොකුණ ඉස්සරහා හැමදාම මොකක් හරි කලා වැඩ සටහනක් තිබෙනවා. දැන් වැඩි ගණනට හරි පොකුණ තිබෙනවා. දැන් පිටරටින් කෙනෙකු ආවත් ඔය පොකුණ තමයි තිබෙන්නේ. එදා හදපු පොකුණ තමයි අද මහින්ද මහත්තයාට පින් සිද්ධ වෙන්න ඉතිරි වෙලා තිබෙන්නේ. ඒ පොකුණේ ගණන් වැඩි එක ඇත්ත. ගණන් වැඩි අයටත් තිබෙන්න ඕනෑ. පාරේ ප්‍රාඩෝ තිබෙනවා. පැජරෝ තිබෙනවා. බෙන්ස් තිබෙනවා. හොඳ වාහන තිබෙනවා. එතුමා කිව්වා වාගේ - (බාධා කිරීම්)

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒක චන්ද්‍රිකා නෝනාගේ පොකුණ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

චන්ද්‍රිකා කියමු කෝ. චන්ද්‍රිකා නෝනයි මහින්ද මහත්තයායි දෙන්නාම හදපු පොකුණ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.03]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය ගණන් පොකුණු හදන්නෙත් මම මේ කියන කථාව නිසා තමයි. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. එතුමා ඉතාම කරුණු සහිතව පෙන්වනවා අපි මොකක්ද කරන්න ඕනෑ. අවශ්‍යතාවය මොකක්ද කියලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය දිහා හැරිලා බැලුවාම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා කථා කරන කොට ඇමතිතුමා ගියා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම හිතන්නේ ඇමතිතුමා පසුව හැන්සාඩ් එක කියවයි. ඇමතිතුමාට ඕනෑ ටික පසුව හැන්සාඩ් එකෙන් බලා ගනීවි. හැබැයි, ඇමතිතුමාට යමක් කියන්න තිබෙනවා. මම ඒක මේ ඇතුළේ කියන්නම්. අපේ රටේ පාලකයෝ සාමාන්‍යයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාකරුවන්ට ඔලුව උස්සන්න දුන්නේ නැහැ. ඇයි කලාකරුවන්ට ඔලුව උස්සන්න දුන්නේ නැත්තේ? මේ කලාකරුවාගේ නිර්මාණ ශක්තිය වැඩි වුණොත්, ප්‍රතිභාව ඔප් නැංවුණොත් මොකද වෙන්නේ? කලාකරුවා කරන්නේ තමන් ජීවත් වන පරිසරය, සමාජය, සමාජ ආර්ථික දේශපාලනය ප්‍රශ්න කරන්න පටන් ගන්නවා. විවේචනය කරන්න පටන් ගන්නවා. මේකේ අඩුපාඩු කියන්න පටන් ගන්නවා. එතකොට මොකද වෙන්නේ? මේවා ප්‍රශ්න කරන කොට වංචාව, දූෂණය, අවනීතිය, සමාජ අසාධාරණය ගැන කථා කරන කොට ඒකාධිපතිත්වය ගැන කථා කරන කොට පාලකයා කල්පනා කරනවා, මෙන්න කලාකාරයා මොකද කරන්නේ? මගේ බලය අහිමි කරන්න හදනවාය කියලා. එතකොට පාලකයා මොකද කරන්නේ? පාලකයා නිර්මාණකරුවාට උදව් කරනවා වෙනුවට ඔහුට ඉහළට එන්න රාජ්‍ය අනුග්‍රහය දක්වනවා වෙනුවට කලාකරුවන් මර්දනය කරන්න පටන් ගන්නවා. කලාකරුවන් එහෙම නැත්නම් පිරිසක් අල්ලා ගෙන ඒ පිරිස හරහා අනෙක් කලාකරුවන් ටිකත් නිර්වින්දනය කරන්න මහන්සි වෙනවා. මේක තමයි අපේ රටේ ඉතිහාසය පුරාම

ක්‍රියාත්මක වුණේ. කලාකරුවා මරලා දැම්මා නම්, කලාකරුවන්ව මර්දනය කළා නම්, එහෙම නැත්නම් වෙනත් දෙයක් කළා නම්, ඒ නිර්මාණකරුවා කවර අංශයක හිටියත් පාලකයා බැලුවේ තමන්ට වාසි සහගත පිරිස විතරක් තියාගෙන, අනික් අය විනාශ කරලා දාන්න. ඒ නිසා අපේ පාලකයෝ කිසි කලෙක කලාකරුවාට එළියට එන්න සහාය දැක්වුවේ, උදව් කළේ නැහැ. ඒ නිසා මේ පවතින ආර්ථික අර්බුදයේම කොටසක් ලෙස තමයි මේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මා දකින්නේ. මොකද හේතුව, පාලකයාගේ ආයු කාලය අඩු වෙන කොට තත්ත්වය තවත් බරපතළ වෙනවා. ඒ නිසා මේ ඇමතිවරු කොයි තරම් බුරුතු පිටින් බිහි වුණත් වැඩක් නැහැ. කලාවට කොයි තරම් ඇමතිවරු හිටියත් වැඩක් නැහැ. ඒගොල්ලෝ නියෝජනය කරන්නේ ඒ අර මර්දනය කරන පන්තියේම කොටස්කරුවෝ විධියටයි. ඒගොල්ලෝ උත්සාහ කරන්නේ, යළිත් සැරයක් කලාකරුවා දිගින් දිගටම මර්දනය කරන්න විතරයි. එහෙම නම් කලාකරුවන්ට මෙහෙම කරනවා නම්, නිර්මාණකරුවන්ට මෙහෙම කරනවා නම්, රසිකයින්ට මොකද වෙන්නේ? කලාකරුවෝ නිර්මාණ කරලා මේ සමාජ අසාධාරණය, මේ පවතින ආර්ථික අර්බුදය ජනතාව ඉදිරියේ, රසිකයින් ඉදිරියේ තැබුවාම මොකද වෙන්නේ? රසිකයා කල්පනා කරනවා මේක තමයි සමාජ යථාර්ථය. මේකට විරුද්ධව සටන් කරන්න ඕනෑ. එතකොට මේකට පාලකයෝ කියනවා, ආ.. මෙන්න බලන්න. අපි මුන්ට උදව් කළා. කලාකරුවන්ට අපි අවස්ථාව දුන්නා. දැන් මුන් මේක පාවිච්චි කරලා රටේ විප්ලව කරන්න හදනවා කියලා. මේක තමයි අර්බුදය. ඒ නිසා ටික දවසක් යන කොට දැන් මොකක්ද වෙලා තිබෙන්නේ. මේ සියල්ල වහලා, උඩින් පස් දාලා තියන්න තමයි පාලකයෝ බලන්නේ.

දැන් මේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ සඳහන් වෙන්නේ මොකක්ද? නාඩා ආයතනය මීට වඩා කලාකරුවන්ට හිතකර පරිසරයක් බවට පරිවර්තනය කරන්නය කියන ඉල්ලීමයි මේ කරන්නේ. අපි දැක්කා, පසුගිය කාලයේ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ සුදර්ශී ශාලාවට කරපු දේ. සුදර්ශී ශාලාව කියන්නේ, හරිම සුන්දර තැනක්. එතැන කලාකරුවන්ට අපූරු තැනක් වුණා. නිර්මාණ බිහි කිරීමට අවශ්‍ය පරිසරයක් තිබුණා. එතැන කලාකරුවෝ එකතු වන, කලාකරුවෝ සාකච්ඡා කරන, නිර්මාණ ගැන කථා කරන, නව නිර්මාණ බිහි කරන තැනක් බවට පරිවර්තනය වෙලා තිබුණා. අද ඒකට මොකද වෙන්නේ? සසකාවාට යට කරලා දීලා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ රටේ පාලකයෝ හරි නම් මොකක්ද කරන්න ඕනෑ. නාඩා ආයතනය හිමි මේ පළාතේ කලාව භාර ඇමතිවරයා මොක්කද කරන්න ඕනෑ. කලාව භාර ඇමතිවරයා මේකේ වගකීම ගන්න ඕනෑ. අරගෙන නිර්මාණකරුවන්ට සරිලන පරිසරය සකස් කිරීම සඳහා වෙනම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. නාඩා ආයතනය විතරක් නොවෙයි. එතුමා එතැනින් එළියට ඇවිල්ලා, තවත් තැන් සොයා ගෙන, කලාකරුවන්ට අවශ්‍ය හොඳ පරිසරයක් හදන්න කටයුතු කරන්න ඕනෑ. මම හිතන්නේ නැහැ එතුමන්ලා අඩුම ගණනේ එවැනි යෝජනාවක් ගැන අදහසක්වත් ඔලුවේ තියා ගෙන කටයුතු කරනවා කියලා. එහෙම නිර්මාණකරුවන්ට උදව් කරන වැඩ සටහනක් මෙහේ ඇමතිතුමාට නැහැ. ඇත්ත කතන්දරය කියන්න එපැයි. ඉතින් කොහොමද නාඩා ආයතනය හදන්නේ. ඒ නිසා නාඩා ආයතනය කියන්නේ, තවත් දේශපාලන ව්‍යාපෘතියක කොටසක් විතරයි. මම විශ්වාස කරන්නේ නැහැ. අපි හිතනවා, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් අඩුම ගණනේ ඒක උත්ප්‍රේරකයක් විධියටවත් මේ ඇමතිවරයා පාවිච්චි කරලා වහාම - එක පැය විසි හතරක් ඇතුළත කරන්න පුළුවන් වැඩ මේවා. මේකට පියවර ගනියි කියලා. ඒ නිසා මම මේ සභාවේදී කියන්නේ. කලාව භාර ඇමතිවරයා විධියට මේ වාගේ තවත් ආයතන බිහි කරලා - මේ කලාකරුවන්ව කොටු කරලා නොවෙයි, මීට වඩා හොඳ පරිසරයක් ඇති කරලා, පරිසරය එක්ක බද්ද වුණු කලාකරුවන්ට එකට රැස් වෙන්න පුළුවන්, විශේෂයෙන්ම නාට්‍ය පුහුණු වෙන්න පුළුවන්, නාට්‍යකරුවන්ට අවශ්‍ය පහසුකම් දෙන්න පුළුවන් පරිසරයක් මේ නාස්ති වෙලා, ආපහු අවිච්ඡේද වන මුදල් ටිකවත් පාවිච්චි කරලා, අඩුම ගණනේ ඊට අවශ්‍ය ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරයි කියලා විපක්ෂය විධියට අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් විධියට මාගේ ගරුත්වයට හානි වන විධියට යම්

නිලධාරීන්, පළාත් පාලන ආයතනවල නිලධාරීන් වැඩ කරනවා. මගේ මන්ත්‍රීකමටත්, මගේ විතරක් නොවෙයි, පොදුවේ තමුන්නාන්සේලා සියලු දෙනාගේ මන්ත්‍රී ධුරවලටත් අපහාස වන විධියට, අගෞරව වන විධියට වැඩ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථා කරන්නේ, මීට මාස එකහාමාරකට පමණ ඉස්සෙල්ලා - අපේ ප්‍රදේශයේ තිබෙනවා, ක්‍රීඩා පිටියක් සූරියබණ්ඩාර ක්‍රීඩා පිටිය කියලා. ඒ ක්‍රීඩා පිටිය සංවර්ධනය කරන්න ගිය අවුරුද්දේ පළාත් පාලන ආයතනයෙන් ලක්ෂ 18 ක් වියදම් කරලා තිබෙනවා. ඊට පස්සේ මගේ සල්ලිවලින් මම සල්ලි දාලා සංවර්ධනය කර ගෙන යනවා. මම සභාපති කාලයේ හදපු ක්‍රීඩා පිටිය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ නම දාලා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

සූරියබණ්ඩාර කියලා ගමේ මිනිස්සු නම දා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ ක්‍රීඩා ඇමතිතුමා ලක්ෂ 20 ක් පාස් කරලා තිබෙනවා, ඒ ක්‍රීඩා පිටිය වැඩි දියුණුවට. මෙතුමාට ඒක පාස් කරන්න සිද්ධ වුණා. මෙතුමා මට පාස් කරලා දුන්නේ නැහැ. නමුත් ඒක පාස් කරන්න සිද්ධ වුණා. ඉහළ තැනින් කථා කරලා. (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට වුණු අසාධාරණය කියන්න කෝ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆයිසර් මුස්තාපා මැතිතුමාගේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලක්ෂ 20 ක් පාස් කරලා තිබෙනවා. ඊට අමතරව මෙගා පොලිස් ආයතනයෙන් අපේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා, ලිඛිතව දීලා තිබෙනවා ඒ ක්‍රීඩා භූමිය සහ නවලෝක ක්‍රීඩා පිටිය අංග සම්පූර්ණ ඇවිදින මං තීරුවක් සහිතව අංග සම්පූර්ණ ක්‍රීඩා පිටියක් බවට පත් කරනවාය කියලා. දැන් මේවා සංවර්ධනය වෙමින් පවතිනවා. ඒ අතරතුරේ ඒකාබද්ධ විපක්ෂයට කඩේ යන මනුස්සයෙක් සංගීත සංදර්ශනයක් සහ රැස්වීමක් දාලා ක්‍රීඩා පිටිය දැන් ඉල්ලනවා. දැන් මාස එකහාමාරකට, දෙකකට පමණ ඉස්සෙල්ලා ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියට මම ලිපියක් දීලා තිබෙනවා. මේ කාර්තුව තුළ, මාස තුනක් තුළ මේ සංවර්ධන කටයුතු කරනවා. මේවාට බාධා නොවන විධියට කටයුතු කරන්න කියලා. දැන් අපි ඉන්ටර්ලොක් ගල් අල්ලනවා. ගේට්ටු දානවා. ලස්සනට බෝඩ් ගහනවා. පසුගිය දවස්වල බෝඩ් කඩලා දැම්මා. ඒවා ඔක්කොම හදනවා. ළමා උද්‍යාන හදනවා. මේ වකවානුව තුළ පස් දාලා මංතීරු සකස් කරලා තිබෙනවා. දැන් මේ මොහොත වන කොට මේ අනුදැනුම ඇතිව ලේකම්තුමියට බලතල දීලා, ඒ රැස්වීම පවත්වන්න ඉඩ දෙන්නය කියලා. ඒ පැවැත්වුවොත් මේ තිබෙන අපේ ඔක්කොම සංවර්ධන ව්‍යාපෘති කඩාකප්පල් කරනවාමයි. පස් ටික දා ගන්න හම්බ වෙන්නේ නැහැ. ඉන්ටර්ලොක් ගල් ටික ගලවලා විසික් කරලා වෙලට දායි. ඒ වාගේ මීට ඉස්සෙල්ලා කළා. මේකේ තිබෙන කුරු ටික ගලවලා දායි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක අයිති වත්තල ප්‍රාදේශීය සභාවට නේද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

වත්තල ප්‍රාදේශීය සභාවට.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉතින් ලේකම් දැන ගන්න එපැයි මේක.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මම මේ සභාවේ කියනවා. මම මන්ත්‍රීවරයෙක් වශයෙන් මම කලින් මාස එකහාමාරකට කලින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවාය කියලා දැනුම් දීලා, ඒ ක්‍රීඩා පිටිය සංවර්ධනය කර ගෙන යන කොට ඒක කඩාකප්පල් කරන්න යනවා. කරුණාකරලා පළාත් පාලන ආයතනවල වගකියන නිලධාරීන්ගෙන් මේ වැඩේට ඉඩ දෙන්න එපාය

කියලා මම ඉල්ලා සිටිනවා. ඒ නිසා කරුණාකරලා මේක හැන්සාඩ් ගත කරන්න. මේකේ යම්කිසි පාඩුවක් වුණොත්, මෙම කරන සංදර්ශනය තුළින් යම්කිසි පාඩුවක් වුණොත්, ඒ පාඩු සියල්ලක්ම ඒ අදාළ නිලධාරීන්, අණ කරපු නිලධාරීන්, අණ දුන්න නිලධාරීන් ඒ සියලු දෙනාගෙන්ම අය කර ගන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද, මෙතුමා කිව්වා ඒකාබද්ධ විපක්ෂයේ කෙනෙක් කරන්නේ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. ඔබතුමාට -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මමත් ඒකාබද්ධ විපක්ෂයේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

36(1) ඒකාබද්ධ විපක්ෂයක් නොවෙයි එන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මෙතුමා නම නොකිව්වාම මාවත් අයිති වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ නේ? එහෙම නම් නම කියන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මන්ත්‍රීවරයෙක් කියලා කිව්වේ නැහැ.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මන්ත්‍රීවරයෙක් කියලා කිව්වේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.13]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා දීර්ඝ කාලයකට පස්සේ නැවත නින්දෙන් ඇහැරිලා. අර අපේ ගම්වල තියටර් කියලා එකක් තිබුණා. පොඩි මඩුවක් ගහලා, ස්පීකර් ටිකක් දාලා, ලොකු හෝන් දාලා මේ කලා නිර්මාණ ආපු හැටි ගැන. මේ නාඩා ආයතනය. මේක බස්නාහිර පළාත් සභාවේ සෞන්දර්ය නිකේතනය. මේ මන්ත්‍රීවරුන්ට තවම මේක කියවා ගන්න බැහැ. මේ යෝජනාව ආවේ අපේ රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු මහ ඇමතිතුමා ඉන්න කාලයේ. අපටත් තිබුණා, 2004 පරිවාස පළාත් සභාවක්. ඒ පරිවාස පළාත් සභාව ඇතුළේ ගහපු ගිවිසුම් මෙගොල්ලොන්ගේ පහක් තිබුණා. එකක් තමයි, පොල්වත්තේ ක්‍රීඩා පාසල ගැන. අනික් එක තමයි සංස්කෘතික නිකේතනයක් හදන්න. මේක තමයි විජය කුමාරතුංග මැතිතුමා වෙනුවෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපති වුණාට පස්සේ අපේ පළාත් සභාවට ආපු රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ යෝජනාවක් අනුව මේ ආයතනය පටන් ගත්තා. මේ ආයතනය පටන් අරන් මට පසුගිය පළාත් සභාවේ මම සංස්කෘතික ඇමතිවරයා වශයෙන් ඉන්න කොට මේක මහා වර්ෂාවට තෙමෙන මහා හිල් කුඩයක් වාගේ එකක්ව තමයි තිබුණේ. මම ඒ ඔක්කොම ගලවලා, විශේෂ කැබිනට් පත්‍රිකාවක් දාලා මේකට විශේෂ මුදලක් වෙන් කර ගෙන, වෙනම මුදලක් අපි වෙන් කරලා මේක විශේෂ ආයතනයක් හැටියට ගෙනියන්න අපි කටයුතු කළා. ඒ ආයතනයේ තිබුණු මේ තිබෙන අංග. මම ටවර් හෝල් පදනමේ ඉන්න ඉංජිනේරුවන් ගෙන්නුවා. ඒ වාගේම සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ඉන්න ඒ උපාධිය හදාරන දරුවෝ ගෙන්වලා, ඒ විශේෂඥයෝ ගෙන්වලා මේ තිරය සම්පූර්ණයෙන්ම සකස් කෙරුවා. මේකට සල්ලි තිබුණේ නැහැ. සල්ලි නැතිකොට මම ස්වර්ණවාහිනී ආයතනයට කථා කරලා මේකෙන් තමයි පටන් ගත්තේ. සෑම මාධ්‍ය ජාලයක්ම අද මේ තරුණ කෙල්ලෝ කොල්ලෝ එළියට

[ගරු උපාලි කොඩිකාර]

ඇවිල්ලා සින්දු කියලා, ඩාන්ස් කරලා අර විද්‍යුත් තාක්ෂණය අලුත් නායකත්වයක් දෙන්න පුළුවන් වුණේ උපාලි කොඩිකාර බස්නාහිර පළාත් සභාවේ සංස්කෘතික ඇමතිවරයා හැටියට සංවර්ධනය කළ ඔය සෞන්දර්ය නිකේතනය නිසා කියන එක මම තමුන්නාන්සේට මතක් කරනවා. මේ අලුත් කට්ටිය මේ ඉතිහාසය දන්නේ නැතිව කථා කරන්නේ. ඒකයි මට කනගාටුව. මේකේ හිටපු අපේ පරණ මන්ත්‍රීවරු - සුමිත් ලාල් මෙන්ඩිස් ගරු ඇමතිතුමා, සුනිල් ජයමිණි ගරු සභා නායකතුමා, අපේ සිරිකමල් මන්ත්‍රීතුමා වාගේ අපේ පරණ කට්ටිය එදා මේවායේ හිටියා. එතකොට දැන් මේ මොකක්ද කරන්න කියන්නේ. මේකේ මේ මොකක්වත් කරන්න දෙයක් නැහැ. මේකේ පුටු ටික මම හැදුවා. මේකේ පඩිපෙළවල් තිබුණේ නැහැ. පළමුවැනි මිනිහා වාඩි වුණාම කෙළවරේ මිනිහාට පේන්නේ නැහැ. එතකොට මම ස්ටෙප් බයි ස්ටෙප් මේ කොටස්වලට හදලා මේක ඉස්සුවා, නරඹන්න පුළුවන් ශාලාවක් හැටියට. තට්ටු තට්ටු උස්සලා ඒ පුටු ටික හදලා, ස්ප්‍රින් වෙයාර්ස් - ඒවායේ වාඩි වුණාම ඉන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒවා අපි ගෙනැල්ලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

චෝදනාවක් තිබෙනවා, ස්වර්ණවාහිනියට බදු දීලා අත යට සල්ලි ගත්තාය කියලා. ඇත්තද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඊට පස්සේ ඒ පුටු ටික ඔක්කොම හදවලා - ඒ ස්වර්ණවාහිනී ආයතනයේ ඒ මුදල් අරන්, පළාත් සභාවේ මුදල් වියදම් නොකර ස්වර්ණවාහිනී ආයතනයෙන් මුදල් අරගෙන තමයි මම මේක ප්‍රතිසංස්කරණය කළේ. එතකොට -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ස්වර්ණවාහිනියෙන් නොවෙයි හැදුවේ. ඔබතුමා ස්වර්ණවාහිනියට දුන්නා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ මේ පළාත් සභාවේ හැන්සාඩ් ටික ගිහිල්ලා බලන්න. (බාධා කිරීම්) මැට්ටා නොවී වාඩි වෙනවා. මැට්ටෙක් වාගේ දඟලන්න එපා. රූපවාහිනියේ දාන්න මේක. දාල අපි ඒකට නමක් හැදුවා. මම බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ඇමති හැටියට හිටපු අපේ ප්‍රසන්න රණතුංග ඇමතිතුමාට කැබිනට් පේපර් එකක් දාලා මම ඉස්කෝලේ ඉන්න දරුවො - පාසල්වල සංස්කෘතික විෂයයක් තිබෙනවා. එතකොට මේ සංස්කෘතික විෂය කරන දරුවන්ව ගෙන්වලා ඒකේ පාඨමාලා තියලා ඒ දරුවන්ට නාට්‍යයක් නිර්මාණය කරන්නේ කොහොමද? නාට්‍යයක් හදන්නේ කොහොමද? ඒකට පුහුණු වෙන්නේ කොහොමද? ඒක ලියන්නේ කොහොමද? ගොතන්නේ කොහොමද කියලා මම දරුවන්ව ගෙනැල්ලා උපදේශක පන්ති පැවැත්වුවා.

අපේ රටේ පෝරුවේ චාරිත්‍ර කරන මිනිස්සු සොයා ගන්න අමාරුයි. මම ඇප්ලිකේෂන් දැම්මා. ඇප්ලිකේෂන් 3700 ක් ආවා. පොඩි තරුණ කෙල්ලෝ කොල්ලෝ ආවා පෝරුවේ චාරිත්‍ර, අෂ්ටක ඉගෙන ගන්න. ඒ වැඩ සටහනට. මට පුහුණු කරන්න පුළුවන් වුණේ, එක සැරයකට 300 ක්. ඒ 300 ගණනකට තමයි පුහුණු කරන්න පුළුවන්කමක් ලැබිලා අපි ඒක වාර තුනක් කළා. අෂ්ටක කියන ඒ අය. ඒ වාගේම කේන්ද්‍ර ශාස්ත්‍රය හදාරන අය. එතකොට මේ වාගේ මම මේකේ පාඨමාලා ගණනාවක් කළා. ඊළඟට මම සියලුම කලාකරුවන් ගෙනැල්ලා අපේ මේ කැලණිය විශ්ව විද්‍යාලයේ හිටපු ඒ සංස්කෘතික කථිකාචාර්යවරයාව ගෙනැල්ලා මම පාසල් කලාකරුවෝ ගෙනැල්ලා, ඒ දරුවන්ට සම්පූර්ණයෙන්ම දේශන මාලාවක් ලබා දුන්නා. එහෙම කරලා තමයි අර මිනි තියටර් එක, ඒකේ ඔක්කොම පුටු ටික හැදුවා. රොඩ්නේ ෆ්‍රේසර් වාගේ හොඳ නළුවන්ට මේ වාගේ තැනකට යන්න පුළුවන්කම ඇති කළා. අද මේකට වියදම් කරන්න දෙයක් නැහැ. මේකට වියදම් කරන්න තිබෙන්නේ මොනවාද? දැනට මේ කියන ඒවා එකක්වත් නැහැ. මේ පුටු ටික හදලා තිබෙනවා. තට්ටුවලට වාඩි වෙන්න ක්‍රමය හදලා තිබෙනවා. ඊළඟට මේකේ ලයිට් සිස්ටම්. මම ටවර් හෝල් රඟහලේ සිටින ඉංජිනේරුවෝ ගෙන්වලා ඒ ලයිට් සිස්ටම් එක ඇති කරලා තිබෙනවා. ඒකට මුදලක් තිබුණේ නැහැ. දැන් මේකේ පැය ගණනාවක් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා,

මේ සභාවේ අපි මේකට කොපමණ වියදම් කරනවාද කියලා. දැන් බලන්නකෝ? මේ යෝජනා ගෙනෙන කොට පළාත් සභාවේ අයවැයෙන් සංස්කෘතියට කීයද වෙන් කරලා තිබෙන්නේ කියලා. බොරු යෝජනා ගෙනැල්ලා මේ කාලය කන එකනේ කරන්නේ. මහජනයාගේ සල්ලිවලින් ලයිට් ටික පුච්චනවා. මහජනයාගේ සල්ලිවලින් පළාත් සභාවට ගෙවන්නේ. එතකොට මේකට අපට දෙන කෑම වේල. අපට, අර පළාත් සභාවේ වැඩ කරන සේවක සේවිකාවන්ට දෙන පඩි. මේවා ගේන්න ඕනෑ කොහොමද? මම ගෙනාවේ මේකට විශේෂ ව්‍යාපෘතියක් ගෙනැල්ලා, කැබිනට් පේපර් එකක් දාලා වෙනම සල්ලියක් වෙන් කර ගෙන තමයි මේ වැඩේ කළේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ විතරක් නොවෙයි. අපි මේ වාගේම පාසල් දරුවන්ට. ඒ තමන්ගේ කලා උත්සවයක් තියන්න තැනක් තිබුණේ නැහැ. මම, රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමන්ලා පදිංචි වෙලා ඉන්න ප්‍රදේශයේ ඉඩමක් අරගෙන, මම BMICH එක වාගේ සංස්කෘතික මධ්‍යස්ථානයක්, තරුණ සේවා සභාව රු. 85,000 යි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. මීළගට විපක්ෂය වෙනුවෙන් මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ පොල්වත්තේ ඒ ඉඩම අරගෙන අපි සංස්කෘතික මධ්‍යස්ථානයක් හැදුවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අර මයික්‍රෆෝනය ඕෆ් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාව නවත්වන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර වාඩි වෙන්න.

[අ.භා. 12.20]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව - මගේ කාල සීමාව අරන් තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය ඉවරයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා නවතින්න. ඇති.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමා ඉන්න. මම ඒක කර ගන්නම්.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මට අවස්ථාව ලබා දෙන්න. එතුමා සංස්කෘතික ඇමතිවරයා වශයෙන් කරපු කාර්යභාරය දැන් එතුමා (බාධා කිරීම්) මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මේ පළාත් සභාවේ සංස්කෘතික ඇමතිවරයා වශයෙන් හිටියා. මම හිතන්නේ එතුමාට ඔබතුමා ලොකු කාල සීමාවක් ලබා දුන්නා. මේ මගේ අවස්ථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1987 දී පළාත් සභා පිහිටෙව්වාට පස්සේ අවුරුදු 30 ක් සම්පූර්ණ වන මේ වකවානුව තුළදී බස්නාහිර පළාත් සභාව මගින් පාලනය වන සංස්කෘතික නිකේතනය පිළිබඳව, නාඩා ආයතනය පිළිබඳව මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව අපේ ජනතා විමුක්ති පෙරමුණේ

**[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]**

ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. පුරා අවුරුදු 30 ක් පළාත් සභා ක්‍රමය ආරම්භ වෙලා ඒ අවුරුදු 30 පුරාවටම මෙතැන හිටපු ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍ර කාශ කළා. තමන් මෙපමණ කළාය කියලා. තමන්ගේ කාල සීමාව තුළදී මේ පළාත් සභාවේ සංස්කෘතික මධ්‍යස්ථානය දියුණු කරන්නට, මේ නාඩා ආයතනය කලාකරුවන්ට ප්‍රචලිත කරන්නට අවුරුදු 30 ක් විවිධ දේශපාලන නායකයින් ක්‍රියාත්මක කළාය කියලා ප්‍රකාශ වුණා. නමුත් මට නම් පේන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවේ හිටපු ඇමතිවරු, මේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරු මේ පළාත් සභාව වෙනුවෙන් විශේෂ කාර්යභාරයක් කළාය කියලා. අවුරුදු 30 ක් ගියා. නමුත් වර්තමාන අමාත්‍යවරයා අවුරුදු එකහාමාරක්, දෙකක් තිස්සේ මේ අමාත්‍යාංශය භාර අරගෙන ඒ අවුරුදු එකහාමාර, දෙක තිස්සට අවුරුදු තිහේම වැඩ පවරන්න එපා. ඒක අසාධාරණ වැඩක්. වර්තමානයේ අපේ ගම්වල -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හදලා ඉවරයි ඒක.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

හදලා ඉවරයි. නමුත් ඒකේ අඩුපාඩු ගොඩක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපේ ගම්වල නාට්‍ය කරන්නේ පොල්කොට කපලා, ඒවායේ උඩ ස්ටේජ් ගහලා. ඒක තමයි අපේ ගම්වල සිරිත. පොඩි පොඩි වේදිකා ඉදි කරලා. ඊට පස්සේ පළාත් සභා ක්‍රමය ආරම්භ වුණාට පස්සේ තමයි බස්නාහිර පළාතටම මේ වාගේ මධ්‍යස්ථානයක් ඇති කළේ. මේ මධ්‍යස්ථානය ඇති කරපු ඒ පාලකයින්ට අපි ස්තුති කරනවා. නමුත් ඒ අවුරුදු තිහක් ගියාට පස්සේ, මේ අමාත්‍යවරයා මේක භාර අරගෙන අවුරුදු එකහාමාරක් වෙනවා. මම දැක්කා එතුමා යම්කිසි ප්‍රමාණයක උත්සාහයක් දරනවා. ඒ අවුරුදු තිහේදීම වැඩ පිළිවෙළ එතුමාට දාන එක මම සාධාරණයි කියලා කියන්නේ නැහැ. නමුත් පසුගිය කාල සීමාව තුළදී මේ සංස්කෘතික මධ්‍යස්ථානයේ විවිධ රැස්වීම්වලට අපට ආරාධනා කළා. අපි දැක්කා, මේක පවත්වන්නට එතුමා යම්කිසි උත්සාහයක් දරනවා. ඉතින් මේ වාගේ ගම්වල ඉන්න කලාකරුවන්ට - අපි ඉල්ලීමක් කරනවා, මේ කලාකරුවන්ගේ කලා කුසලතාවය එළිදක්වන්නට වර්තමාන අමාත්‍යතුමා හරහා ඔබතුමාට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශය සහ සංස්කෘතික අමාත්‍යාංශය කියන දෙකම ඔබතුමාට අයිති වෙන්නේ. වර්තමානයේදී පාසල් කලාව මම හිතන්නේ, ඉතාමත්ම පහත් මට්ටමක තිබෙන්නේ. ඒ පාසල් කලාව, පාසලෙන් බිහි වන දරුවාගේ කලා කුසලතා වැඩි දියුණු කරන්නට ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. ඒ එක්කම අධ්‍යාපනයෙන් පස්සේ ඒ දරුවා රැකියාවක් කරන කොට ඒ කලා කුසලතාවයන් තිබෙන ඒ කලාකරුවා රැකියාවක් කරන කොට පළාත් සභාව හරහා හඳුනාගන්න ඕනෑ මේ දරුවාට කලා කුසලතාවය තිබෙනවාය කියලා. ඊළඟට බස්නාහිර පළාත් සභාවේ කලා කටයුතු අමාත්‍යාංශය මගින් ඒ හඳුනාගත් පිරිසට යම්කිසි දැනුමක් දෙන්න ඕනෑ. ඒ දැනුමක් දීලා මේගොල්ලෝ කලාවට ගන්න ඕනෑ. නමුත් ඒ වාගේ වැඩ පිළිවෙළක් අපි පසුගිය අවුරුදු ගණනක් තිස්සේ දැක්කේ නැහැ. එක එක සංස්කෘතික ඇමතිවරු කියනවා, මගේ කාලයේ මෙපමණ කළාය කියලා. අර ජනාධිපතිතුමාගේ කාලයේ මෙපමණක් කළාය කියලා. නමුත් බස්නාහිර පළාත් සභාව පිහිටුවලා අවුරුදු 30 ක් වෙනවා. ඒ අවුරුදු 30 පුරාවටම කරපු ටික තමයි මේ තිබෙන්නේ. මම දැක්කා මේ පළාත් සභා රැස්වීම්වලදී - මම ඇවිල්ලා, මේ 34 වන රැස්වීමට තමයි මේ වාඩි වෙන්නේ. ඉතාමත් මෑත කාලයේ මම පළාත් සභාවට ආවේ. නමුත් කියන්න කනගාටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාව ගන්න තීන්දු - මම හිතනවා ඒ තීන්දු හැම එකක්ම දවසින් දවස වෙනස් වෙනවා. ප්‍රාදේශීය සභාවක ලේකම් කෙනෙක් මේකට මාරු කර ගන්න බැහැ. ලේකම් කෙනෙක් දා ගන්න බැහැ. ප්‍රාදේශීය සභාවක ලේකම් කෙනෙක් අද වාඩි වුණොත් එහෙම හෙට තව එක්කෙනෙක් වාඩි වෙනවා. ඒ වාගේ තීන්දු තීරණ ගත්තොත් එහෙම, මේ පළාත් සභාව හැල්ලුවට ලක් වෙනවා. මොනවා වුණත් මම ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමතිතුමාට ගරු කරනවා. එතුමා ඒකාබද්ධ විපක්ෂයේ වුණත් මම හිතනවා, පසුගිය කාල සීමාව තුළදී එතුමා තනියෙන්, කෙළින් ඉඳගෙන තීන්දු ගත්තා. මම බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට එතුමා මේ පළාත් සභාව හරියට අරගෙන ගියා. අපි ඉල්ලීමක් කරනවා. අපට කනගාටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මේ විපක්ෂයේ ඉන්න කොට අපට කනගාටුයි. මේ පළාත් සභාව පිස්සන් කොටුවක් වෙන්න ඔබතුමා ඉඩ දෙන්න එපා. සමහර වෙලාවට බෙල් ගහලා නැගිටලා යනවා. ජේවීපී එකෙන් යෝජනාවක් ගෙනාවොත් නැගිටලා යනවා. අපි යෝජනාවක් ගෙනාවොත් නැගිටලා යනවා. එහෙම කරන්න එපා. අපි කාලය, ශ්‍රමය, ධනය වැය කරලා මෙතැනට ආවේ. අපි බියගම ප්‍රාදේශීය සභාවේ ඉන්න කොට, පසුගිය සභා වාර්තාවක් තිබ්බොත්, ඒ සභා වාර්තාවේ කරුණු පසුගිය දේවල් අපි විශ්ලේෂණය කරනවා. ඒ පසුගිය මාස සීමාව තුළ කරපු වැඩ පිළිවෙළවල් අපි විමසා බලනවා. නමුත් මේ පළාත් සභාව තුළ පසුගිය විපරමක් නැහැ. මේ මාසයේ කථා කළා. ඊළඟ මාසේ එනවා. අවුරුද්ද යනවා. අපි දන්නේම නැහැ අවුරුදු පහ ගිහින්.

මම හිතන්නේ මේ කලා කටයුතු අමාත්‍යාංශය හරහා වර්තමාන අමාත්‍යවරයාට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. ඒ වැඩ කොටස හරහා ඔබතුමා නායකත්වය ලබා දෙන්න. මෙතැන කලාකරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. මම හිතන්නේ, පක්ෂ භේදයකින් තොරව මේ කලාකරුවන්ගේ උදව් උපකාර අරගෙන මේ නාඩා ආයතනය දියුණු කරන්නට විශේෂයෙන් ක්‍රියා කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, අපි ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. කොළඹ පමණක් නොවෙයි. ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක දෙකටත් ඔබතුමාගේ මැදිහත් වීමෙන් සංස්කෘතික මධ්‍යස්ථාන ආරම්භ කරන්න. ඒ සඳහා මේ වාගේ වේදිකා ආරම්භ කරලා, මේ බස්නාහිර පළාත් සභාව හරහා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් කලාකරුවන්ට විශාල සහයෝගයක් ලබා දෙන්නය කියලා ගෞරවයෙන් මතක් කරනවා. ඊට අමතරව අද වර්තමානයේදී සමහර කලාකරුවන්ට ගෙයක් නැහැ. සමහර කලාකරුවන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. මම දැක්කා ඉතාමත්ම අසරණ මට්ටමෙන් මේ කලාකරුවෝ ජීවත් වෙනවා. සමහර කලාකරුවන්ගේ ගෙවල්වලට විදුලිය ගන්න බැහැ. සමහර කලාකරුවන්ගේ වහළය තෙමෙනවා. ටකරං තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා මේ සංස්කෘතික අමාත්‍යාංශය හරහා - මේ බස්නාහිර පළාත් සභාවේ අසරණ කලාකරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ කලාකරුවන්ගේ ජන ජීවිතය සංවර්ධනය කරන්නට වර්තමාන අමාත්‍යවරයා සමඟ ඔබතුමාට දෙන්න පුළුවන් උපරිම ශක්තිය, සහයෝගය ලබා දීලා, මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා 104 දෙනෙක් ඉන්නවා. මේ අපි සියලු දෙනාම විහිළු කරන්නේ නැතිව, අපි කවුරු හරි සභාවාට යෝජනාවක් ගෙනාවත් අපි කවුරුවත් දේශපාලනය උපයෝගී කර ගෙන පහර ගහන්නේ නැතිව - ඉදිරි අනාගතයේදී අපට මේ පළාත් සභාවේ තව අවුරුදු එකහාමාරක් හෝ දෙකක් හෝ කාල සීමාවක් තිබෙනවා. ඒ කාල සීමාව තුළ ඒ ඉතිරි කාල සීමාව තුළදී මේ පළාත් සභාව හරි මගට යොමු කරන්නට මේ පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට ශක්තිය, ධෛර්යය ලැබේවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට සංස්කෘතික හා අධ්‍යාපන කියන විෂයයන් දෙකම අයිතියි. ඔබතුමාගේ නායකත්වයෙන් ඉදිරි කාල සීමාව තුළදී බස්නාහිර පළාතේ පාසල් දරුවෝ කලා ක්ෂේත්‍රයට ගන්නට විශේෂ අවධානය යොමු කරන්නය කියලා ගෞරවයෙන් මතක් කරනවා. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කළා. එතුමාත් මේ පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යවරයා වශයෙන් හිටියා. මම නම් දැක්කේ නැහැ විශාල කාර්යභාරයක් කරනවාය කියලා අවසාන වශයෙන් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. ඔබතුමා බොහොම කාල කළමනාකරණය කර ගෙන හොඳ කථාවක් කළා. මේක අනික් අයටත් ආදර්ශයක්. එතුමා නවක මන්ත්‍රීවරයෙක් වුණත්. ඊළඟට සුනිල් ජයමිණී ගරු සභා නායකතුමාට අවස්ථාව. ඔබතුමාට නියමිත කාලය විනාඩි 05 යි.

[අ.භා. 12.28]

**ගරු සුනිල් ජයමිණී -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාවට අදහසක් පළ කරන්න මුලින් හිතාගෙන හිටියත් පසුව ඒ අදහස පොඩ්ඩක් වෙනස් කළා. නමුත් මගේ වෙලාවට මම තමුන්නාන්සේට ඉල්ලීමක් කළා, යම් අදහසක් පළ කරන්න මට විනාඩි පහක් හෝ ලබා දෙන්නය කියලා. මම පළමුවෙන්ම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට

[ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා]

ස්තුතිවන්ත වෙනවා. පළාත් සභාවේ පරිහානියට යන ආයතනයක් නගා සිටුවන්න තමන්ගේ අත්දැකීම් උපයෝගී කර ගෙන හොඳ යෝජනාවක් සභාවට ගෙනැල්ලා තිබෙනවා. මේ සභාවේ කථා කරන කොට මට මේ සෞන්දර්ය නිකේතනයේ අතීතය මැවිලා පේනවා. මොකද, එවකට මම බස්නාහිර පළාත් සභාවේ සමූපකාර, සංස්කෘතික, ක්‍රීඩා, වනිතා කටයුතු සහ ආහාර ඇමතිවරයා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කර්මාන්ත, සංචාරක, ධීවර කටයුතු පිළිබඳ ගරු අමාත්‍යවරයා. අපි දෙන්නාම ඒ පළාත් සභාවේ හිටියා. ඒ ඉන්න කාලයේ මට කලින් කථා කරපු උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ මතයට මම එකඟ වෙන්නේ නැහැයි කියලා මුලින්ම සඳහන් කරන්න ඕනෑ. එතුමා මෙතැන හිටියා නම් හොඳයි. මොකද, එතුමා අසත්‍ය දේවල් බොහොමයක් ප්‍රකාශයට පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒවා දන්නවා ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 දී මම අමාත්‍යවරයකු හැටියට ඉන්න කොට එවකට ගරු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය දිනක් මට කථා කරලා කිව්වා, විජය කුමාරතුංග මැතිතුමා නමින් විජය කුමාරතුංග අනුස්මරණ රඟහලක් හදන්න ඕනෑ. ඒකට බස්නාහිර පළාත් සභාව හැටියට මට සහයෝගය ලබා දෙන්නය කියලා. ඒ අනුව විජය කුමාරතුංග අනුස්මරණ රඟහල හදන්න චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මට ජනාධිපති අරමුදලින් කෝටි පහක මුදලක්, ලක්ෂ 500 ක් මගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට එව්වා. ඒ අනුව මේ රඟහල හදන්න ඉඩමක් සොයන කොට - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්ත කථාව කියන්නේ. චන්ද්‍රිකා මැතිනිය මට කිව්වා, ගිහිල්ලා රාජිත සේනාරත්න ඇමතිතුමාව හමු වෙන්න කියලා. එවකට එතුමා ඉඩම් අමාත්‍යවරයා. පස්සේ රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, විජය කුමාරතුංග වෙනුවෙන් මම නොකරන දෙයක් නැහැ. ඒ නිසා මම කොළඹින් ඉඩම් කැබැල්ලක් ලබා දෙන්නම්ය කියලා. ඒ අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත්, ලසන්ත අලගියවන්න එවකට අමාත්‍යතුමාත්, මහේෂ් අල්මේදා හිටපු අමාත්‍යතුමා, රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා අපි සියලු දෙනා එකතු වෙලා මේ උත්සවය සංවිධානය කළා. රාජිත සේනාරත්න ඇමතිතුමාට මේ ආරාධනා පත්‍රය භාර දෙන්න කියලා මගේ අතට දුන්නාම, මම ඒක ගෙදරට අරගෙන ගියාම එතුමා එදා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මොරවැව හිටියේ. මම වෙහෙස නොබලා මගේ රථයෙන්ම මොරවැවට ගිහිල්ලා රාජිත සේනාරත්න අමාත්‍යතුමාට ඒ ආරාධනා පත්‍රය භාර දුන්නා. ඒ දීපු වෙලාවේ බොහොම කැමැත්තෙන් මගේ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මට උදව්වක් කරන්න අවස්ථාවක් ලැබෙනවාය කියලා, අනිවාර්යයෙන්ම උත්සවය සම්බන්ධ වෙනවාය කියලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් ඒ උත්සවයට ආවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ කියන්නේ මුල් ගල් තැබීම.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

අපේ රංජිත් සෝමවංශ මැතිතුමා, ලලිත් වනිගරත්න මැතිතුමා ඔක්කොම ආවා. ඇවිල්ලා අපි මුල් ගල් තැබීම කළා. අපි බොහොම සද්භාවයෙන් තමයි මේ මුල්ගල් තැබීම කළේ. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය තමයි මේකේ නිර්මාතෘවරිය. මම ඒක අවංකව සඳහන් කරන්නට ඕනෑ. එතුමිය අදහස් කළා කොළඹ නගරයට එන කලාකරුවන්ට තමන්ගේ වියදම් තත්ත්වය බලලා පොඩි මිනි රඟහලක් ඇති කරලා, ඒ මිනි රඟහල තුළ පුහුණුවීම් කටයුතු කරලා, ඒ කලා කටයුතු කරන්න අවස්ථාවක් ලබා දෙන්න ඕනෑය කියලා. ඒ අනුව එතුමිය ප්‍රංශයේ තිබුණු නර්තන සම්ප්‍රදායකට, රඟහල සම්ප්‍රදායකට අනුගත වෙලා, ඒකට අවශ්‍ය සැලසුම් සකස් කරලා, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීලා තමයි මේ රඟහල අපි ආරම්භ කළේ. මම රාජිත සේනාරත්න ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා පර්චස් 63 ක් ලබා දුන්නා. දැන් ඔය ස්ථානයේ. එතුමාගේ අමාත්‍යාංශයේ ඉඩමක් ඒ ඉඩම. එතුමා එදා පර්චස් 63 ක් ලබා දුන්නා මේ රඟහල ආරම්භ කරන්න. එවකට ජනාධිපතිතුමිය චන්ද්‍රිකා මැතිනිය. කෝටි පහක මුදලක් දීලා මේ කටයුත්ත ආරම්භ කළේ. හැබැයි, මේ කර්මාන්තය අවසන් වෙන කොට මමත් අමාත්‍ය මණ්ඩලයේ හිටියේ නැහැ. මහේෂ් අල්මේදා මැතිතුමාත් අමාත්‍ය මණ්ඩලයේ හිටියේ නැහැ. මම විශ්වාස කරනවා මම නිවැරදියි. අපේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමා ඉන් පසුව පත් වූ අමාත්‍ය මණ්ඩලයේ හිටියා. ඒ නිසා චන්ද්‍රිකා මැතිනිය සහ අපි ගිහිල්ලා පසුව මේක විවෘත කළා. හැබැයි, අපි විවෘත කළාට

පස්සේ මේ රඟහල බොහොම සුන්දරව නිර්මාණය වුණා. හොඳ පරමාර්ථයක් තිබුණා. මේ රඟහල තුළින් කලාකරුවන්ට විශාල සේවයක් වෙයි කියලා අපි විශ්වාස කළා. නමුත් මම මේ අකමැත්තෙන් වුණත් කියනවා, ඒ කාර්යය අදාළ අමාත්‍යවරුන්ගෙන් ඉටු වුණේ නැහැ. පසුගිය කාලයේ අපි දැක්කා, අර ජෝර්ජ් පෙරේරා අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ, මේක ස්වර්ණවාහිනියේ පෞද්ගලික ආයතනයක් බවට පත් වෙලා තිබුණා. අවුරුදු පහක් එක දිගට ස්වර්ණවාහිනියේ හඬකැවීම් සහ පටිගත කිරීමේ මධ්‍යස්ථානයක් බවට පත් වෙලා තිබුණා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

රියැලිටි ෂෝ වලට.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

පුහුණුවීම් කටයුතු සඳහා ලබා දීලා තිබුණා. ඒ නිසා ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ යෝජනා කරලා තිබෙන, බලාපොරොත්තු වෙලා තිබුණ අරමුණ මේ රඟහල තුළින් ඉටු වුණේ නැහැ. ඒක ඇත්ත කථාව. අපි මෙතැන කලාකරුවන් රාශියක් ඉන්නවා. අපේ මන්ත්‍රීවරු ඉන්නවා. දැන් අද මෙතුමා කිව්වා වාගේ ලුම්බිණි රඟහල දැන් යළිත් ප්‍රතිසංස්කරණය කර ගෙන යනවා. ඒ වාගේම අර කවිද කිව්වා, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභානායකතුමා, ඔබතුමාගේ කාලය නම් දැන් හමාර වෙමින් යනවා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගෙන් විනාඩි පහක් දෙන්න.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා අද ඒ කාරණා ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතාමත් හොඳයි. අපේ විෂය භාර අමාත්‍යතුමාගෙන් එක ඉල්ලීමක් කරනවා. ඒ තමයි, මේවා හොඳ ආයතන වුණාට මේවා පාලනය කරන්න දක්ෂ පුද්ගලයෝ ඉන්න ඕනෑ. මට මතකයි, පසුගිය දිනවල මේ රඟහලේ විධායක අධ්‍යක්ෂවරයා තෝරා ගන්න එක්තරා පරීක්ෂණයක් පැවැත්වුවා. මම නම කෙළින්ම කියන්නම්. මම දන්න විධියට ඒ පරීක්ෂණයෙන් මේ රඟහලේ විධායක අධ්‍යක්ෂවරයා හැටියට පත් වෙන්න නියමිතව තිබුණේ, අද පළාත් සභාවේ සේවය කරන දීප්ති විජේතුංග මහත්තයා. එතුමා කලාකරුවෙක්. හැබැයි, අකමැත්තෙන් වුණත් දැන් කියන්න ඕනෑ. එතුමා තවම මේකට පත් වෙලා නැහැ. ඒ නිසා කලාවට සුදුසු, කලාවට දක්ෂ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභානායකතුමා, ඒ මොන ඇමතිවරයාගේ කාලයේද? මෙතුමාගේ කාලයේද?

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

මේ වර්තමාන කාලයේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දීප්ති විජේතුංග මහත්තයාගේ ඔය ප්‍රශ්නය එන්නේ මේ අමාත්‍යවරයාගේ කාලයේද? ඊට ඉස්සෙල්ලාද?

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ කාලයේ තමයි. ඒ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබපු එක්කෙනා පත් කළොත් මම හිතනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වන අරමුණ ඉටු කර ගන්න පුළුවන්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

යෝජනාවක් ගේන්න කෝ?

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

ඒ නිසා මේ වෙලාවේ මම මීට වඩා වැඩි යමක් සඳහන් කරන්නේ නැහැ. මේ ස්ථානය නවීකරණය කරලා, මේ ස්ථානය පිළිසකර කරන්න. මේක ගරාජ් එකක් කරන්න එපා. මේක ගබඩා කාමරයක් කරන්න එපා. දැනට වෙලා තිබෙන්නේ එහෙමයි. ගබඩා කාමරයක්, ගරාජයක් වෙලා. ගල් ගැලවිලා, වහළ විනාශ වෙලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි සියලු දෙනාටම - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සුභ සාධක සමිතියක් තිබෙනවා. අපට නාට්‍යයක් පෙන්වන්න ඕනෑ වෙලා තිබෙනවා. අපේ නාට්‍ය සෞන්දර්ය නිකේතනයේ පෙන්වන්න තිබුණා. නමුත් අද ඒකට අපට අවස්ථාවක් නැහැ. අපට සිද්ධ වෙලා තිබෙනවා, අපේ නාට්‍යය පෙන්වන්න මෙරිල් පෙරේරා, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමන්ලා අපි සාකච්ඡා කළේ අපට වෙන තැනකට යන්න වෙලා තිබෙනවා. මොකද, මේ ස්ථානය නොලැබෙන නිසා. ඒ නිසා තමුන්නාන්සේලා මේ වෙලාවේ - ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලනවා. එතුමාත් කලාවට ආදරය කරන කෙනෙකු හැටියට මේකට දක්ෂ කෙනෙකු පත් කරලා, මේ කටයුත්තට අර ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වන අරමුණ ඉටු කර ගන්න තමුන්නාන්සේ කටයුතු කරන්නය කියන කාරුණික ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාට විනාඩි 08 ක් තිබෙනවා.

[අ.භා. 12.35]

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නාඩා ආයතනය කියන නම අපි දැන් වෙනස් කරලා තිබෙන්නේ. දැන් මේක නාඩා ආයතනය නොවෙයි. මේක බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය. එතකොට මේකේ - මට විනාඩි අටයි තිබෙන්නේ. දැන් එතකොට උත්තර දෙන්නේ කොහොමද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මොකක්ද ගරු අමාත්‍යතුමා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් විනාඩි 08 කොහොමද තීන්දු කළේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් ඔබතුමා කිව්වානේ ඔබතුමාගෙන් විනාඩි දෙකක් සභානායකතුමාට දෙන්නය කියලා.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට විනාඩි දහයක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් ඒ විනාඩි දහයත් නැතිව යනවා. කථා කර ගෙන යන්න.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මට කථා කරන්න දෙයක් නැහැ. මම කථා කරන්න ඕනෑ ඒවා ඔක්කොම උපාලි කොඩිකාර හිටපු අමාත්‍යතුමා කථා කළා. ඔක්කොම කරලා තිබෙන්නේ එතුමා. දැන් අපට කරන්න දෙයක් නැහැ. දැන් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට කරන්න දෙයකුත් නැහැ. දැන් මේකට මුල් ගල් තිබ්බෙ - මෙන්න මේ කථාව ඇත්ත. දැන් මම සුනිල් ජයමිණි ගරු සභානායකතුමාට විනාඩි දෙකක් දෙන්න කියලා කිව්වේ, ඒ කාලයේ ඇමතිවරයෙක් හැටියට එතුමා හිටියා. අපිත් ඒකට සද්භාවයෙන් උදව් කළා. ඒක රෙජිනෝල්ඩ් කුරේ හිටපු මහ ඇමතිතුමා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එතුමන්ලා මුල් ගල තිබ්බා. රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු මහ ඇමතිතුමන්ලා, අපි අපේ කාලයේ හැදුවා. ගල් බලන්න. ගල් පැලෙන බොරු කියනවා. මුළු සභාවම මුණිවත රකිනවා. ගල් පැලෙන බොරු කියලා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. හෙක්ටර් බෙත්මගේ හිටපු ඇමතිවරයා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම හිටපු සංස්කෘතික අමාත්‍යවරයා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සුනිල් ජයමිණි හිටපු අමාත්‍යවරයා, ගාමිණී තිලකසිරි අමාත්‍යතුමා - මම ඇමතිවරයා. ඉතින් මේක මේ බොරු කියන්න ඕනෑ නැහැ නේ? දැන් තිබෙන තත්ත්වය කියන්න මට විනාඩියක් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු ඇමතිතුමා මේ යෝජනාව කරන්න. අපේ විජය කුමාරතුංග මැතිතුමාගේ නම ඒකට ඇතුළත් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ඒක ක්‍රමවේදයක් තිබෙනවා නේ? සභාවක කථා කළාට. දැන් මේ ආයතනය මම ගත්තාම මම පළමුවෙන්ම සාකච්ඡාවක් කැඳෙව්වා. රොඩ්නි ෆ්‍රේසර්, රවීන්ද්‍ර යසස්, නලීන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමන්ලා, රවි බන්දු විද්‍යාපති, එතකොට ජයලත් මනෝරත්නලා ඒ කාලේ මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමාට ආරාධනා කළා. මේ කවුරුවත් ආවේ නැහැ. (බාධා කිරීම්) අපි ඉස්සෙල්ලාම මෙහෙම එකක් කළා. කලාවට සම්බන්ධ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට අපක්ෂපාතීව ආරාධනා කළා. සියලුම අයට. කිසිම දේශපාලනයකින් තොරවයි මම ඒක කළේ. කලාවට සම්බන්ධ අය ආවා. දැන් අපේ රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමාත් ආවා. ඇවිල්ලා ඒගොල්ලන්ගේ අදහස් උදහස් කර ගෙන යන කොට දවසක් මට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා, මාවත් ගන්නය කියලා. එතුමාට ආරාධනා කරලා තිබුණා. දිගින් දිගටම එතුමා ආවේ නැහැ. එතකොට මේ ආයතනයේ දැන් තත්ත්වය කියලා නවත්වන එක හොඳයි වැඩිය වෙලාවක් නැති නිසා. මේ ආයතනයේ ශාලාව අපි එනකොට, ගව මඩුවක් වාගේ. මම කියන්න ගියොත් හැමෝම මට බණිනවා. හැබැයි, මේ ශාලාව දැන් අපි අලුත්වැඩියා කරලා තිබෙනවා. මේ ශාලාව අලුත්වැඩියා කරලා තිබෙනවා. ගිය අය දන්නවා. වායු සමීකරණ යොදලා අලුතෙන්ම හදලා තිබෙනවා. පුටු කැඩිලා තිබුණේ. පුටු ඔක්කොම හැදුවා. දැන් තිර රෙදි දැම්මා. බිම අලුතෙන් සකස් කළා. මිනි තියටර් එක, මේ කියන කුඩා අනු රංග ශාලාව අපි දැන් 99% ක්ම හදලා තිබෙන්නේ. අපේ නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දන්නවා. එතුමන්ලා බලන්න ගියා. නේවාසික පහසුකම් රු. 250/- කටයි දෙන්නේ. කොළඹ ආවාම අසරණ වුණු කෙනෙකුට නතර වෙන්න ගන්නේ රු. 250/- යි. ඒ පහසුකම් ඔක්කොම අපි දීලා තිබෙනවා. කලින් දුන්නේ ඊට වඩා ලොකු ගණන්වලට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශාලාව රු. 45,000/- ට දුන්නේ.

මේකේ මූලික පරමාර්ථය ගැන සුනිල් ජයමිණී සභානායකතුමා කිව්වා. මේකේ පරමාර්ථය වුණේ අහිංසක, සාමාන්‍ය කලාකරුවන්ට අවස්ථාව ලබා දීම. මම ආවාම රු. 45,000/- රු. 25,000/- දක්වා අඩු කළා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා අපට ඒකට සහයෝගය පළ කළා. දැන් රු. 25,000/- යි. අර ලොබිය රු. 1000 ට දුන්නේ. මේක දැන් දෙන්නේ රු. 150 ට. මදුරුවෝ වහලා ඒ ඔක්කොම හැදුවා. සනීපාරක්ෂක පහසුකම් හැදුවා. අපි යන කොට මේක පාඩු විඳලා තිබුණේ. දැන් මේක ලාභ ලබනවා. මම බොහොම ආදරයෙන් කථා කරන්නේ. මේ විවේචන ඔක්කොම මට පුරුදුයි. අඩුවට දුන්න නිසා අපට චාන්ස් එකක් ආවා. දැන් පොඩි කලාකරුවෝ ටික දිනපතාම මේක භාවිතා කරනවා. දැන් මම සන්තෝෂයි. මේ අදහස් පළ කරපු සියලුම මන්ත්‍රීවරුන්ව මම ලබන සතියේ සාකච්ඡාවට කැඳවනවා. කැඳවලා අපි ඒ උදවියගේ අදහස්වලට, අපේ යෝජනා ඉදිරිපත් කරපු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මගේ මිත්‍රයා. මම බොහොම අවංකව කියන්නේ. එතුමාගේ හරිම ඕනෑකමක් තිබුණා මේ වැඩේට. රොඩ්නි ෆ්‍රේසර්, රවීන්ද්‍ර යසස්, නලීන් ප්‍රදීප් උඩුවෙල ගරු මන්ත්‍රීතුමන්ලා. එතුමන්ලා හරි උනන්දුවකින් කටයුතු කළා. මගේ මෙතැන භේදයක් නැහැ. මට ඕනෑ

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

මේක දියුණු කරන්න. මම විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. තව අපි ගොඩක් දේවල් කළා. අපට ඔය ස්වභාවිත කලා වැඩ සටහන් කළා. නාට්‍ය හා රංග කලා වැඩ සටහන් කළා. චිත්‍ර හා මූර්ති වැඩ සටහන් කළා. කෙටි නාට්‍ය උළෙල බලන්න ආවේ නැහැ. දමිළ කෙටි නාට්‍ය උළෙල. මෙතැන ගිය මන්ත්‍රීවරු දැක්කා. කිසි කෙනෙක් ආවේ නැහැ. සුගතදාස ස්ටේඩියම් එකේ මට ගන්න තිබුණා. කලර්ස් පෙන්වන්න ඕනෑ නම්, නෙළුම් පොකුණ හෝ BMICH එක. මේ රටේ අභිංසක දරුවන්ට පළමුවැනි, දෙවැනි, තුන්වැනි. තුන්වැනි ස්ථාන ලැබෙන්නේ, ගම්වල අභිංසක දරුවන්ට. ඒ දරුවන්ට තැන දෙන්න ඕනෑ නිසා තමයි මම ස්ටේඩියම් එක ගත්තේ. නැත්නම් මට එක් දහස් ගණනක් දාන්න පුළුවන් නෙළුම් පොකුණ අරගෙන හොඳ ලස්සනට කළාම පළමුවැනි, දෙවැනි තැන් ගන්නේ ජාතික පාසල්වල දරුවෝ. අර ගම්වල අභිංසක දරුවන්ට තැන දෙන්න මම සද්භාවයෙන් කළේ. ඔබතුමන්ලා ආවේ නැති වුණාට මම මොකද කරන්නේ. ආරාධනා කළා. ඒකේ කලාවටම ඉඩ දුන්නා. මතක තියාගන්න. කලාවටම ඉඩ දුන්නා. මතක තියාගන්න කලාවටම ඉඩ දුන්නා. ඒකේ මූලාසනයේ හිටියේ සාහිත්‍යධරයෙක්. මම නොවෙයි. මම සහභාගී වුණා. මම කිව්වා, මේ සාහිත්‍යධරයා. අපි කිව්වේ, ගෙන්වන්න. අපේ ලොකු අය කිහිප දෙනෙක් ගෙන්නුවා. අපි සාහිත්‍යයට ඉඩ දුන්නා. ගමේ අභිංසක දරුවන්ට තුන්වැනි සහතිකය ලැබෙන්නේ. තුන්වැනි සහතිකය දෙන්න ඕනෑ නිසා තමයි අපි සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය ගත්තේ. අතන ගත්තා නම් අපි පළමුවැනියා, දෙවැනියා වාගේ කැඳෙව්වාම ගමේ ළමයින්ට - ගමේ ළමයින් කියන්නේ, පළාත් සභාවේ දරුවෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ළඟදී ගියා අපේ පාසලකට. මහාමාත්‍ය විද්‍යාලයට. විශාල වේදනාවක් තිබෙනවා. දන්නේ නැති වුණාට ළමයි අසමත් වෙනවා. ගණිතය අසමත්. විද්‍යාව අසමත්. මේ සුරංගනා කථා. ජනප්‍රිය පාසලේ මුදුන බලලා සාදුකාර දෙන අධ්‍යාපන සංවර්ධනය බස්නාහිර පළාතේ නැහැ. මේ හැමෝම කථා කළාට මේකේ වැටෙන මිනිස්සු, හැලෙන මිනිස්සු, අභිංසක දරුවෝ. මේ දරුවෝ ගැන තමයි අපට කැක්කුම තිබෙන්නේ. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට මම විශේෂ ස්තුතියක් කරනවා. එතුමා අවබෝධයෙන් යුක්තව කිව්වා, සෞන්දර්ය නැති දරුවෝ ටිකක් අධ්‍යාපනය හරහා බිහි වෙනවා. ආකල්පමය වෙනස්කම් ඕනෑ. සෞන්දර්යය ප්‍රාථමික පන්තිවලට ඇති කරන්න ඕනෑ. වක්‍රලේඛ විශාල බාධාවක්. මම මේවා මධ්‍යම රජයත් එක්ක තිබුණු සාකච්ඡාවලදී කථා කරලා තිබෙනවා. වක්‍රලේඛ සංශෝධනය කරලා ප්‍රාථමික අංශයයට දරුවන්ට සෞන්දර්ය ගේන්න ඕනෑ. මේ කෲරත්වය, ප්‍රචණ්ඩත්වය, වෛරය. අපි මේ සභාවේ කොපමණ වෛරයට පාත්‍ර වෙනවාද? වෛරයෙන් තොර ඉතාම සෞන්දර්යාත්මක, නිර්මාණශීලී දරුවෝ ටිකක් සමාජගත කරන්න, කලාවේ අවශ්‍යතාවය අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මතක් කළා. අපේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා තමයි ඒ කාලේ මේ වැඩේට බැස්සේ. නැත්නම් මෙතැන බොරු වැපිරුවා. මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි සහෝදර ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ බලාපොරොත්තු, අදහස්ම තමයි අපේ හිත්වල තිබෙන්නේ. ඒ වාගේම සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා. මම නිතරම කියන දෙයක් තිබෙනවා. පැණි වුණත් වැඩිය කැවොත් නීරස වෙනවා. මම හිතවත් කමට කිව්වා. වැඩිය සභාවල නැගිට නැගිට - දැන් සිරසෙත් - සිරස අද ඇත්තෙත් නැද්ද මම දන්නේ නැහැ. නිතරම කථා කරන්න එපා. හැබැයි, ඒක ඇහුවා ඊට පිටිපස්සේ හිටපු මන්ත්‍රීතුමා. නිතරම කථා කළාම ඒකේ වැදගත්කමකුත් නැහැ. හැබැයි, කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා හුඟාක් දුරට මේවාට මැදිහත් වෙනවා. ඒ වාගේම හිටපු අමාත්‍යතුමා වන උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට බොරු කිව්වාට ස්තුතියි. කරුණු නොදැන කථා කළාට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතියි. මම හැබැයි, සියලු දෙනාම කැඳවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෑම දෙනාම කැඳවලා මම ඒගොල්ලන්ගේ හඬට කන් දෙන ඇමතිවරයෙක්. කන් දෙන ඇමතිවරයෙක්. අපි මේ ආයතනය දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා කිව්වා, නාඩා ආයතනයේ විධායක අධ්‍යක්ෂ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කුමන පදනමෙන්ද කථා කරන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අර විධායක අධ්‍යක්ෂ තනතුර ගැන උත්තරයක් දෙනවා කියලා. ඒ උත්තර දුන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මම උත්තර දෙනවා කිව්වේ නැහැ. මම ඇමතිවරයා. ඒකට මම උත්තර දෙනවා මට ඕනෑ වෙලාවට. ඔබතුමා එහෙම බලපෑම් කරන්න එපා. ඔබතුමා කලිනුත් කිව්වා, මේ භය කරලා තීන්දු ගන්නවා කියලා. භය කරලා තීන්දු ගන්න පුළුවන් මිනිස්සු නොවෙයි අපි. ඒ භයට කොහේද වැඩ කරන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හරි. බොහොම ස්තූතියි. ගරු ඇමතිතුමා කරුණු පැහැදිලි කළා. මීළඟය තිබෙන්නේ පිළිතුරු කථාව. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය ඇහුම්කන් දීමේ හොඳකම තමයි. දැක්කා නේ? උත්තරේ නැහැ.

[අ.භා. 12.46]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා මේ සම්බන්ධව අදහස් ප්‍රකාශ කළ මන්ත්‍රීවරු සම්බන්ධව. දැන් මේකේ අපට වෙන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමාගේ මාර්ගයෙන් මගේ මේ යෝජනාවේ යට කොටසේ තිබෙන දේවල් එකින් එක වෙන්නයි ඕනෑ. අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. මම ලුම්බිණි රෝහල සම්බන්ධයෙන් ඉතිහාසයක් කිව්වේ. මොකද, 2002 දී හිටියා විදුහල්පති කෙනෙක් අමරජීව කියලා මහත්තයෙක්. එතුමාව මට සාදයකදී හමු වෙනවා. දේශපාලනික වශයෙන් එතුමා අපිත් එක්ක නැහැ. නමුත් පෞද්ගලිකව මගේ හිතවතෙක්. එතුමා තමයි මට මේ ලුම්බිණි රෝහල පිළිබඳ ප්‍රශ්නය කිව්වේ. එතකොට තමයි අපි දැන ගත්තේ අවුරුදු 25 ක් ඒ රෝහලා වහලා තිබුණේ. 2002 අවුරුද්දට ඉස්සෙල්ලා. ඒ කතන්දරය මම කිව්වේ. මම හිතන්නේ, එතුමා වැරදියට තේරුම් ගත්තේ. අවුරුදු 25 ක් වහලා තිබුණාය කියලා. ඊට පස්සේ තමයි අපි රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එකක් එකහතා වැඩ පිළිවෙළකට ගියේ. ඒක සම්බන්ධව ලැජ්ජා වෙන්න ඕනෑ නැහැ මේකේ. ඒක තමයි දේශපාලනය කියලා කියන්නේ. සමහරුන්ට අපිත් එක්ක එහෙම වැඩ පිළිවෙළකට ගියොත් ඒක නිකම් යටත් වුණා වාගේ. එහෙම එකක් නොවෙයි. අපි කිව්වා, අයවැයේදී අපි එතුමාට අවශ්‍ය සහයෝගය දක්වන්න, මේ වාගේ වැඩ පිළිවෙළකට යමු. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අවුරුදු 25 කට පස්සේ ලුම්බිණි රෝහල හැදුවේ.

ඒ වාගේම තමයි මම ඊළඟට ප්‍රශ්න කළේ. දැන් මීට අවුරුදු දෙකහාමාරකට ඉස්සෙල්ලා ආපහු රෝහල වැහුවා. ඒ වැහුවේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණය කරනවාය කියලා. එතකොට මිලියන ගණනක් ඒකට වෙන් වුණා. අපි ඇහුවේ කෝ ඒ සල්ලි. මොකක්ද වුණේ? දැන් ධර්මපාලේ විදුහල්පතිතුමා ඇවිල්ලා තමන්ට පුළුවන් විධියට සීට් ටික හදන්න ඇති. ඒක ඇත්ත. අපි ඇහුවේ, රජයෙන් වෙන් කරපු සල්ලිවලට මොකද වුණේ කියලා. ඒ වාගේම තමයි දැන් මනෝරත්න මහත්තයාත් මට කිව්වා, මම ගිහිල්ලා ඇමතිතුමාත් එක්ක කථා කළාය කියලා. මම ඇහුවේ, ඒකේදී මොකක්ද ගත්ත තීරණය. ගිහිල්ලා අපට සාකච්ඡා කරලා තේ බීලා යන එක වෙනම වැඩක්. ඊට පස්සේ තමයි අපි ඇමතිතුමාත් එක්ක සාකච්ඡාව දා ගත්තේ. හැබැයි, ඇමතිතුමා ආවේ නැහැ. හැබැයි, ලේකම්තුමා ආවා. ඒකයි මම කිව්වේ, ලේකම්තුමා එතැනදී පිරිමියෙක් වාගේ වැඩ කළාය කියලා. එතැනදී මම කිව්වා, ඒවා හරියන්නේ නැහැ. අපි තීන්දු තීරණ ගන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වෙනත් උත්සවයක හිටියත් මගේ හෘද සාක්ෂියට අනුව මම දුරකථනයෙන් කථා කළා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. මෙතුමා අපිත් එක්ක සම්බන්ධ වුණා. එතුමා ආවේ නැති -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පත්තරෙන් බලන්නේ ඔක්කොම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා අපි එතැනදී තමයි තීන්දු තීරණ ගත්තේ මේකේ ගණන, එතකොට එක ශාලාවකට, එක කාමරයකට යන ගණන. රියසල්වලට පැයකට කීයද? එතැනදී තීන්දු තීරණ ගත්තා. නැත්නම් ඕනෑ කෙනෙකුට සාකච්ඡා කරලා යන්න පුළුවන්. නමුත් හරියටම තීන්දු තීරණ ගත්තා. ඊට පස්සේ දැන් පුංචි තියටර් එක එතුමා කිව්වා වාගේ නිකම් හැදුනේ නැහැ. ඊට පස්සේ අපි වැඩේ අතහැරියේ නැහැ. ගිහිල්ලා, අපි නිලධාරීන් ගෙන්වලා ඇස්තමේන්තු හැදුවා. ඔය පුංචි තියටර් එකට. ඒ වෙලාවේදී ලක්ෂ 11 යි අන්තිමේදී ඉතිරි වෙලා තිබුණේ. අන්න ඒ ලක්ෂ 11 අරගෙන තමයි ඔය ටික කළේ. ඒ නිසා සාකච්ඡා වුණු පමණටම වැඩක් වෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ සභාපතිතුමා හරියට මහන්සි වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පැහැදිලිවම. එතුමා වැඩේ කළා. ඒක හරි. අපි ඒකට ඒ ගෞරවය තිබෙනවා. ඒ නිසා අපට වෙන්න ඕනෑ මේකයි. මේ යෝජනාව ගෙනාවේ, මේක සාකච්ඡා කිරීම මේකේ ප්‍රධාන දෙයක්. මේ සම්බන්ධව මුළු සභාවේම හැම මන්ත්‍රීවරයෙකුගේම අවධානය යොමු කිරීම. කවුරුත් දන්නවා. ආපහු මේ සම්බන්ධව සැකයක් නැහැ. ඒ නිසා අපට ඕනෑ, කලාකරුවන්ගේ පැත්තෙන් මේ කරුණු ටික එකින් එක සම්පූර්ණ කරන්න. නැත්නම් මේකේ මොකක් හරි කීර්ති නාමයක් හරි සම්බන්ධව, කවුද මේ යෝජනාව ඉස්සෙල්ලාම ගෙනාවේ අරවා මේවා නොවෙයි. අපට ඉස්සෙල්ලා තමයි මනෝරත්න මහත්තයලා, යසස්ලා ගිහිල්ලා මේ සම්බන්ධව කථා කරලා තිබුණේ. ඊට පස්සෙයි අපි වැඩේට බැස්සේ. අපි මේක ක්‍රියාවට නැංවීම පැත්තෙන් අපි ක්‍රියාමාර්ග ගත්තා. මොකද, අපි හොඳට ඉගෙන ගෙන තිබෙනවා, විශේෂයෙන්ම ආණ්ඩු කරන කට්ටියත් එක්ක වැඩේ කොහොමද කර ගන්න ඕනෑ කියලා. ඔන්න ඔය කලාව විතරයි අපි පාවිච්චි කළේ. බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මමත් ඉගෙන ගෙන තිබෙනවා, ඒගොල්ලොත් එක්ක වැඩ කරන්නේ කොහොමද කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු අමාත්‍යතුමනි, මම මූලාසනයේ සිටීම නිසා මට මේ සංවාදයට සහභාගී වීම අහිමි වුණා. නමුත් සභාවේ මේ යෝජනාව පිළිබඳව එකඟතාවය ගන්න ඉස්සෙල්ලා මම යමක් ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, මටත් අයිතියක් තිබෙනවා. මම හිටපු සංස්කෘතික අමාත්‍යවරයා. මේ හැම අමාත්‍යවරයෙකුටම වඩා ඉහළින් හිටපු සංස්කෘතික අමාත්‍යවරයා. පැරණි කියන එකයි කියන්න ඕනෑ. මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මේ සෞන්දර්ය නිකේතනය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ අරමුණ වුණේ, මේ රටේ කලාකරුවන්ට හයියක් දෙන්න. නමුත් රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා අමාත්‍ය ධූරයට පත් වෙන්න ඉස්සෙල්ලා අමාත්‍යවරයා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේකේ කථා පවත්වන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඇයි මගේ අදහස. මූලාසනය හැටියට මට අදහසක් ප්‍රකාශ කරන්න පුළුවන්. එහෙම සම්ප්‍රදායක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්ප්‍රදායක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ තිබෙනවා. ඒකයි මම කියන්නේ. තමුන්නාන්සේ සීට් එකට එන්නකෝ මම කරුණු පැහැදිලි කරන්න. පසුගිය කාලයේ මෙතුමා අමාත්‍ය ධූරය දරන්න ඉස්සෙල්ලා අමාත්‍යවරයා හැටියට ඒ අරමුණ සම්පූර්ණයෙන් විනාශ කරලා මේක විකුණුවා. එක්තරා රූපවාහිනී ආයතනයකට

මේක විකුණලා අවුරුදු පහම ඒක විනාශ කළා. මම දැනට මේ අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. හොඳ සභාපතිවරයෙක්. මම දන්න මගේ මතය ප්‍රකාශ කරන්නේ. කාටවත් පක්ෂග්‍රාහී වෙනවා නොවෙයි. දැන් ඉන්න සභාපතිවරයා හැටියට විජේනායක මහත්තයා විශාල කාර්යභාරයක් ඉෂ්ට කරනවා. විධායක අධ්‍යක්ෂවරයා පිළිබඳව මම දන්නේ නැහැ. එහෙම දෙයක් තිබෙනවා නම්, ඒ ගැන සලකලා බලන්න. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මම හිටපු සංස්කෘතික ඇමතිවරයෙක් හැටියට, සංස්කෘතියට ආදරය කරන කෙනෙකු හැටියට ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාව සම්බන්ධව ඊට අනුගත වෙලා ගරු අමාත්‍යතුමා කටයුතු කරාවි කියලා. යෝජනාව සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Presiding Member [Mr. Hector Bethmage M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මමත් සහභාගී වුණා ගරු ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡාවට. ඒක සභා කටයුතු කාර්යාලයේ තිබුණු නිලධාරීන්ගේ දිරි දීමනා ප්‍රශ්නයක්. මම හිතන්නේ, ඔබතුමාත් සම්බන්ධ වුණා. ¼ දීමනාව සම්බන්ධව. එදා එකඟ වුණා. ආණ්ඩුකාරතුමාත්, ඒ අවශ්‍ය නිලධාරීනුත් එකඟ වුණා. තව වන තුරු ඒක ගෙවිලා නැහැ. ඒ සම්බන්ධව අපේ වරප්‍රසාදයක් කඩ වෙලා තිබෙනවා. එදා ආණ්ඩුකාරතුමාගේ කටින්ම කියවුණු දෙයක්. ඒ නිසා මේ සම්බන්ධව වරප්‍රසාද කමිටුවට දාලා ඔබතුමා හෙට සභා කටයුතු කාරක සභාවට දාලා, මේ සම්බන්ධව අපට ඇත්ත නැත්ත දැන ගන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු අපි හෙට ඉදිරිපත් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපි ගෘහ කාරක සභාව රැස් වුණා. මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු සියලුම දෙනාගේ වරප්‍රසාද අයිතීන් සහ පහසුකම් ලබා දීම පිළිබඳව මේ ගෘහ කාරක සභාව අපේ රීතිවලින් අපට උරුම වෙලා තිබෙන කාරක සභාවක්. මේ කාරක සභාව අපි රැස් වෙලා අපි මන්ත්‍රීවරුන්ගේ පහසුකම් සැලසීම සඳහා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතැනදී ආපු එක ගැටළුවක් තමයි අපි කාරක සභාවලින් ඉදිරිපත් කරන යෝජනා පිළිබඳව කැබිනට් මණ්ඩලය රැස් වෙලා ගන්න තීන්දු තීරණ පිළිබඳව දැන ගැනීමක් අපට නොලැබෙන නිසා මේවා ක්‍රියාත්මක වෙන්නේ කොයි ආකාරයටද කියන එක අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙතැන නැහැ. අමාත්‍ය මණ්ඩලයේ තවත් ඇමතිවරු කිහිප පළක්ම නැහැ. එක ඇමතිවරයයි ඉන්නේ. ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරනවා. කැබිනට් මණ්ඩලවල ගන්න තීන්දු තීරණ මේ ගරු මන්ත්‍රීවරුන්ට දැනුවත් කිරීම පිළිබඳව ක්‍රමවේදයක් සකස් කරන්න. නැත්නම් අපි දැන් අවුරුදු දෙකක් වෙනවා මේ පළාත් සභාවට පත් වෙලා. මේ එන මන්ත්‍රීවරුන්ගේ පහසුකම්, වරප්‍රසාද දිහා අරගෙන බැලුවාම එදා ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ කමිටුවට එන්න එනකොට මෝටර් සයිකලයෙන් ඇවිල්ලා, ඒ කාර්යාලයට ඇතුළු වන කොට එතුමාට එන්න අවසර දීලා නැහැ. ඒ වාගේ තවත් මන්ත්‍රීවරු ගණනාවක් අලුතෙන් පත් වුණු අය ඉන්නවා. මේ අයට මේ පහසුකම් ලබා දීම පිළිබඳව අපි ක්‍රියා කරලා නැහැ. එහෙම නම් සභාපතිතුමා, අමාත්‍ය මණ්ඩලය, ධුරධාරීන් පිළිබඳව ලබා දෙන ක්‍රමවේදය මේ මන්ත්‍රීවරුන්ට දැනුවත් වීමක් නැහැ. පහසුකම් මොනවාද? ගෙවීම් මොනවාද? යාන වාහන කවුද

[ගරු කිත්සිරි කහටපිටිය]

දෙන්නේ? කොහොමද එන්නේ? ඒ නිසා මම ගරු ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. එන සභාවේදී මේ මන්ත්‍රීවරු 104 දෙනාටම මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද සහ අනෙකුත් අමාත්‍ය මණ්ඩලය, සභාපතිතුමාට, ධූරධාරීන්ට ලැබෙන වාර්තාවක් අපේ මන්ත්‍රීවරු 104 දෙනාට ලබා දීමට කටයුතු කරන්නය කියන එක මම මේ අවස්ථාවේදී ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හෙට සභා කටයුතු කාරක සභාවේදී ඒ සම්බන්ධව අවධානය යොමු කර ගන්නවා. මීළඟට ඕනෑ නම් දෙවැනි යෝජනාව අපට අරගන්න පුළුවන්. කථා කරන්න හතර දෙනයි ඉන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මෙතැන අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරු නැහැ. සභාවේ ගණ පූරණයක් තිබෙන තරමට මන්ත්‍රීවරු නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. වෙලාව මදී. 1.30 ට සභාව අවසන් කරන්න ඕනෑ. ඒ නිසා ලබන වාරයට මේක කල් දාන්න. මොකද, සභාවේ ගණ පූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

සීනුව නාද කරලා විනාඩි 05 ක පමණ කාලයක් ගත වුණා. සෑහීමකට පත් වන ආකාරයෙන් ගණ පූරණය සම්පූර්ණ නොවන බව පේනවා. ඒ අනුව කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව අපි ලබන සභා වාරයට සම්බන්ධ කරනවා.

# කල් තැබීම
ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ඇ.භා. 01.00 ට, 2017 මාර්තු මස 21 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.00 p.m till 9.30 a.m. on 21.03.2017*